NATIONAL LIBRARY
N L S L OF SRI LANKA

# තිරසර සංවර්ධන අරමුණු පිළිබඳ ශ්‍රී ලංකාවේ පුස්තකාලවල පවතින දැනුවත්භාවය සහ අවබෝධය පිළිබඳ සමීක්ෂණය - 2022



ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

# තිරසර සංවර්ධන අරමුණු පිළිබඳ ශ්‍රී ලංකාවේ පුස්තකාලවල පවතින අවබෝධය සහ දැනුවත්භාවය පිළිබඳ සමීක්ෂණය - 2022

# තිරසර සංවර්ධන අරමුණු පිළිබඳ ශ්‍රී ලංකාවේ පුස්තකාලවල පවතින අවබෝධය සහ දැනුවත්භාවය පිළිබඳ සමීක්ෂණය - 2022

පර්යේෂණ අංශය
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, 2024**

**ISBN 978-624-5747-10-8**

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අනුමැතිය ලද ප්‍රකාශනගත සූචිකරණ දත්ත

තිරසර සංවර්ධන අරමුණු පිළිබඳ ශ්‍රී ලංකාවේ පුස්තකාලවල පවතින දැනුවත්භාවය සහ අවබෝධය පිළිබඳ සමීක්ෂණය - 2022. - කොළඹ : ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, 2024.
පි. ටි සෙමී. 28

ISBN 978-624-5747-09-2

i.338.927072 ඩිවි 23

1. පුස්තකාල-තිරසර සංවර්ධනය-පර්යේෂණ
2. තිරසර සංවර්ධනය-පර්යේෂණ

**සම්පාදන උපදේශකත්වය**

මහාචාර්ය නන්ද ධර්මරත්න - සභාපති

ඩබ්ලිව්. සුනිල් - අධ්‍යක්ෂ ජනරාල්

**සම්පාදක අධීක්ෂණය හා සංස්කරණය**

පද්මා බණ්ඩාරනායක - අධ්‍යක්ෂ
මෛත්‍රී ජයසුන්දර - නියෝජ්‍ය අධ්‍යක්ෂ
නිම්මි දේශප්‍රිය - සහකාර අධ්‍යක්ෂ

**පර්යේෂණය සැලසුම් කිරීම, ප්‍රශ්නාවලි සකස් කිරීම, දත්ත රැස් කිරීම, විශ්ලේෂණය හා වාර්තාව ලිවීම**

උදිත ගුණසේකර - පර්යේෂණ නිලධාරි

**දෙමළ භාෂා පරිවර්තන සහාය**

එම්. එස්. එම් ෂිහාම් - පුස්තකාල හා ප්‍රලේඛන නිලධාරි

**පිටකවර නිර්මාණය**

තනූජා රංගිකා - කළමනාකරණ සහකාර

**ප්‍රකාශනය**

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
අංක. 14, නිදහස් මාවත,
කොළඹ 07.
දුරකතන : 011 2968847
ෆැක්ස් : 011 2685201
විද්‍යුත් තැපැල : research@mail.natlib.lk
වෙබ් අඩවිය : www.natlib.lk

# පටුන


පෙරවදන 1

හැඳින්වීම 2

පළමු පරිච්ඡේදය 3-24

හැඳින්වීම ........ 3

1.1 තිරසර සංවර්ධන අරමුණු ........ 3

1.2 තිරසර සංවර්ධන අරමුණු සහ ශ්‍රී ලංකාව ........ 4

1.3 තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක සහ දර්ශක ........ 5

දෙවන පරිච්ඡේදය 27-36

2.1 තිරසර සංවර්ධන අරමුණු සහ පුස්තකාල ........ 27

2.2 තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමට පුස්තකාලවල දායකත්වය ........ 28

තෙවන පරිච්ඡේදය 39-66

3.1 පර්යේෂණ අරමුණු ........ 39

3.2 පර්යේෂණ ක්‍රමවේදය ........ 39

3.3 දත්ත විශ්ලේෂණය ........ 40

3.3.1. තිරසර සංවර්ධන අරමුණු හා ඒ ආශ්‍රිත තොරතුරු පිළිබඳව පුස්තකාලවල පවතින අවබෝධය සහ දැනුවත්භාවය ........ 40

3.3.2. තිරසර සංවර්ධන අරමුණු පිළිබඳව පුස්තකාල හා පුස්තකාල වෘත්තිකයන්ගේ පවතින දැනුවත්භාවය .... 46

3.3.3 තිරසර සංවර්ධන අරමුණු පිළිබඳ දැනුවත් වූ හා තොරතුරු ලබාගත් මාධ්‍යය/මූලාශ්‍ර ........ 48

3.3.4 තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීම වෙනුවෙන් පුස්තකාල දායක වී ඇති ආකාරය ........ 50

3.3.5 විවිධ ආයතන සමග සම්බන්ධව තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමේ අරමුණින් පුස්තකාල කටයුතු කිරීම. ........ 66

3.3.6 පුස්තකාල විසින් ක්‍රියාත්මක කරන ලද වෙනත් ව්‍යාපෘති/වැඩසටහන් ........ 67

3.3.7 තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේදී පුස්තකාල විසින් මුහුණපානු ලබන අභියෝග/ගැටළු ........ 68

සිව්වන පරිච්ඡේදය 69-69

4.1 නිගමන ........ 69

4.2 නිර්දේශ ........ 70

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 72

# පෙරවදන

2015 වසරේ දී එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අනෙකුත් සාමාජික රාජ්‍යයන් 192 සමඟ ශ්‍රී ලංකාව ද තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රය සහ තිරසර සංවර්ධන අරමුණු 17 ඉටු කිරීම සඳහා බැඳී සිටී. තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා දර්ශක ක්‍රියාවට නැංවීම සඳහා පහසුකම් සැලසීමත් එය ඉදිරියට ගෙනයාමත් සඳහා නොයෙකුත් මූලාරම්භයන් ගෙන තිබේ. ඒ අනුව තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රය සහ තිරසර සංවර්ධන අරමුණු 17 ඉටු කිරීම වෙනුවෙන් පුස්තකාල පද්ධතිය ද සුවිශේෂී වූ දායකත්වයක් ලබා දෙනු ලබයි.

ශ්‍රී ලංකාවේ පුස්තකාල කටයුතු සම්බන්ධයෙන් වන ප්‍රමුඛතම ආයතනය ලෙස ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය ක්‍රියා කරනු ලබයි. ඒ අනුව තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රය සහ තිරසර සංවර්ධන අරමුණු 17 සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ පුස්තකාලවල පවතින අවබෝධය හා එම අරමුණු ඉටු කරගැනීම උදෙසා ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් පිළිබඳ තොරතුරු ලබා ගැනීමේ මූලික අරමුණ ඇතිව ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයෙහි පර්යේෂණ අංශය මගින් මෙවැනි සමීක්ෂණයක් දියත් කිරීම කාලෝචිත වේ. තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පුස්තකාල විසින් වෙනත් ආයතන සමඟ සම්බන්ධ වී කටයුතු කරන ආකාරය හඳුනා ගැනීම, තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමේදී පුස්තකාල මඟින් මුහුණපාන අභියෝග සහ ගැටලු සම්බන්ධයෙන් විමසා බැලීම සහ 2030 වන විට තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම වෙනුවෙන් පුස්තකාල මඟින් ඉදිරියේදී ගත යුතු පියවර සහ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් තීරණ ගැනීමට අවශ්‍ය නිගමන හා නිර්දේශ ඉදිරිපත් කිරීම මෙම සමීක්ෂණයෙහි සෙසු අරමුණු වේ. ඒ අනුව මෙම සමීක්ෂණය ඇසුරින් අනාවරණය වන සොයාගැනීම් මත පදනම්ව තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඉදිරි කාලපරිච්ඡේදය තුළ පුස්තකාල විසින් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව ද පැහැදිලි අවබෝධයක් ලබා ගැනීමට හැකියාව ඇත.

මෙම සමීක්ෂණය සාර්ථක කර ගැනීමෙහිලා කටයුතු කළ අධ්‍යක්ෂ, පද්මා බණ්ඩාරනායක මහත්මිය, පුස්තකාල පර්යේෂණ අංශයේ හිටපු අංශ ප්‍රධාන, මෛත්‍රී ජයසුන්දර මහතාට සහ පර්යේෂණ නිලධාරි උදිත ගුණසේකර මහතාට ද ස්තුතිවන්ත වෙමි. එමෙන්ම මේ සඳහා අවශ්‍ය තොරතුරු ලබා දී තම සහයෝගය ලබා දූන් පුස්තකාල කාර්යමණ්ඩලයට ද ස්තුතිය පුදකරමි.

**මහාචාර්ය නන්ද ධර්මරත්න**

සභාපති

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල

# හැඳින්වීම

වර්ෂ 2015 දී එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් දිළිඳුකම පිටු දැකීම, පෘථිවිය ආරක්ෂා කිරීම සහ සැමට සෞභාග්‍ය උදා කර දීම මූලික කර ගනිමින් තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රය (The 2030 Agenda for Sustainable Development) හඳුන්වා දී තිබේ. තිරසර සංවර්ධන අරමුණු 17ක්, ඒ සඳහා පදනම් වී ඇති අරමුණු 169ක් සහ දර්ශක 244ක් ඒ ඔස්සේ හඳුන්වා දී තිබේ. මේවා තිරසර සංවර්ධනය සම්බන්ධ අංශ රැසක් ආවරණය කරයි.

මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් මහජන පුස්තකාල ඇතුළුව ශ්‍රී ලංකාවේ පුස්තකාල පද්ධතිය කටයුතු කර ඇති ආකාරය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමේ අරමුණින් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් දීප ව්‍යාප්තව සමීක්ෂණයක් පවත්වන ලදී.

මාර්ගගත ප්‍රශ්නාවලියක් හරහා ලබාගත් දත්ත ඇසුරින් තිරසර සංවර්ධන අරමුණු පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් හෝ ක්‍රියාකාරීත්වයක් දක්නට නොමැති බව අනාවරණය වූ අතර සමීක්ෂණය මඟින් යෝජනා රැසක් ඉදිරිපත් කර ඇත. පුස්තකාල වෘත්තිකයින් දැනුවත් කිරීමෙහිලා ඊට අදාළ ආයතනවලට ගත හැකි ක්‍රියාමාර්ග මෙහි පෙන්වා දී ඇත. තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමට හඳුන්වා දී ඇති ඉලක්ක සහ දර්ශක අනුව දත්ත රැස්කර දර්ශකවලට ගැළපෙන ලෙස සාක්ෂාත් කර ගැනීමේ වැඩසටහන්/ක්‍රියාකාරකම් සැලසුම් කළ යුතුය. තිරසර සංවර්ධන අරමුණු හඳුන්වා දී සැලකිය යුතු කාලයක් ගත වී තිබීම ද සැලකිල්ලට ගෙන පුස්තකාල ක්ෂේත්‍රය මඟින් කඩිනමින් හා පුළුල් අවබෝධයකින් යුතුව තිරසර සංවර්ධන අරමුණු ළඟා කරගැනීම වෙනුවෙන් වැඩසටහන්/ක්‍රියාකාරකම් ඊට සමගාමීව සැලසුම් කිරීම කාලෝචිත වේ.

ඒ අනුව මෙම සමීක්ෂණය සාර්ථකව ඉටු කිරීමට කටයුතු කළ අධ්‍යක්ෂ, පද්මා බණ්ඩාරනායක මහත්මියට, හිටපු අංශ ප්‍රධාන මෛත්‍රී ජයසුන්දර මහතාට සහ දත්ත විශ්ලේෂණය කිරීම හා වාර්තාව ලිවීමට කටයුතු කළ පර්යේෂණ නිලධාරි උදිත ගුණසේකර මහතාටද ස්තුතිවන්ත වෙමි.

**ඩබ්ලිව්. සුනිල්**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

# පළමු පරිච්ඡේදය

## හැඳින්වීම

### 1.1 තිරසර සංවර්ධන අරමුණු

පරිසරයේ පවත්නා සම්පත්වලින් ප්‍රයෝජන ගනිමින් ඒවා අනාගත පරපුර වෙනුවෙන් සුරැකීම තිරසර සංවර්ධනය ලෙස හඳුන්වනු ලැබේ. තිරසර සංවර්ධනය මඟින් සිදු වන්නේ පවතින සම්පත් ආරක්ෂා කිරීම, සංවර්ධනය සහ අනාගත පරපුරේ අවශ්‍යතා සඳහා ඒවා යම් ප්‍රමාණයකට ආරක්ෂා කිරීමයි.

තිරසර සංවර්ධනයේ අරමුණු හඳුන්වා දීමට බලපෑ ප්‍රධාන හේතුවක් වන්නේ 2000 වර්ෂයේ දී ඇති කරගත් 2015 වර්ෂය වනවිට ළඟා කර ගැනීමට අපේක්ෂිත සහස්‍ර සංවර්ධන අරමුණු (Millenium Development Goals) තව දුරටත් වැඩි දියුණු කරමින් සාර්ථක කර ගැනීමට වූ අවශ්‍යතාවයයි. එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 2000 වර්ෂයේ දී පවත්වන ලද ලෝක නායක සමුළුවේ දී 2000-2015 අතර කාල පරිච්ඡේදය තුළ සපුරා ගැනීමට නියමිත වැඩපිළිවෙලක් ඉදිරිපත් කරන ලදී. එය සහස්‍ර සංවර්ධන අරමුණු (Millenium Development Goals) ලෙස හැඳින් වූ අතර ප්‍රධාන අරමුණු 08ක් ඊට අයත් විය. එම අරමුණු හා බැඳුණු අරමුණු 21ක් සහ දර්ශක 61ක් ඇතුළත් විය. මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක කරනු ලැබුයේ ලෝකවාසී ජනතාව දිළිඳු බවින් මුදවා ගැනීමේ පරමාර්ථයෙනි. සහස්‍ර සංවර්ධන අරමුණු යටතේ වන කාර්යසාධනයෙන් අනතුරුව තිරසර සංවර්ධන අරමුණු සාර්ථක අන්දමින් ක්‍රියාවට නැංවීම සඳහාත් ඉටු කර ගැනීම සඳහාත් විවිධ ක්ෂේත්‍ර ඔස්සේ කටයුතු කරනු ලැබීය.

ඒ අනුව වර්ෂ 2015දී එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් දිළිඳුකම පිටු දැකීම, පෘථිවිය ආරක්ෂා කිරීම සහ සැමට සෞභාග්‍ය උදා කර දීම මූලික කර ගනිමින් තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රය (The 2030 Agenda for Sustainable Development) හඳුන්වා දී තිබේ. තිරසර සංවර්ධන අරමුණු 17ක්, ඒ සඳහා පදනම් වී ඇති ඉලක්ක 169ක් සහ දර්ශක 244ක් හඳුන්වා දී තිබේ. මේවා තිරසර සංවර්ධනය සම්බන්ධ අංශ රැසක් ආවරණය කරයි.

මානව වර්ගයාගේ අභිවෘද්ධිය උදෙසා පුළුල් කාර්යභාරයක් ඉටු කරන තිරසර සංවර්ධන අරමුණු ලෝකයේ සෑම රටකටම පාහේ අදාළවීම විශේෂ ලක්ෂණයකි. මෙම අරමුණු ළඟා කර ගැනීමට අදාළ ප්‍රතිපත්ති සැකසීම හා සම්පත් වෙන් කිරීම පිළිබඳ මග පෙන්වීමක් ද තිරසර සංවර්ධනය සඳහා 2030 න්‍යාය පත්‍රයෙන් සපයා තිබේ. මිහිතලය සුරැකීම හා සෞභාග්‍ය උදා කරලීම, සාමය හා සමාජ සවිබල ගැන්වීම හා එකිනෙකා සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා වූ ක්‍රියාමාර්ග ද මෙම සැලසුමට ඇතුළත් කර ඇත. ආර්ථික සමතුලිතතාව, නව්‍යකරණය, දේශගුණික විපර්යාස වල අහිතකර බලපෑම් අවම කිරීම, සම්පත් නාස්තිය අවම කිරීම, නීතිය හා සාමය ආරක්ෂා කිරීම යන ක්ෂේත්‍ර ආවරණය කරමින් මෙම අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීමට බලාපොරොත්තු වේ. තිරසර සංවර්ධන අරමුණු අතුරින් කිසිදු භේදයකින් තොරව ලෝකයේ වෙසෙන සියලුම පුද්ගලයන්ගේ දිළිඳුකම වර්ෂ 2030 වන විට තුරන් කිරීම අපේක්ෂා කරන අතර සමාන අයිතිවාසිකම් තහවුරු කිරීමට ද අපේක්ෂිතය. විශේෂයෙන් සංවර්ධනය වෙමින් පවතින රටවල් හා අවම සංවර්ධිත රටවල දිළිඳුකම තුරන් කිරීමේ අරමුණින් විශේෂිත ක්‍රමවේද සකස් කිරීම, සම්පත් ලබාදීම, අන්තර්ජාතික මට්ටමින් ප්‍රතිපත්ති රාමුවක් නිර්මාණය කර දීමට ද බලාපොරොත්තු වේ. සාගින්න නැති කර ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්ත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය වැඩි දියුණු කිරීමේ අරමුණින් කිසිදු වර්ගීකරණයකින් තොරව සමස්ථ මිනිස් ප්‍රජාව සඳහා ආරක්ෂාකාරී, පෝෂණයෙන් යුත් ප්‍රමාණවත් ආහාර වසර පුරා මිලදී ගැනීමට අවශ්‍ය පදනම සකස් කර දීම, තිරසර සංවර්ධනයේ අරමුණු අතර ඇති තවත් අපේක්ෂාවකි. තිරසර සංවර්ධන අරමුණු අතර නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය වැඩි දියුණු කිරීම ද අපේක්ෂා කරයි. එහිදී ප්‍රධාන වශයෙන් මාතෘ මරණ, ළමා මරණ, බෝවන හා බෝනොවන රෝග නිසා ඇති වන අකල් මරණ ආදී වූ මරණ වල අනුපාතය අඩු කිරීම බලාපොරොත්තු වේ. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ළඟා කර සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම, කාන්තාවන් සහ ගැහැණු ළමුන්ට සිදුවන සියලුම ආකාරයේ මානසික සහ කායික හානිකර භාවිතයන් තුරන් කිරීම, කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම, ශක්තිමත් කිරීම, තිරසර සංවර්ධනයේ අරමුණු අතර කැපී පෙනේ.

තිරසර සංවර්ධන අරමුණු අතර සැමට ජලය හා සනීපාරක්ෂක පහසුකම් ලබා ගැනීම සහ ඒවායේ තිරසර කළමනාකරණය සහතික කිරීම ළඟා කරගැනීමට බලාපොරොත්තු වේ. ආරක්ෂාකාරී, අඩු මිලකට ජලය ලබා දීමත් කාන්තාවන්, ගැහැණු ළමුන් සහ අවදානම් සහිත පුද්ගලයන්ගේ සනීපාරක්ෂාව තහවුරු කිරීමටත් මේ හරහා අවධානය යොමු කර ඇත.

2030 වන විට සියල්ලන් සඳහා දැරිය හැකි විශ්වසනීය, තිරසර සහ නවීන බලශක්ති සැපයුම සහතික කිරීම, ආර්ථික වර්ධනය, රැකියා ප්‍රවර්ධනය කිරීම, සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණ දිරි ගැන්වීම, රටවල් තුළ සහ රටවල් අතර අසමානතාවය අඩු කිරීම, නගර සහ ජනාවාස පරිපූර්ණ සහ ආරක්ෂිත ආකාරයෙන් තිරසර ලෙස සකස් කිරීම, තිරසර පරිභෝජනය සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම, දේශගුණික විපර්යාස සහ ඒවායේ බලපෑම්වලට කඩිනමින් ක්‍රියාත්මක වීම යන අරමුණු ඉටු කර ගැනීමට ද අපේක්ෂා කරයි. ඊට අමතරව සාගර සම්පත් සංරක්ෂණය, භූගෝලීය පද්ධතීන්ගේ තිරසර භාවිතය, තිරසර වනාන්තර කළමනාකරණය, කාන්තාරීකරණයට එරෙහිව ක්‍රියා කිරීම, ඉඩම් හායනය නතර කිරීම සහ පුනරුත්ථාපනය, ජෛව විවිධත්ව විනාශය නැවැත්වීම, තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයක් ඇති කිරීම අපේක්ෂාවයි. යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබාදීම, සෑම මට්ටමකම ඵලදායී, වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැගීම යන අරමුණු ද ළඟාකර ගැනීමට බලාපොරොත්තු වේ.

තිරසර සංවර්ධනයේ අරමුණු 17 අතුරින් 04වන අරමුණ ලෙස පරිපූර්ණ, සාධාරණ සහ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමට ඇති අවස්ථාව සැලසීම අපේක්ෂා කෙරේ. 2030 වන විට සියලු දරුවන් නිදහස්, සමාන සහ ගුණාත්මකභාවයෙන් ඉහළ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයක් සම්පූර්ණ කර සිටීමත් ගුණාත්මක බවින් ඉහළ පූර්ව ළමාවිය සංවර්ධනයට, සත්කාර සේවාවන්ට සහ පූර්ව ප්‍රාථමික අධ්‍යාපනයට ප්‍රවේශ වීමේ අවස්ථාව පැවතීම ඉවහල් වන බව පෙන්වා දී තිබේ. ඉහළ ගුණාත්මකභාවයකින් යුක්තව විශ්වවිද්‍යාල අධ්‍යාපනය ද ඇතුළත්ව තාක්ෂණික, වෘත්තීය හා තෘතීයික අධ්‍යාපනය අඩු මුදලකට ලබා ගත හැකි වන ආකාරයේ අවස්ථා ලබා දීම පිළිබඳ අවධානය යොමු කර තිබේ.

2030 වන විට සියලුම තරුණ තරුණියන් හා කාන්තා, පිරිමි හා වැඩිහිටි පුද්ගලයන් අතරින් සැලකිය යුතු ප්‍රමාණයක් සාක්ෂරතා හැකියාව ලබා සිටීම ද අපේක්ෂා කෙරේ. සියලුම දෙනාට සමාන අවස්ථා හිමිවන ආරක්ෂාකාරී ප්‍රචණ්ඩත්වයෙන් තොර ඵලදායී ඉගෙනුම් වාතාවරණයක් ගොඩනැගීම වැඩි කිරීම ද මෙකී අරමුණු අතරට ඇතුළත්ය. විශේෂයෙන් සමාජයේ පරිණාමයක් ඇති කිරීමට මිනිසුන්ගේ ආකල්ප සහ හැසිරෙන ආකාරයේ කිසියම් වෙනසක් ඇති කළ යුතුව තිබේ. එම වෙනස්කම් ඇති කිරීම සඳහා අධ්‍යාපනය ප්‍රබල බලපෑමක් සිදු කරයි. එබැවින් තිරසර සංවර්ධන අරමුණු අතර අධ්‍යාපනය සම්බන්ධ අරමුණු මූලිකත්වයක් ගන්නේ අනෙකුත් අරමුණු ඉටුකර ගැනීමේදී අධ්‍යාපන අරමුණු දිනා ගැනීම අනිවාර්ය වන නිසාවෙනි.

### 1.2 තිරසර සංවර්ධන අරමුණු සහ ශ්‍රී ලංකාව

2015 වසරේ දී එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අනෙකුත් සාමාජික රාජ්‍යයන් 192 සමඟ ශ්‍රී ලංකාව ද තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රය සහ තිරසර සංවර්ධන අරමුණු 17 ඉටු කිරීම සඳහා බැඳී සිටී. තිරසර සංවර්ධන අභිමතාර්ථයන් සහ අරමුණු ළඟා කර ගැනීමේදී ශ්‍රී ලංකාව විවිධ පියවර ගෙන තිබේ. ඒවා රාජ්‍ය සහ රාජ්‍ය නොවන අංශවල, ජාත්‍යන්තර සංවිධාන සහ ඒවාට අනුබද්ධිත ආයතනවල අනුග්‍රහය මත පදනම්ව ක්‍රියාත්මක වේ. විශේෂයෙන් ශ්‍රී ලංකාව තුළ තිරසර සංවර්ධන ඉලක්කවල කාර්යසාධනය සැලකිය යුතු මට්ටමක් සෞඛ්‍ය, අධ්‍යාපනය, ස්ත්‍රී/පුරුෂ සමානතාවය පෙන්නුම් කරන අතරම දරිද්‍රතාවය, ආර්ථික සංවර්ධනය, ජලය, සනීපාරක්ෂාව සහ ස්වභාවික සම්පත් ආපදා අවම කිරීම යන අංශවල අභියෝගවලට මුහුණ දෙමින් සිටින බවක් ද දක්නට ලැබේ.

එක්සත් ජාතීන්ගේ සාමාජික රටක් ලෙස ශ්‍රී ලංකාව තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය තුළ ඇති අරමුණු සපුරා ගනිමින් ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීමට, පරිසරය හුරු කිරීමට ප්‍රමුඛ අවධානයක් යොමු කර ඇත.

තිරසර සංවර්ධන අරමුණු ඉදිරියට ගෙනයාම වෙනුවෙන් පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පිහිටුවීම, තිරසර සංවර්ධන විෂය පිළිබඳ වගකීම දරන රේඛීය අමාත්‍යාංශය වශයෙන් තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යංශය 2015දී පිහිටුවීම, තිරසර සංවර්ධන සභාවක් (Sustainable Development Council) පත් කිරීම, තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාවට නැංවීම් කටයුතු සම්බන්ධීකරණය, ඒ සඳහා පහසුකම් සැලසීම, වාර්තා කිරීම සඳහා 2018 වර්ෂයේ දී තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධනය පිළිබඳ අමාත්‍යාංශය පිහිටුවා තිබේ. 2017 අංක 9 දරන තිරසර සංවර්ධන පනත බලාත්මක කිරීම තවත් වැදගත් පියවරකි. තිරසර සංවර්ධන අරමුණු ළඟා කරගැනීම උදෙසා සුදුසු පරිසරයක් නිර්මාණය කර ගැනීමට ජාතික පරිසර පනත බලාත්මක කිරීම, ස්වභාවික සහ පාරිසරික සම්පත් ආරක්ෂා කිරීමට විවිධ නීති පද්ධති හඳුන්වා දීම, පරිසරය හා සම්බන්ධ විවිධ ජාත්‍යන්තර සම්මුතිවලට අත්සන් තැබීම සිදු කර තිබේ. ඊට අමතරව ශ්‍රී ලංකාවේ ජාතික සංඛ්‍යාන පද්ධතියට ද තිරසර සංවර්ධන අරමුණු මැනීමට හඳුන්වා දී ඇති දර්ශක ඇතුලත් කිරීම හා දත්ත රැස් කිරීම, 2018 වර්ෂයේදී තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය පිළිබඳ ස්වෙච්ඡා ජාතික සමාලෝචන ප්‍රකාශනය එළි දැක්වීම වැනි ක්‍රියාමාර්ග තුළින් තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීම වෙනුවෙන් වන මූලික පියවරයන් ශ්‍රී ලංකාව අනුගමනය කර ඇත.

### 1.3 තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක සහ දර්ශක

තිරසර සංවර්ධනය සඳහා වන න්‍යාය පත්‍රය මඟින් අරමුණු 17ක්, ඉලක්ක 169ක් සහ දර්ශක 244ක් හඳුන්වා දී තිබේ. රටක්/ආයතනයක් වශයෙන් වැඩසටහන් සැලසුම් කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට මෙම අරමුණු, ඉලක්ක සහ දර්ශක පිළිබඳ අවබෝධයක් තිබිය යුතු වේ.

**අරමුණ 01 - සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම (End Hunger, Achieve Food Security and Improved Nutrition and Promote Sustainable Agriculture)**




බරපතලම ගෝලීය අභියෝගය වනුයේ දරිද්‍රතාව බවත්, දරිද්‍රතාව පිටු දැකීම, තිරසර සංවර්ධනය අත්කරගැනීම සඳහා අත්‍යවශ්‍ය කොන්දේසියක් වන බවත් එක්සත් ජාතීන් හඳුනා ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් න්‍යාය පත්‍රයේ පළමු අරමුණ බවට සියලුතැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම පත්ව තිබේ. 2030 වනවිට ලෝකයේ සියලුම ස්ථානවල වෙසෙන පුද්ගලයින්ගේ දරිද්‍රතාවය තුරන් කිරීම මෙම ඉලක්කයේ ප්‍රමුඛ පරමාර්ථයයි. දුගී බව අවසන් කිරීම සාර්ථක අන්දමින් ඉටු කර ගැනීම වෙනුවෙන් වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු වන අරමුණු ගණනාවක් දක්වා ඇති අතර සාර්ථකත්වය ඇගයීම සඳහා යොදාගත යුතු දර්ශක කිහිපයක් හඳුන්වා දී ඇත. (ඉලක්ක 07ක් සහ දර්ශක 12ක්)

**ඉලක්කය 1.1** - 2030 වන විට ලෝකයේ සියලුම ස්ථානවල වෙසෙන පුද්ගලයින්ගේ අන්ත දරිද්‍රතාවය තුරන් කිරීම (දිනකට ඩොලර් 1.25 ට වඩා අඩුවෙන් ආදායම් ලබන පුද්ගලයන් අන්ත දිළිඳු කාණ්ඩයට අයත් වේ.)

**දර්ශකය 1.1.1.** - ස්ත්‍රී පුරුෂ භාවය, වයස, සේවා නියුක්ති මට්ටම සහ භූගෝලීය පිහිටීම (නාගරික, ග්‍රාමීය) යන සාධකයන්ට අනුව අන්තර්ජාතික දරිද්‍රතා රේඛාවෙන් පහළ ජනයාගේ අනුපාතය

**ඉලක්කය 1.2** - ජාතික මට්ටමේ අර්ථ නිරූපණවලට අනුකූල වන පරිදි සියලුම ආකාරයේ දරිද්‍රතාවයන්ගෙන් පෙළෙන සියලුම වයස් කාණ්ඩවලට අයත් පිරිමින්, කාන්තාවන් හා ළමුන්ගේ අනුපාතය අවම වශයෙන් අඩකින් අඩු කිරීම.

**දර්ශකය 1.2.1.** - ස්ත්‍රී පුරුෂ භාවය සහ වයස අනුව ජාතික දරිද්‍රතා රේඛාවෙන් පහළ ජීවත්වන ජනගහනයේ අනුපාතය.

**දර්ශකය 1.2.2.** - ජාතික නිර්වචනවලට අනුව, දරිද්‍රතාවයේ සියලු මානයන්ට අදාළ තත්ත්වයන් තුළ ජීවත් වන සියලු වයස් කාණ්ඩයන්ට අයත් පුරුෂ ස්ත්‍රී සහ ළමා ජනගහනයේ ප්‍රමාණය.

**ඉලක්කය 1.3** - පහළ මට්ටමේ අය ද ඇතුළත්ව සියලුම පුද්ගලයින් සම්බන්ධයෙන් ජාතික වශයෙන් සුදුසු වන්නා වූ සමාජ ආරක්ෂණ ක්‍රම ක්‍රියාවට නැංවීම සහ 2030 වන විට දරිද්‍රතාවයෙන් පෙළෙන සහ අවදානම් කණ්ඩායම් ප්‍රමාණවත් ලෙස එමඟින් ආවරණය වී තිබීම.

**දර්ශකය 1.3.1.**- සමාජ ආරක්ෂණ ක්‍රම මඟින් ආවරණය සැපයෙන ජනගහනයේ ස්ත්‍රී පුරුෂභාවය අනුව, ළමුන්, රැකියා වියුක්ති පුද්ගලයන්, වැඩිහිටියන්, ආබාධිත පුද්ගලයින්, ගර්භණී කාන්තාවන්, ළදරුවන්, රැකියා ආශ්‍රිත අනතුරුවලට ගොදුරු වූවන් සහ දරිද්‍ර මෙන්ම අවදානම් කණ්ඩායම්හි ප්‍රමාණය.

**ඉලක්කය 1.4** - විශේෂයෙන්ම දරිද්‍රතාවයෙන් පෙළෙන සහ අවදානමට ලක්විය හැකි අය ඇතුළුව සියලුම පිරිමින්ට සහ කාන්තාවන්ට 2030 වසර වන විට ආර්ථික සම්පත්, මූලික සේවාවන්, ඉඩම් හිමිකාරීත්වය හා පාලනය කිරීම සහ වෙනත් ආකාරයේ දේපල උරුමයන්, ස්වාභාවික සම්පත්, සුදුසු නව තාක්ෂණය සහ ක්ෂුද්‍ර මූල්‍ය ඇතුළුව මූල්‍ය සේවාවන් සඳහා ප්‍රවේශ වීමට සමාන අයිතිවාසිකම් තහවුරු කිරීම.

**දර්ශකය 1.4.1.**- මූලික සේවාවන් සහිත පවුල්වල ජීවත්වන ජනගහනගේ ප්‍රමාණය

**දර්ශකය 1.4.2.** - ස්ත්‍රී පුරුෂ භාවය සහ හිමිකම් මාදිලියට අනුව නීත්‍යානුකූලව පිළිගත් ලිපි ලේඛන සහ සුරක්ෂිත ඉඩම් හිමිකම් සහිත මුළු වැඩිහිටි ජනගහනයේ ප්‍රමාණය

**ඉලක්කය 1.5**- 2030 වන විට දරිද්‍රතාවයෙන් පෙළෙන ජනතාවගේ සහ අවදානමට ලක් විය හැකි තත්ත්වයේ ජනතාවගේ ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කිරීම සහ ඔවුන්ට කාලගුණික තත්ත්වයන්ගෙන් ඇති වන්නාවූ හානිකර බලපෑම් ද ආර්ථික, සමාජ සහ පරිසරමය වශයෙන් ඇතිවන්නා වූ හානි සහ ආපදාවලට නිරාවරණය වීම අඩු කිරීම.

**දර්ශකය 1.5.1.** - ජනගහනයේ ලක්ෂයකින් ස්වාභාවික ව්‍යසන හේතුවෙන් මියයන, අතුරුදහන් වන සහ සෘජුව බලපෑමට ලක්වන පුද්ගලයන් සංඛ්‍යාව

**දර්ශක 1.5.2.** - ලෝක දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව ස්වාභාවික ආපදා හේතුවෙන් සිදුවන සෘජු ආර්ථික හානිය

**දර්ශකය 1.5.3.** - ආපදා අවදානම අවම කිරීම සඳහා වන සෙන්ඩායි කාර්ය රාමුවට (2015-2030) සමගාමීව ජාතික ආපදා අවදානම් අවම කිරීමේ ක්‍රමෝපායන් අනුගමනය කරන සහ ක්‍රියාවට නංවා ඇති රටවල් සංඛ්‍යාව

**දර්ශකය 1.5.4.** - ජාතික ආපදා අවදානම් අවම කිරීමේ ක්‍රමෝපායන්ට සමගාමීව ප්‍රාදේශීය ආපදා අවදානම් අවම කිරීමේ ක්‍රමෝපායන් අනුගමනය කරන සහ ක්‍රියාවට නංවා ඇති පළාත් පාලන ආයතන ප්‍රමාණය

**ඉලක්කය 1.a** - සංවර්ධනය වූ රටවල සහ සංවර්ධනය වෙමින් පවත්නා රටවල සියලුම ආකාරයේ දරිද්‍රතාවන් තුරන් කිරීමට අවශ්‍ය ක්‍රමවේද සම්පාදනය කිරීම සඳහා සංවර්ධන සහයෝගීතාව ඇතුළු විවිධ වූ මූලාශ්‍රයන් මඟින් සම්පත් ලබා දීම වර්ධනය කිරීම.

**දර්ශකය 1.a.1.** - දිළිඳුබව තුරන් කිරීම සඳහා වැඩසටහන් ආයෝජනය කිරීම, දිරිමත් කිරීම මෙන්ම ඒ වෙනුවෙන් ජාතික, කලාපීය සහ අන්තර්ජාතික මට්ටමේ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට ද බලාපොරොත්තු වේ.

**දර්ශකය 1.a.2.** - අත්‍යවශ්‍ය සේවා (අධ්‍යාපන, සෞඛ්‍ය, සහ සමාජ ආරක්ෂණ) සඳහා වන රජයේ සමස්ථ වියදම් ප්‍රමාණය

**දර්ශකය 1.a.3.** - දළ දේශීය නිෂ්පාදනයේ අනුපාතයක් ලෙස දිළිඳුකම අවම කිරීමේ වැඩසටහන් සඳහා සෘජුව වෙන්කර ඇති සමස්ත මූල්‍ය ප්‍රදානයන්ගේ සහ ණය නොවන මූලාශ්‍රයන්වල මුළු එකතුව

**අරමුණ 02 - සාගින්න නැති කර, ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්ත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම (Ensure Healthy Lives and Promote Well-Being for All at All Ages)**




තිරසර සංවර්ධන අරමුණු අතරින් දෙවන අරමුණ වන්නේ සාගින්න නැති කර, ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්ත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීමයි. කුසගින්න, ආහාර අනාරක්ෂිතභාවය සහ මන්දපෝෂණය යන ගැටලුව විසඳීම සඳහා ක්‍රියාවට නැංවීමේ සැලසුම් සමඟ ප්‍රතිපත්ති සහ වැඩසටහන් හා සම්බන්ධ නිර්දේශ විශාල ප්‍රමාණයක් මෙම අරමුණ ඔස්සේ සපුරා ගැනීමට නියමිතය. මේ වෙනුවෙන් ඉලක්ක 08ක් සහ දර්ශක 11ක් ඉදිරිපත්ව තිබේ. එම ඉලක්ක සහ දර්ශක කිහිපයක් පහත දක්වේ.

**ඉලක්කය 2.1** - 2030 වන විට සාගින්න තුරන් කිරීම සහ විශේෂයෙන්ම ළදරුවන් ද ඇතුළත්ව දරිද්‍රතාවයෙන් පෙළෙන සහ අවදානමට ලක් වී තිබෙන ජනතාවට පෝෂණයෙන් යුත්, ප්‍රමාණවත් ආහාර වසර පුරා ලබාගැනීමට හැකි බව තහවුරු කිරීම.

**දර්ශකය 2.1.1.** - මන්දපෝෂණයේ ව්‍යාප්තිය

**දර්ශකය 2.1.2.** - ආහාර අනාරක්ෂිතතා අත්විඳීම් දර්ශකය පදනම් කර ගනිමින් ජනගහනය තුළ මධ්‍යස්ථ සේ තීව්‍ර ආහාර අනාරක්ෂිතභාවයේ ව්‍යාප්තිය

**ඉලක්කය 2.2** - අවුරුදු පහට අඩු ළමුන් සම්බන්ධයෙන් මිටිවීම සහ ක්ෂයවීම පිළිබඳ අන්තර්ජාතික වශයෙන් එකඟතාවට පත්වූ ඉලක්කය 2025 වන විට ළඟා කරගැනීම ද මන්දපෝෂණ තත්ත්වයන් තුරන් කිරීම සහ නව යොවුන් ගැහැණු ළමුන්ගේ, ගැබිණි මාතාවන්ගේ, කිරි දෙන මව්වරුන්ගේ සහ වයස්ගත පුද්ගලයින්ගේ පෝෂණ අවශ්‍යතාවන්ට විසඳුම් ලබාදීම.

**දර්ශකය 2.2.1.** - වයස අවුරුදු 5ට අඩු දරුවන් අතර කුරුභාවයේ ව්‍යාප්තිය (ලෝක සෞඛ්‍ය සංවිධානයේ ළමා වර්ධන ප්‍රමිතීන්ට අනුව, වයසට අදාළ උසෙහි මධ්‍යාහ්න අගයෙන් <-2ක සම්මත අපගමනයක්)

**දර්ශකය 2.2.2.** - වයස අවුරුදු 5ට අඩු ළමුන් අතර දුෂ්පෝෂණ මාදිලිය අනුව (කෘෂවීම සහ ස්ථූලභාවය) එහි ව්‍යාප්තිය (ලෝක සෞඛ්‍ය සංවිධානයේ ළමා වර්ධන ප්‍රමිතීන්ට අනුව, වයසට අදාළ බරෙහි මධ්‍යාහ්න අගයෙන් <+2 හෝ<-2 ක සම්මත අපගමනයක්)

**ඉලක්කය 2.3** - කුඩා පරිමාණ ආහාර නිෂ්පාදකයින්ගේ, විශේෂයෙන්ම කාන්තාවන්ගේ, ගොවි පවුල් සහ ධීවරයින්ගේ කෘෂිකාර්මික ඵලදායිතාව සහ ආදායම්, ඉඩම්වලට ආරක්ෂාකාරීව සහ සමාන ලෙස ප්‍රවේශ වීමේ අවස්ථාවන්, අනෙකුත් නිෂ්පාදන සම්පත් හා ප්‍රධානයන්, දැනුම, මූල්‍ය සේවා, වෙළඳපොළ සහ වටිනාකම් එකතු කිරීම් හා ගොවිපළ නොවන රැකියා සඳහා අවස්ථාවන් පුළුල් කිරීම.

**දර්ශකය 2.3.1. -** ගොවි/ගව පාලන/වනාන්තර ආශ්‍රිත කර්මාන්ත පන්තීන්හී විශාලත්වය අනුව, ශ්‍රම ඒකකයක් සඳහා වන නිෂ්පාදන පරිමාව

**දර්ශකය 2.3.2. -** ස්ත්‍රී පුරුෂභාවය සහ ස්වදේශික මට්ටම අනුව සුළු පරිමාණ ආහාර නිෂ්පාදිතයින්ගේ සාමාන්‍ය ආදායම

**ඉලක්කය 2.4** - 2030 වන විට ආහාර සුරක්ෂිතතාව වෙනුවෙන් කාලගුණ වෙනස්වීම්වලට හැඩ ගැසීම සඳහා වූ ධාරිතාවන් ශක්තිමත් කිරීම හානිකර කාලගුණ තත්ත්වයන් (නියඟ, ගංවතුර සහ වෙනත් ආපදාවන්) සහ පසේ ගුණාත්මක තත්ත්වයන් ආරක්ෂා වන කෘෂිකාර්මික ක්‍රම භාවිතය ඉහළ නැංවීම

**දර්ශකය 2.4.1.** -ඵලදායී සහ තිරසර කෘෂිකර්මය සිදු කරන කෘෂිකාර්මික බිම් ප්‍රමාණය

**ඉලක්කය 2.5** - 2020 වන විට බීජවල, වගා කරන ලද ශාකවල සහ ගොවිපළ සහ ගෘහාශ්‍රිත සතුන්ගේ ජානමය විවිධත්වය පවත්වාගෙන යාම මෙම ඉලක්කයයටතේ ඉටු කර ගත යුතුය. විවිධත්වයන්ගෙන් යුතු බීජ සහ ශාක බැංකු ජාතික කලාපීය සහ අන්තර්ජාතික මට්ටමින් පවත්වාගෙන යාම ජාන සම්පත් සහ පාරම්පරික දැනුම උපයෝගී කරගැනීම මඟින්ලබාගන්නා වූ ප්‍රතිලාභවලට ප්‍රවේශ වීම සහ සමානව භුක්ති විඳීම තහවුරු කිරීම ද මෙමඟින් බලාපොරොත්තු වේ.

**දර්ශකය 2.5.1.** - මධ්‍යකාලීන හෝ දීර්ඝකාලීන සංරක්ෂණ පහසුකම් යටතේ ආරක්ෂා කර තිබෙන ආහාරමය හා කෘෂිකාර්මික වශයෙන් වැදගත් ශාක හා සත්ත්ව ජාන සම්පත් සංඛ්‍යාව

**දර්ශකය 2.5.2.** - අවදානම්, අවදානම් නොවන හෝ හඳුනා නොගත් වඳවීයාමේ අවදානම් මට්ටමක් සහිත යන කාණ්ඩ යටතේ වර්ගීකරණය කර ඇති දේශීය ජෛව වරණයන්ගේ සංඛ්‍යාව

**ඉලක්කය 2.a** - දියුණු වූ රටවල් ඇතුළුව දියුණු වෙමින් පවත්නා රටවල කෘෂිකාර්මික නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීම සඳහා, අන්තර්ජාතික සහගයෝගීතාවෙන් ග්‍රාමීය යටිතල පහසුකම්, කෘෂිකාර්මික පර්යේෂණ සහ ව්‍යාප්ති සේවාවන්, තාක්ෂණ සංවර්ධනය සහ ශාක සහ පශු සම්පත් ජාන බැංකු සඳහා සිදු කරන ආයෝජන වැඩි කිරීම.

**දර්ශකය 2.a.1.** - රාජ්‍ය වියදම් සඳහා වන කෘෂිකාර්මික දිශානුගත දර්ශකය, කෘෂිකාර්මික අංශය සඳහා වන සමස්ථ නිල සම්පත් පාලනය

**දර්ශකය 2.a.2.** - කෘෂිකාර්මික අංශය සඳහා වන සමස්ථ නිල සම්පත් පාලනය (නිල සංවර්ධන ආධාර සහ වෙනත් නිල ගලා ඒම)

**ඉලක්කය 2.b** - ලෝකයේ කෘෂිකාර්මික වෙළඳපොල සීමා කිරීම සහ සාවද්‍ය නියෝජනය වැළැක්වීම සහ නිවැරදි කිරීම සහ දෝහා සංවර්ධන න්‍යාය පත්‍රයේ එකඟතාවන් අනුව කටයුතු කරමින් සියලුම ආකාරයේ කෘෂිකාර්මික අපනයනයන් සඳහා වන සහනාධාර සහ සමාන බලපෑම ඇති සියලුම අපනයන ප්‍රයත්නයන් සමාන්තරගතව ඉවත් කිරීම.

**දර්ශකය 2.b.1.** - කෘෂි අපනයන සහනාධාර

**ඉලක්කය 2.c** - ආහාර මිල උච්ඡාවචනය වීම වැළැක්වීමේ ඉලක්කයින් ආහාර සංචිත ආරක්ෂා කිරීම ආහාර නිෂ්පාදන වෙළඳපොළවල් ක්‍රියාත්මක වීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

**දර්ශකය 2.c.1.** - ආහාර මිල අසමානතා දර්ශකය

**අරමුණ 03 - නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරීම (Ensure Healthy Lives and Promote Well-Being for all at all Ages)**




තිරසර සංවර්ධන අරමුණු අතරින් තෙවන අරමුණ වන්නේ නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරීමයි. යම් රටක සෞඛ්‍ය අංශයේ ගුණාත්මකභාවය තවදුරටත් වැඩි දියුණු කිරීම මෙම අරමුණ ඔස්සේ බලාපොරොත්තු වේ. මෙම අරමුණ සපුරා ගැනීම වෙනුවෙන් ඉලක්ක 13ක් සහ දර්ශක 27ක් ඉදිරිපත් කර තිබේ.

**ඉලක්කය 3.1** - 2030 වන විට ලෝකයේ මාතෘ මරණ අනුපාතිකය සජීවී උපත් 100,000ට 70 දක්වා අඩු කිරීම.

**දර්ශකය 3.1.1.** - මාතෘ මරණ අනුපාතය

**දර්ශකය 3.1.2.** - පුහුණුව ලත් සෞඛ්‍ය කාර්ය මණ්ඩල සහාය ඇතිව අඩු ළදරු උපත් ප්‍රමාණය

**ඉලක්කය 3.2** - සියලුම රටවල්වල නවජාත මරණ අනුපාතිකය සජීවී උපත් 1000කට 12 දක්වා සහ අවුරුදු පහට අඩු ළමා මරණ සජීවී උපත් 1000 ට අවම වශයෙන් 25 දක්වා අඩු කිරීමේ ඉලක්කය ඇතිව 2030 වන විට අලුත උපන් සහ වයස අවුරුදු පහට අඩු ළමුන්ගේ වළක්වාගත හැකි මරණ තුරන් කිරීම.

**දර්ශකය 3.2.1.** - වයස අවුරුදු 5ට අඩු දරුවන්ගේ මරණ අනුපාතය

**දර්ශකය 3.2.2.** - බිළිඳු (නවජාත) මරණ අනුපාතය

**ඉලක්කය 3.3** - 2030 වන විට ඒඩ්ස්, ක්ෂය රෝගය, මැලේරියා ඇතුළු නොතකා හැර ඇති සර්ම කලාපීය වසංගත, හෙපටයිටිස්, ජලය මගින් ඇතිවන රෝග සහ අනෙකුත් බෝවන රෝග තුරන් කිරීම.

**දර්ශකය 3.3.1.** - ස්ත්‍රීපුරුෂභාවය, වයස යන ප්‍රධාන ජනගහනයන්ට අදාළව HIVආසාධිත නොවූ පුද්ගලයින් 1000කට අලුතින් HIV ආසාධිත පුද්ගලයන්ගේ සංඛ්‍යාව

**දර්ශකය 3.3.2.** - ජනගහනයෙන් පුද්ගලයන් ලක්ෂයකට සිටින ක්ෂය රෝගීන් සංඛ්‍යාව

**දර්ශකය 3.3.3.** - ජනගහනයෙන් පුද්ගලයන් 1000කට සිටින මැලේරියා රෝගීන් සංඛ්‍යාව

**දර්ශකය 3.3.4.** - ජනගහනයෙන් පුද්ගලයන් 10000කට සිටින හෙපටයිටිස් B රෝගීන් සංඛ්‍යාව

**දර්ශකය 3.3.5.** - නොසලකා හරින ලද සර්ම කලාපීය රෝග සඳහා සෞඛ්‍යමය මැදිහත්වීමක් අවශ්‍ය පුද්ගලයන් සංඛ්‍යාව

**ඉලක්කය 3.4** - 2030 වන විට බෝ නොවන රෝග නිසා සිදුවන අකල් මරණ, ප්‍රතිකාර මගින් හා වළක්වා ගැනීමේ ක්‍රම මගින් තුනෙන් එකකින් අඩු කර ගැනීම සහ මානසික සෞඛ්‍යය සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීමට අදාළ කටයුතු ඉටු කර ගැනීම.

**දර්ශකය 3.4.1.** - හෘද නාල ආශ්‍රිත රෝග, පිළිකා, දියවැඩියාව හෝ නිදන්ගත ශ්වසන රෝග හේතුවෙන් මියයන ප්‍රමාණය

**දර්ශකය 3.4.2.** - සියදිවි නසාගැනීම් හේතුවෙන් ජීවිත අහිමි වන ප්‍රමාණය

**ඉලක්කය 3.5** - හානිකර ආකාරයට මද්‍යසාර භාවිතය සහ අන්තරායකාරී ඖෂධ භාවිතය වැළැක්වීමේ ක්‍රියාමාර්ග සහ ප්‍රතිකාර ශක්තිමත් කිරීම

> **දර්ශකය 3.5.1.** - මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් හටගන්නා ආබාධ තත්ත්වය සඳහා ප්‍රතිකාරමය පහසුකම් (ඖෂධමය, මනෝ විද්‍යාත්මක, පුනරුත්ථාපනමය සහ රැකබලා ගැනීමේ සේවා) ව්‍යාප්තිය

> **දර්ශකය 3.5.2.** - කැලැන්ඩර වර්ෂයක් තුළ (අවු 15 හෝ ඊට වැඩි) පුද්ගලයින් අතර ජාතික ඒක පුද්ගල මධ්‍යසාර පරිභෝජනයට අනුව අර්ථ දක්වන ලද හානිකර මධ්‍යසාර භාවිතය ශුද්ධ මධ්‍යසාර ලීටර්වලින්

**ඉලක්කය 3.6** - 2030 වන විට මහාමාර්ගවල සිදු වන අනතුරුවලින් සිදු වන තුවාලවීම් සහ මරණ සංඛ්‍යාව

> **දර්ශකය 3.6.1. -** මාර්ග අනතුරු හේතුවෙන් සිදුවන මරණ අනුපාතය

**ඉලක්කය 3.d -** සංවර්ධනය වෙමින් පවත්නා රටවල් ඇතුළුව සියලුම රටවල ජාතික මට්ටමේ සහ විශ්වීය මට්ටමේ සෞඛ්‍ය අවදානම් සඳහා පූර්ව දැනුම්දීමේ, අවදානම් අවම කිරීමේ සහ කළමනාකරණය කිරීමේ ධාරිතාවන් ශක්තිමත් කිරීම සඳහා ක්‍රියාත්මක වීම.

> **දර්ශකය 3. d.1.** - අන්තර්ජාතික සෞඛ්‍ය නියමයන් සඳහා වන ධාරිතාව සහ හදිසි සෞඛ්‍ය අවස්ථාවක් සඳහා වන සූදානම

**අරමුණ 04 - පරිපූර්ණ, සාධාරණ, ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථා සැලසීම (Ensure Inclusive and Equitable Quality Education and Promote Lifelong Learning Opportunities for All)**




එක්සත් ජාතීන්ගේ තිරසර අරමුණු අතරින් සිව්වන අරමුණ වන්නේ පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීමයි. මෙම අරමුණ ඔස්සේ ගෝලීය වශයෙන් අධ්‍යාපන සංවර්ධනය උදෙසා ප්‍රමුඛතාව ලබා දී ඇති අතර ඊට අදාළ අරමුණු 10ක් හා දර්ශක 11ක් ඉදිරිපත් කර තිබේ. සම අධ්‍යාපන අවස්ථා වැඩි දියුණු කිරීමේ සහ එහි ගුණාත්මකභාවය වර්ධනය කිරීම මෙහි ප්‍රමුඛ අරමුණ වන අතර එය ගෝලීය තිරසර සංවර්ධනයට සෘජුවම දායක වන අන්දම කෙරෙහි අවධානය යොමු කර තිබේ.

**ඉලක්කය 4.1** - 2030 වන විට ඵලදායී ඉගෙනුම් ප්‍රතිඵල ලබා ගැනීමට හැකි වන ආකාරයෙන් සියලුම ගැහැණු ළමුන් සහ පිරිමි ළමුන් නිදහස්, සමාන සහ ගුණාත්මකභාවයෙන් ඉහළ, ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපනයක් සැපයීම.

> **දර්ශකය 4.1.1.** - ස්ත්‍රී පුරුෂභාවය අනුව, a. 2/3 ශ්‍රේණිවල ; b. ප්‍රාථමික ශ්‍රේණි අවසානයේ සහ c. පහළ ද්විතීයික මට්ටම් වල ඉගෙනුම ලබන දරුවන් සහ යෞවනයන් අතර i. කියවීමට ii. ගණිතමය කුසලතාවය සඳහා වන අවම මට්ටම සහිත අයගේ ප්‍රමාණය

**ඉලක්කය 4.2** - 2030 වන විට සියලුම ගැහැණු ළමුන්ට සහ පිරිමි ළමුන්ට ගුණාත්මක වශයෙන් ඉහළ පූර්ව ළමාවිය සංවර්ධනයට, සත්කාර සේවාවන්ට සහ පූර්ව ප්‍රාථමික අධ්‍යාපනයට ප්‍රවේශ වීමේ අවස්ථාව පැවතීම හා එමගින් ඔවුන් ප්‍රාථමික අධ්‍යාපනයට සූදානම්ව සිටින බව තහවුරු කිරීම.

**දර්ශකය 4.2.1.** - ස්ත්‍රී පුරුෂභාවය අනුව සෞඛ්‍යමය, ඉගෙනුම් සහ මනෝවිද්‍යාත්මක අංශයන්ගෙන් යහපත් සංවර්ධන මාර්ගයකට අවතීර්ණව සිටින වයස අවුරුදු 5ට අඩු ළමුන්ගේ ප්‍රමාණය

**දර්ශකය 4.2.2.** - ස්ත්‍රී පුරුෂභාවය අනුව සංවිධානාත්මක ඉගෙනුම් ක්‍රියාවලියට සම්බන්ධ වී සිටින අනුපාතය (ප්‍රාථමික පන්තියට ඇතුළත් කරගන්නා සම්මත වයසට වඩා වසරකට පෙර)

**ඉලක්කය 4.3** - සියලුම කාන්තාවන්ට සහ පිරිමින්ට ගුණාත්මක වශයෙන් ඉහළ සහ අඩු මුදලකට ලබාගත හැකි විශ්වවිද්‍යාල අධ්‍යාපනය ද ඇතුළත්ව තාක්ෂණික, වෘත්තීය සහ තෘතීයික අධ්‍යාපනය ලබා ගැනීමට හැකිවීම.

**දර්ශකය 4.3.1.** - ස්ත්‍රී පුරුෂ භාවය අනුව පූර්ව මාස 12 තුළ විධිමත් හා නොවිධිමත් අධ්‍යාපනය සඳහා යෞවනයන්ගේ සහ වැඩිහිටියන්ගේ සහභාගීත්ව අනුපාතය

**ඉලක්කය 4.4** - 2030 වන විට සුනිසි රැකියා සහ ව්‍යවසායකත්වයක් සඳහා තාක්ෂණික හා වෘත්තීය සුදුසුකම් ඇතුළුව අදාළ කුසලතා ලබා සිටින තරුණයින් සහ වැඩිහිටියන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමින් ඉහළ නැංවීම.

**දර්ශකය 4.4.1.** - කුසලතාවයේ ආකාරය අනුව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කුසලතාවයෙන් යුක්ත යොවුන් හා වැඩිහිටියන්ගේ ජනගහනයේ ප්‍රමාණය

**ඉලක්කය 4.5** - 2030 වන විට අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනස්කම් තුරන් කිරීමේ ඉලක්කය ද මේ යටතට ගැනේ. අධ්‍යාපනයේ සියලුම මට්ටම්වලට ප්‍රවේශ වීමේ අවස්ථාව තහවුරු කිරීම සහ ආබාධිත පුද්ගලයින්ට, ස්වදේශිකයින්ට සහ අවදානමට ලක්විය හැකි ළමුන්ට වෘත්තීය පුහුණුව ලබා ගැනීමට අවස්ථාව සැලසීම.

**දර්ශකය 4.5.1.** - සියලු අධ්‍යාපනික දර්ශක සඳහා වන සමානාත්මතා දර්ශක වෙන්කොට දැක්විය හැකිය. (ස්ත්‍රී/ පුරුෂ, ග්‍රාමීය නාගරික, ධනවත්භාවයේ මට්ටම සහ ආබාධිත මට්ටම, ස්වදේශික ජනයා සහ ගැටුම් බලපෑම ආදී දත්ත පවත්නා බව)

**ඉලක්කය 4.6** - 2030 වන විට තරුණ තරුණියන්, සහ කාන්තා, පිරිමි, වැඩිහිටි පුද්ගලයින්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයකගේ අකුරු හැකියාව සහ ගණිතමය හැකියාව වර්ධනයට පියවර ගැනීම.

**දර්ශකය 4.6.1.** - ස්ත්‍රී පුරුෂභාවය අනුව කිසියම් වයස් කාණ්ඩයකට අදාළව අවම a.සාක්ෂරතා b.සංඛ්‍යානමය කාර්ය කුසලතාවක් අත්කරගෙන සිටින ජනගහනයේ ප්‍රමාණය

**අරමුණ 05 - ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ළඟා කර සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම (Achieve Gender Equality and Empower all Women and Girls)**




2030 න්‍යාය පත්‍රයට අනුව පස්වන තිරසර සංවර්ධන අරමුණ වන්නේ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ළඟා කර සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීමයි. ඉලක්ක 09ක් සහ දර්ශක 14ක් ඔස්සේ 2030 වර්ෂය වන විට මෙම අරමුණ සපුරා ගැනීමට බලාපොරොත්තු වේ. ස්ත්‍රී/පුරුෂ සමානාත්මතාවය තුළින් කාන්තාවන් සවිබල ගැන්වීම සහ සංවර්ධනය, මානව හිමිකම්, මානුෂීය ක්‍රියාමාර්ග, සාමය සහ ආරක්ෂාව යන අංශවල හවුල්කරුවන් ලෙස කාන්තවෙන් සම්බන්ධ කර ගැනීම මින් අපේක්ෂා කෙරේ.

**ඉලක්කය 5.1** - කාන්තාවන්ට හා ගැහැණු ළමුන්ට එරෙහිව සියලුම ස්ථානයන්හි සිදුවන්නා වූ සියලුම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීම.

**දර්ශකය 5.1.1.** - ස්ත්‍රී පුරුෂභාවයට අදාළව සමානාත්මතාවය සහ වෙනස්කොට නොසැලකීම ප්‍රවර්ධනය බලාත්මක කිරීම සහ අධීක්ෂණය පිණිස වන නෛතික රාමුවක් පවත්නේ ද නැද්ද යන්න තහවුරු කර ගැනීම.

**ඉලක්කය 5.2** - මානව කුට්ටනය ලිංගික සහ වෙනත් ආකාරයේ දූෂණයන් ද ඇතුළත්ව කාන්තාවන්ට සහ ගැහැණු ළමුන්ට එරෙහිව පොදු සහ පෞද්ගලික ස්ථානයන්හි සිදුවන්නා වූ සියලුම ආකාරයේ ප්‍රචණ්ඩත්වයන් තුරන් කිරීම.

**දර්ශකය 5.2.1.** - පසුගිය මාස 12ක කාලය තුළදී, හිංසනයේ ස්වභාවය සහ වයස අනුව, සහකරුවෙක් සිටි/සිටින, වයස අවුරුදු 15 ට වැඩි කාන්තාවන් සහ ගැහැණු ළමුන් අතුරින් කායික, ලිංගික හෝ මානසික හිංසනයට ලක්වූ ප්‍රමාණය

**දර්ශකය 5.2.2.** - වයස සහ සිදු වූ ස්ථානය අනුව පසුගිය මාස 12 තුළදී හිතෛෂී සහකරුවා හැර සෙසු පුද්ගලයින් අතින් ලිංගික හිංසනයට ලක්වූ කාන්තාවන් සහ වයස අවුරුදු 15ට වැඩි ගැහැණු දරුවන්ගේ ප්‍රමාණය

**ඉලක්කය 5.3** - ළමා විවාහයන්, බලහත්කාරයෙන් සිදුවන්නා වූ විවාහයන් සහ කාන්තාවන්ගේ ලිංගික අවයව තුවාල කිරීම් වැනි සියලුම හානිකර භාවිතයන් තුරන්විය යුතු බවද මෙහි දක්වේ.

**දර්ශකය 5.3.1.** වයස අවු. 20-24 වූ විවාහක හෝ වයස අවු. 15ට පෙර සහ වයස අවු 18ට පෙර එක්ව වාසය කරන කාන්තාවන්ගේ ප්‍රමාණය

**දර්ශකය 5.3.2.** වයස අවු 15-49 කාන්තා කණ්ඩායමේ ස්ත්‍රී සුන්නත් කිරීමට ලක් කරන ලද කාන්තාවන්ගේ ප්‍රමාණය

**ඉලක්කය 5.5** - දේශපාලන, ආර්ථික, සහ සාමාන්‍ය ජීවිතයේ සියලුම අවස්ථාවන්හි තීරණ ගැනීමේදී කාන්තාවන්ට නායකත්වය සහ සමාන අවස්ථාවන් සැලසීම හා ඵලදායී අන්දමින් සහභාගි වීම තහවුරු කිරීම.

**දර්ශකය 5.5.1.a.**- ජාතික පාර්ලිමේන්තුවේ b. පළාත් පාලන ආයතනයන්හී කාන්තාවන් විසින් දරණු ලබන ආසන ප්‍රමාණය

**දර්ශකය 5.5.2.** - විධායක මට්ටමේ තනතුරු හොබවන කාන්තාවන්ගේ ප්‍රමාණය

**ඉලක්කය 5.B** - කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා විශේෂයෙන්ම තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය ඇතුළත්ව තාක්ෂණය ලබාගැනීම සඳහා සාධනීය අවස්ථාවන් ලබා දීම.

**දර්ශකය 5.b.1. -** ස්ත්‍රී පුරුෂභාවය අනුව ජංගම දුරකතනයක් හිමි පුද්ගලයන්ගේ ප්‍රමාණය

**අරමුණ 06 - සැමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබා ගැනීම සහ ජලයේ තිරසර කළමනාකරණය සහතික කිරීම (Ensure Availability and Sustainable Management of Water and Sanitation for All)**




ආරක්ෂිත පානීය ජලය සඳහා ප්‍රවේශය ගෝලීය වශයෙන් තහවුරු කිරීම වෙනුවෙන් මෙම අරමුණ ඉදිරිපත් කර තිබේ. සැමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබාගැනීම සහ ජලයේ තිරසර කළමනාකරණය සහතික කිරීම සඳහා ඉලක්ක 08ක් සහ දර්ශක 11ක් ඉදිරිපත් කර තිබේ.

**ඉලක්කය 6.1** - 2030 වන විට සියලු දෙනාට අඩු මිලකට පානීය ජලය ලබා ගැනීමට හැකි වීම සහ සියලුම දෙනාට ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් සැපයීම.

**දර්ශකය 6.1.1.** - සුරක්ෂිතව කළමනාකරණය කෙරෙන පානීය ජල සැපයුම් සේවා භාවිත කරන ජනගහනයේ ප්‍රමාණය

**ඉලක්කය 6.3** - 2030 වන විට ජල දූෂණය අඩු කරමින් ජලයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම, හානිකර විෂ රසායනික සහ වෙනත් ද්‍රව්‍ය බැහැර කිරීම සහ මුදා හැරීම තුරන් කිරීම, අපජලය පිරිපහදු කර පරිසරයට මුදාහැරීම. ජලය සැලකිය යුතු මට්ටමින් ප්‍රතිචක්‍රීයකරණය සහ ආරක්ෂාකාරීව නැවත භාවිත කිරීම.

**දර්ශකය 6.3.1.** - අප ජලය සුරක්ෂිත ලෙස ප්‍රතිකාර කෙරෙන ප්‍රමාණය

**දර්ශකය 6.3.2.** - ගුණාත්මකභාවයෙන් යුක්ත ජලය සහිත ජලාශ ප්‍රමාණය

**ඉලක්කය 6.4** - සියලුම ක්ෂේත්‍රයන්හි කාර්යක්ෂමව ජලය භාවිත කිරීම සැලකිය යුතු මට්ටමින් ඉහළ නැංවීම, තිරසාර අන්දමින් ජලය ලබා ගැනීම සහ සැපයීම, ජලය හිඟකම මඟහැරවීම සඳහා යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම සහ ජලය හිඟකමින් පීඩා විඳින ජනතාවගේ සංඛ්‍යාව ප්‍රාමාණික ලෙස අවම කිරීම

**දර්ශකය 6.4.1.** - ජල භාවිත කාර්යක්ෂමතාවයේ කාලානුරූපී වෙනස් වීම

**දර්ශකය 6.4.2.** - පවත්නා මිරිදිය මූලාශ්‍ර ප්‍රමාණයට අනුපාත වූ ජලය භාවිතයට ගන්නා ප්‍රමාණය

**ඉලක්කය 6.5** - 2030 වන විට දේශ සීමා නොසළකා ජලය සහයෝගයෙන් භාවිත කිරීම සඳහා වන ක්‍රියාත්මක වැඩපිළිවෙලක් සකස් කිරීම.

**දර්ශකය 6.5.1.** - ඒකාබද්ධ ජල සම්පත් කළමනාකරණයක් සිදුවන මට්ටම

**දර්ශකය 6.5.2.** - ජලය සහයෝගයෙන් භාවිත කිරීම සඳහා වන ක්‍රියාත්මක වැඩපිළිවෙලක් සහිත දේශ සීමා අතර විහිදුණු ජල නිම්න ප්‍රදේශයන්හී ප්‍රමාණය

**ඉලක්කය 6.6** - 2020 වන විට කඳු, වන ගහන, තෙත් බිම්, ගංගාවන්, භූ ගත ජලය සහ විල් ඇතුළුව ජලය සම්බන්ධ ජීව පද්ධති ආරක්ෂා කිරීම සහ නැවත ස්ථාපිත කිරීම.

**දර්ශකය 6.6.1.** - ජලාශ්‍රිත පරිසර පද්ධතීන්හී භූමි ප්‍රමාණයේ කාලානුරූපීය වෙනස්වීම.

**ඉලක්කය 6.b -** ජලය හා සනීපාරක්ෂක කටයුතු කළමනාකරණයේදීප්‍රාදේශීය ප්‍රජාව සහභාගි කර ගැනීම.

**දර්ශකය 6.b.1. -** ජල සහ සනීපාරක්ෂණ කළමනාකරණය සඳහා ප්‍රාදේශීය ජන කණ්ඩායම් සහභාගි කර ගැනීම සඳහා ස්ථාපිත සහ ක්‍රියාත්මක ප්‍රතිපත්ති සහිත පළාත් පාලන ඒකක ප්‍රමාණය

**අරමුණ 07 - සියල්ලන් සඳහා දැරිය හැකි, විශ්වසනීය, තිරසර සහ නවීන බලශක්ති සැපයුම සහතික කිරීම (Ensure Access to Affordable, Reliable, Sustainable and Modern Energy for All)**




සියල්ලන් සඳහා දැරිය හැකි, විශ්වසනීය, තිරසර සහ නවීන බලශක්ති සැපයුම සහතික කිරීම තිරසර සංවර්ධන අරමුණු අතරින් හත්වන අරමුණ වන අතර බලශක්ති අංශය තිරසර මඟක් වෙත යොමු කිරීම මෙම ඉලක්කයෙහි මූලික අපේක්ෂාව වේ. මෙම අරමුණ සපුරා ගැනීම වෙනුවෙන් ඉලක්ක 05ක් සහ දර්ශක 06ක් හඳුන්වා දී තිබේ.

**ඉලක්කය 7.1 -** 2030 වන විට සියලු දෙනාටම අඩු මිලකට නවීන බලශක්ති මූලාශ්‍ර ලබා ගැනීමට පරිසරයක් ඇති කිරීම.

**දර්ශකය 7.1.1. -** විදුලි සැපයුම සහිත ජනගහනගේ ප්‍රමාණය

**දර්ශකය 7.1.2. -** මූලිකවම පවිත්‍ර ඉන්ධන සහ තාක්ෂණය මත රඳා පවත්නා ජනගහනයේ ප්‍රමාණය

**ඉලක්කය 7.2 -** 2030 වන විට ලෝක බලශක්ති මූලාශ්‍ර අතරින් පුනර්ජනනීය බලශක්ති ප්‍රතිශතය ඉහළ නැංවීම

**දර්ශකය 7.2.1.** සමස්ත අවසන් බලශක්ති පරිභෝජනයෙන් පුනර්ජනනීය බලශක්ති පංගුව


**ඉලක්කය 7.3 -** ලෝක බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ අනුපාතිකය දෙගුණයක් බවට පත්කිරීමේ ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම.

**දර්ශකය 7.3.1. -** ප්‍රාථමික බලශක්තිය සහ දළ දේශීය නිෂ්පාදනයට අදාළව ගණනය කරන බලශක්ති සණත්වය

**ඉලක්කය 7.b -** 2030 වන විට අවම වශයෙන් සංවර්ධනය වූ රටවල, කුඩා දිවයින් රාජ්‍යයන්ගෙන් ආවරණය වූ සංවර්ධනය වෙමින් පවත්නා රටවල් ද ඇතුළත්ව සියලුම සංවර්ධනය වන රටවලට ඔවුන්ගේ වැඩසටහන් සැලසුම්වලට අනුකූලව නවීන සහ තිරසර බලශක්ති සේවා සැපයීම සඳහා යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීම සහ තාක්ෂණය වැඩිදියුණු කිරීම.

**දර්ශකය 7.b.1. -** දළ දේශීය නිෂ්පාදනයේ සහ තිරසර සංවර්ධන සේවා සඳහා වන යටිතල පහසුකම් සහ තාක්ෂණය පිණිස වන, මූල්‍ය හුවමාරුව පිණිස වන සෘජු විදේශ ආයෝජන ප්‍රමාණයට අනුපාතව බලශක්ති කාර්යක්ෂමතාවය සඳහා වන ආයෝජන

**අරමුණ 08 - සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම (Promote Sustained, Inclusive and Sustainable Economic Growth, Full and Productive Employment and Decent Work for All)**




තිරසර සංවර්ධන අරමුණු අතරින් 08වන අරමුණ වන්නේ සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීමයි. ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කරමින් ඒ ඒ රටවල ආර්ථික තත්ත්වය ද වර්ධනය කිරීමට මෙම අරමුණ හඳුන්වා දී තිබේ. ඉලක්ක 12ක් සහ දර්ශක 17ක් මීට ඇතුලත්ය.

**ඉලක්කය 8.1** - ජාතික තත්ත්වයන්ට අනුකූලව ඒක පුද්ගල ආර්ථික වර්ධනය පවත්වාගෙන යාම සහ සංවර්ධනය වී ඇති රටවල් අවම වශයෙන් වසරකට 7%ක දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධනයක් පවත්වාගෙන යාම.

**දර්ශකය 8.1.1.** - සත්‍ය ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදනයේ වාර්ෂික වර්ධනය

**ඉලක්කය 8.2** - විවිධාංගීකරණය, තාක්ෂණය ඉහළ නැංවීම සහ නවෝත්පාදන තුළින් සහ ශ්‍රමය සඳහා වැඩි ඉල්ලුමක් ඇති ක්ෂේත්‍රය පිළිබඳ අවධානය යොමු කිරීම තුළින් ඉහළ මට්ටමේ ආර්ථික නිෂ්පාදිතයන් ලබා ගැනීම

**දර්ශකය 8.2.1.** - විදේශ සේවයේ නියුක්ත පුද්ගලයෙකු සඳහා වන සත්‍ය දළ දේශීය නිෂ්පාදනයේ වර්ධනය

**ඉලක්කය 8.3** - ව්‍යවසායකත්වය හා නිර්මාණශීලීත්වය වර්ධනයට ඉවහල් වන සංවර්ධනාත්මක ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ ව්‍යවසායකයින් දිරිගැන්වීම සිදු කිරීම.

**දර්ශකය 8.3.1.** - ස්ත්‍රී පුරුෂභාවය අනුව, කෘෂිකාර්මික නොවන සේවා නියුක්තියේ නොවිධිමත් සේවා නියුක්ති ප්‍රමාණය

**ඉලක්කය 8.4** - තිරසර පරිභෝජනය සහ නිෂ්පාදනය පිළිබඳ දස අවුරුදු වැඩ සැලැස්මට අනුකූලව, ලෝක නිෂ්පාදනයේ සහ පරිභෝජනයේ සම්පත් උපයෝජනය කාර්යක්ෂමව කිරීම සහ ආර්ථික සංවර්ධනයේදී පරිසරයට සිදුවන හානි නවතාලීමට ක්‍රියාමාර්ග ගැනීම.

**දර්ශකය 8.4.1.** - ද්‍රව්‍යමය පා සටහන, ඒක පුද්ගල ද්‍රව්‍යමය පා සටහන සහ දළ දේශීය නිශ්පාදනයට අදාළ ද්‍රව්‍යමය පා සටහන

**දර්ශකය 8.4.2.** - දේශීය ද්‍රව්‍ය පරිභෝජනය, ඒක පුද්ගල දේශීය ද්‍රව්‍ය පරිභෝජනය සහ දළ දේශීය නිෂ්පාදනයට අදාළව දේශීය ද්‍රව්‍ය පරිභෝජනය

**ඉලක්කය 8.5** - 2030 වන විට ආබාධිත පුද්ගලයින් සහ යෞවනයින් ද ඇතුළත්ව සියලුම කාන්තාවන් සහ පිරිමින් සඳහා ඵලදායී හා සුදුසු රැකියා අවස්ථාවන් ලබාදීම.

**දර්ශකය 8.5.1.** - රැකියාව, වයස සහ ආබාධයන් සහිත පුද්ගලයන් යන සාධක අනුව පිරිමි සහ ගැහැණු සේවා නියුක්තිකයන්ගේ පැයකට උපයන සාමාන්‍ය ආදායම

**දර්ශකය 8.5.2.** - ස්ත්‍රී/පුරුෂභාවය වයස සහ ආබාධිත සහිත පුද්ගලයන්ට අදාළව විරැකියා අනුපාතය

**ඉලක්කය 8.b -** 2020 වන විට තරුණ තරුණියන්ට රැකියා අවස්ථා ලබාදීම සඳහා ජගත් මට්ටමින් ක්‍රමෝපායක් සංවර්ධනය කිරීම, ක්‍රියාවට නැංවීම සහ අන්තර්ජාතික කම්කරු සංවිධානයේ ජගත් රැකියා සම්මුතිය ක්‍රියාවට නැංවීම.

> **දර්ශකය 8.b.1.** - තරුණ සංවර්ධනය සඳහා හඳුනාගත් ක්‍රමෝපායක් නැතහොත් ජාතික සේවා නියුක්ත ක්‍රමෝපායේ කොටසක් ලෙස දියුණු සහ ක්‍රියාත්මක තත්ත්වයේ ජාතික උපායමාර්ගයක් පැවතීම.

**අරමුණ 09 - යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරි ගැන්වීම. (Build Resilient Infrastructure, Promote Inclusive and Sustainable Industrialization and Foster Innovation)**




2030 න්‍යාය පත්‍රයට අනුව නවවන අරමුණ වන්නේ යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරි ගැන්වීමයි. මෙහිදී නිෂ්පාදන හා භූගෝලීය පිහිටීම විවිධාංගීකරණය, ක්‍රමික සහජීවනය ප්‍රවර්ධනය සහ ඉහළ අගයක් එක් කිරීම සහ ඵලදායී කාර්මීකරණය වර්ධනය කරමින් විශේෂයෙන් ම අපනයනය පාදක කර්මාන්තයෙහි සංවර්ධනය අපේක්ෂා කෙරේ. මෙම අරමුණ සපුරා ගැනීම වෙනුවෙන් ඉලක්ක 08ක් සහ දර්ශක 12ක් ඉදිරිපත් කර තිබේ.

**ඉලක්කය 9.1 -** ආර්ථික සංවර්ධනය සහ මානව යහපැවැත්ම වෙනුවෙන් සියලු දෙනාටම ලබා ගත හැකි සහ ප්‍රවේශය විය හැකිවීම අවධානයට ගෙන කලාපීය සහ ජාතික දේශසීමාවන් අතර සිදු කරන යටිතල පහසුකම් ද ඇතුළත්ව ගුණාත්මක වශයෙන් ඉහළ විශ්වාසදායී තිරසර සහ ආපදාවන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

> **දර්ශකය 9.1.1.** - වසර පුරා භාවිත කළ හැකි මාර්ගයක සිට කි.මී. 2ක දුර ප්‍රමාණයක් තුළ ජීවත්වන ග්‍රාමීය ජනගහනයේ ප්‍රමාණය
>
> **දර්ශකය 9.1.2.** - ප්‍රවාහන මාධ්‍යය අනුව මගීන් සහ භාණ්ඩ ප්‍රමාණය

**ඉලක්කය 9.2 -** සියලු දෙනාටම ප්‍රතිලාභ අත්වන තිරසර වූ කර්මාන්තකරණය ප්‍රවර්ධනය කිරීම, 2030 වන විට ජාතික තත්ත්වයන්ට අනුකූල රැකියාවන් සැපයීමේදී කර්මාන්ත අංශයේ දායකත්වය කැපී පෙනෙන ලෙස ඉහළ නැංවීම සහ අවම වශයෙන් සංවර්ධනය වී ඇති රටවල මෙම දායකත්වය දෙගුණයක් බවට පත් කිරීම.

> **දර්ශකය 9.2.1. -** දළ දේශීය නිෂ්පාදනය සහ ඒක පුද්ගල ආදායමේ අනුපාතයක් ලෙස නිෂ්පාදන අගය එකතු කිරීම.
>
> **දර්ශකය 9.2.2. -** සමස්ථ සේවා නියුක්තියේ අනුපාතයක් ලෙස නිෂ්පාදන අංශයේ සේවා නියුක්තිය

**ඉලක්කය 9.3 -** සංවර්ධනය වෙමින් පවතින රටවල කුඩා පරිමාණ කර්මාන්ත සහ වෙනත් ව්‍යවසායන් සඳහා මූල්‍ය සේවාවන්, ණය ලබාගැනීමේ ප්‍රවේශය සහ අවස්ථාවන් ඉහළ නැංවීම.

> **දර්ශකය 9.3.1.** - සමස්ථ නිෂ්පාදන අගය එකතු කිරීම්වල පංගුවක් ලෙස කුඩා පරිමාණ නිෂ්පාදන ප්‍රමාණය
>
> **දර්ශකය 9.3.2.** - ණය හෝ ණය බැඳීම සහිත කුඩා පරිමාණ කර්මාන්ත ප්‍රමාණය

**ඉලක්කය 9.4** - 2030 වන විට යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ කර්මාන්ත තිරසර කිරීම සඳහා නව තාක්ෂණය යොදාගත යුතු බවත් කර්මාන්ත ක්‍රියාවලියේ දී සම්පත් කාර්යක්ෂම ආකාරයට භාවිත කිරීම සහ පරිසරයට සුදුසු ගුණාත්මකභාවයෙන් ඉහළ තාක්ෂණයන් උපයෝගී කර ගැනීමට සියලුම රටවල් පියවර ගැනීම.

**දර්ශකය 9.4.1. -** අගය එකතු කිරීම් ඒකකයක් සඳහා විමෝචනය වන කාබන්ඩයොක්සයිඩ් වායු ප්‍රමාණය

**ඉලක්කය 9.5** - සංවර්ධනය වෙමින් පවත්නා රටවල් ඇතුළු සියලු රටවල කර්මාන්ත අංශයන්හි තාක්ෂණික ධාරිතාවන් ඉහළ නැංවීම අරමුණු කරගෙන විද්‍යාත්මක පර්යේෂණ සිදු කිරීම (රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ පර්යේෂණ සහ සංවර්ධනය සඳහා වූ වියදම් වැඩි කිරීම).

**දර්ශකය 9.5.1.** - දළ දේශීය නිෂ්පාදනයේ අනුපාතයක් ලෙස පර්යේෂණ හා සංවර්ධන පිරිවැය

**දර්ශකය 9.5.2.** - ජනගහනයේ මිලියනයක් සඳහා සිටින පර්යේෂණයන් (පූර්ණ කාලීන හෝ සමාන) සංඛ්‍යාව

**අරමුණ** 10 - **රටවල් තුළ සහ ඒවා අතර අසමානතාවය අඩුකිරීම (Reduce Inequality within and among Countries)**




තිරසර සංවර්ධන අරමුණු අතුරින් දසවන අරමුණ වන්නේ රටවල් තුළ සහ ඒවා අතර අසමානතාවය අඩු කිරීමයි. මෙම අරමුණ මූලිකවම බලාපොරොත්තු වන්නේ කිසිවෙක් මග නොහරිමින් හා එමගින් විෂමතාව අවම කිරීමයි. මෙම අරමුණ සපුරා ගැනීම වෙනුවෙන් ඉලක්ක 10ක් සහ දර්ශක 11ක් ඉදිරිපත් කර තිබේ.

**ඉලක්කය 10.1** - 2030 වන විට ලෝක ජනගහනයේ පහළ මට්ටමේ සිටින (40%) අයගේ ආදායම් වර්ධනය ජාතික මට්ටමේ සාමාන්‍ය අගයට වඩා වැඩියෙන් වර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම.

**දර්ශකය 10.1.1.** - ජනගහනයේ පහළම 40% සහ සමස්ථ ජනගහනය අතර ගේ දොර වියදම් හෝ ඒක පුද්ගල ආදායමේ වර්ධන වේගය

**ඉලක්කය 10.2** - 2030 වන විට වයස, ලිංගිකත්වය, ආබාධිත බව, ජන වර්ගය, ජාතිය, ආගම හෝ ආර්ථික හෝ වෙනත් තත්ත්වයන් පිළිබඳව තැකීමකින් තොරව සියලු දෙනාගේ සමාජ, ආර්ථික සහ දේශපාලනික අන්තර්කරණය සවිබල ගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීම

**දර්ශකය 10.2.1.** - ස්ත්‍රී පුරුෂභාවය, වයස සහ ආබාධිත තත්ත්වය යන සාධකයන් අනුව මධ්‍ය ආදායමෙන් 50% කට වඩා පහළින් ජීවත් වන ජනගහනයේ ප්‍රමාණය

**ඉලක්කය 10.3** - ප්‍රතිලාභ බෙදීයාමේදී සමාන අවස්ථාවන් පැවතීම තහවුරු කිරීම, පවත්නා අසමානතාවන් අවම කිරීම සහ වෙනස්කොට සැලකීමට තුඩු දෙන්නා වූ නීති, ප්‍රතිපත්ති, සහ භාවිතාවන් ඉවත් කිරීම සහ මේ සම්බන්ධයෙන් සුදුසු නීති ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග ගැනීම.

**දර්ශකය 10.3.1.** - ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය යටතේ වෙනස් කොට සැලකීම යන පදනම යටතේ තහනම් කොට ඇති වෙනස්කම් සහ හිංසනයන්ට තමන් පසුගිය මාස 12ක කාලය තුළදී ගොදුරු වූ බවට පුද්ගලිකව හැඟෙන බවට වාර්තා කරන ජනගහනයේ ප්‍රමාණය

**ඉලක්කය 10.4** - විශේෂයෙන්ම මූල්‍ය, වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති භාවිතයට ගැනීම සහ ප්‍රගතිශීලී ලෙස සමානාත්මතාවය ළඟා කර ගැනීම.

**දර්ශකය 10.4.1.** - වැටුප් සහ සමාජ ආරක්ෂණ හුවමාරුවලින් සමන්විත දළ දේශීය නිෂ්පාදනයේ ශ්‍රම පංගුව

**ඉලක්කය 10.5** - නීතිමය තත්ත්වයන් වර්ධනය කිරීම, ලෝක මූල්‍ය වෙළඳපොළවල් සහ ආයතන අධීක්ෂණය කිරීම සහ මූල්‍ය රෙගුලාසි ක්‍රියාවට නැංවීම ශක්තිමත් කිරීම.

**දර්ශකය 10.5.1** - මූල්‍ය සංවේදිතා දර්ශක

**අරමුණ 11 - නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම (Make Cities and Human Settlements Inclusive, Safe, Resilient and Sustainable)**




නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම, තිරසර සංවර්ධන අරමුණු අතුරින් 11වන ඉලක්කයයි. මෙම අරමුණ ඔස්සේ නාගරික තිරසරභාවය ඒ ඒ අංශ සමඟ එක්ව වර්ධනය කිරීම උදෙසා වන අරමුණු හා දර්ශකවලින් සකස් වී තිබේ. ඒ අනුව ඉලක්ක 10ක් සහ දර්ශක 15ක ප්‍රමාණයක් මෙම අරමුණ සපුරා ගැනීම වෙනුවෙන් ඉදිරිපත් කර තිබේ.

**ඉලක්කය 11.1** - 2030 වන විට සියලුම දෙනාට ප්‍රමාණවත් ආරක්ෂාකාරී සහ අඩු මිලට ලබා ගත හැකි නිවාස සහ මූලික සේවාවන් වෙත ප්‍රවේශය තහවුරු කිරීම සහ පැල්පත් නිවාස වැඩිදියුණු කිරීම.

**දර්ශකය 11.1.1.** - පැල්පත්, අවිධිමත් ජනාවාස හෝ ප්‍රමාණවත් නොවන නිවාස පහසුකම් යටතේ ජීවත් වන නාගරික ජනගහනයේ ප්‍රමාණය

**ඉලක්කය 11.2** - විශේෂයෙන්ම අවදානමට ලක් විය හැකි තත්ත්වයේ සිටින කාන්තාවන්, ළමුන්, ආබාධ සහිත පුද්ගලයින් සහ වයස්ගත පුද්ගලයින්ට විශේෂ අවධානය යොමු කරමින් මහාමාර්ගවල ආරක්ෂාව ඉහළ නැංවීම, පොදු ප්‍රවාහන පද්ධති සැලකිය යුතු මට්ටමින් ව්‍යාප්ත කිරීම මගින් 2030 වන විට සියලුම දෙනාට ආරක්ෂාකාරී අඩු මිලට ලබාගත හැකි ප්‍රවේශ විය හැකි සහ තිරසර ප්‍රවාහන පද්ධති ලබා දීම.

**දර්ශකය 11.2.1.** - ස්ත්‍රී පුරුෂභාවය, වයස සහ ආබාධ සහිත අය යන සාධක මත පොදු ප්‍රවාහන පහසුකම් පහසුවෙන් ලබාගත හැකි ජනගහනගේ පංගුව

**ඉලක්කය 11.a** - 2030 වන විට සියලුදෙනා අන්තර්කරණය වූ සහ තිරසර නාගරීකරණය වැඩිදියුණු කිරීම සහ සියලුම රටවල සහභාගීත්ව, ඒකාබද්ධ සහ තිරසර මානව ජනාවාස සැලසුම් කිරීම, සහ කළමනාකරණය කිරීම සඳහා ධාරිතාවන් වැඩිදියුණු කිරීම.

**දර්ශකය 11.a.1.** - නගර ප්‍රමාණය අනුව ජනගහන ප්‍රක්ෂේපණයන් සහ සම්පත් අවශ්‍යතාවයන් ඒකාබද්ධ කරමින් සිදුකරන නගර සහ ප්‍රදේශීය සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කරනු ලබන නගරයන්හි ජීවත්වන ජනගහණයේ ප්‍රමාණය

**ඉලක්කය 11.4** - ලෝකයේ ස්වභාවික සහ සංස්කෘතික උරුමයන් රැකගැනීම හා ආරක්ෂා කරගැනීම සඳහා වූ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම.

**දර්ශකය 11.4.1. -** උරුමයේ ආකාරය (සංස්කෘතික, ස්වභාවික, මිශ්‍ර ලෝක උරුම මධ්‍යස්ථාන යටතේ) පරිපාලන මට්ටම (ජාතික, ප්‍රාදේශීය, පළාත් පාලන/නාගරික), වියදම් ආකාරය (මෙහෙයුම් වියදම්/ආයෝජන) සහ පුද්ගලික මූල්‍ය යෙදවුම් (පුද්ගලික, ලාබ නොලැබෙන අංශයේ සහ අනුග්‍රාහක) අනුව සියලු සංස්කෘතික සහ ස්වභාවික උරුමයන් රැකගැනීම, ආරක්ෂාව සහ සංරක්ෂණය වෙනුවෙන් සමස්ථ ඒක පුද්ගල වියදම (රාජ්‍ය හා පුද්ගලික).

**ඉලක්කය 11.5 -** 2030 වන විට දරිද්‍රතාවයෙහි සහ අවදානමට පත්විය හැකි තත්ත්වයන්හි සිටින පුද්ගලයින් සම්බන්ධයෙන් අවධානය යොමු කරමින් ජලය මඟින් සිදුවන්නා වූ විනාශයන් ද ඇතුළු ආපදාවලින් ලෝකයේ දළ දේශීය නිෂ්පාදිතයට සිදුවන සෘජු ආර්ථික හානිය සැලකිය යුතු ලෙස අඩු කිරීම සහ ආපදා නිසා බලපෑමට හා මරණයට පත් වන පුද්ගලයින්ගේ සංඛ්‍යාව කැපී පෙනෙන ලෙස අඩු කිරීම.

**දර්ශකය 11.5.1. -** පුද්ගලයන් 1000,000ට හදිසි ආපදා හේතුවෙන් සිදුව ඇති මරණ සංඛ්‍යාව, අතුරුදන් සංඛ්‍යාව සහ සෘජුව බලපෑමට ලක්ව ඇති සංඛ්‍යාව

**දර්ශකය 11.5.2. -** ආපදා තත්ත්ව හේතුවෙන් ගෝලීය දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව සෘජු ආර්ථික හානිය, අත්‍යවශ්‍ය යටිතල පහසුකම්වලට සිදු වූ හානිය සහ මූලික සේවාවලට සිදුවූ බාධාවන්

**අරමුණ 11.6 -** 2030 වන විට වාතයේ ගුණාත්මකභාවය සහ නාගරික සහ වෙනත් අපද්‍රව්‍ය කළමනාකරණය ඇතුළත්ව නගර නිසා සිදු වන ඒක පුද්ගල අහිතකර පරිසර බලපෑම අඩු කිරීම.

**දර්ශකය 11.6.1. -** නගරවල ජනනය වන මුලු නාගරික ඝණ අපද්‍රව්‍ය ප්‍රමාණය අතරින් නිතිපතා එකතු කෙරෙන සහ නිසි පරිදි බැහැර කෙරෙන නාගරික ඝණ අපද්‍රව්‍ය ප්‍රමාණය

**දර්ශකය 11.6.2. -** නගරවල පවත්නා (ජනගහන හරිත) ක්ෂුද්‍ර අංශුමය පදාර්ථයන්හි වාර්ෂික මධ්‍යන්‍යය මට්ටම (උදා: PH 2.5 සහ PH 10)

**අරමුණ 12 - තිරසර පාරිභෝජන සහ නිෂ්පාදන රටාවන් සහතික කිරිම (Ensure Sustainable Consumption and Production Patterns)**




තිරසර පාරිභෝජන සහ නිෂ්පාදන ප්‍රතිපත්ති ඵලදායී අන්දමින් ක්‍රියාවට නැංවීම උදෙසා මෙම අරමුණ හඳුන්වා දී තිබේ. මෙම අරමුණ සපුරා ගැනීම වෙනුවෙන් ඉලක්ක 11ක් සහ දර්ශක 13ක් ඉදිරිපත් කර තිබේ.

**ඉලක්කය 12.1 -** සංවර්ධනය වෙමින් පවතින රටවල සංවර්ධනය සහ ධාරිතාවන් පිළිබඳව සැලකිලිමත් වෙමින් තිරසර පාරිභෝජනය සහ නිෂ්පාදනය සම්බන්ධයෙන් වන දස අවුරුදු වැඩ සැලැස්ම සංවර්ධනය වූ රටවල ප්‍රධානත්වයෙන් සියලුම රටවල් විසින් ක්‍රියාවට නැංවීම.

**දර්ශකය 12.1.1. -** තිරසර පරිභෝජන සහ නිෂ්පාදන ජාතික ක්‍රියාකාරි සැලසුම් ජාතික ප්‍රතිපත්තීන් තුළ ප්‍රමාණානුගත ප්‍රමුඛතා ලෙස හෝ අරමුණු ලෙසින් ක්‍රියාත්මක කරන රටවල් සංඛ්‍යාව

**ඉලක්කය 12.2 -** 2030 වන විට ස්වභාවික සම්පත් තිරසර අන්දමින් කළමනාකරණය කිරීම සහ කාර්යක්ෂමව භාවිත කිරීම වෙත ළඟා වීම.

**දර්ශකය 12.2.1.** - ද්‍රව්‍යමය පා සටහන, ඒක පුද්ගල ද්‍රව්‍යමය පා සටහන සහ දළ දේශීය නිෂ්පාදනයට අනුව ද්‍රව්‍යමය පා සටහන

**දර්ශකය 12.2.2.** - දේශීය භාණ්ඩ පරිභෝජනය, ඒක පුද්ගල දේශීය භාණ්ඩ පරිභෝජනය සහ දළ දේශීය නිෂ්පාදනයට අනුව දේශීය ද්‍රව්‍ය පරිභෝජනය

**ඉලක්කය 12.3** - 2030 වන විට සිල්ලර සහ පරිභෝජන මට්ටම්වල ඒක පුද්ගල ආහාර අපතේ යාම අවම කිරීම සහ පසු අස්වනු හානි ඇතුළුව නිෂ්පාදන හා සැපයුම් දාමයන්වල අපතේ යාම අවම කිරීම.

**දර්ශකය 12.3.1.** - ලෝක ආහාර හානි දර්ශකය

**ඉලක්කය 12.4** - පරිසර හිතකාමී අන්දමට රසායනික ද්‍රව්‍ය හා සියලුම අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම ක්‍රියාවට නැංවීම තුළින් මානව සෞඛ්‍යයට සහ පරිසරයට සිදුවන්නා වූ අහිතකර බලපෑම අවම කිරීම සඳහා වාතයට, ජලයට සහ පසට ඒවා මුදා හැරීම අවම කිරීම.

**දර්ශකය 12.4.1.** - හානිකර අපද්‍රව්‍ය සහ සෙසු රසායනිකයන් පිළිබද ජාත්‍යන්තර බහු පාර්ශවීය ගිවිසුම් සම්බන්ධයෙන් එක් එක් ගිවිසුමක් මගින් අදාළ වන පරිදි තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා වන වගකීම් සහ බැඳීම සඳහා සම්බන්ධ වී සිටින පාර්ශවකරුවන් සංඛ්‍යාව

**දර්ශකය 12.4.2** - ඒක පුද්ගල හානිකර අපද්‍රව්‍ය ජනනය සහ ප්‍රතිකාර ක්‍රමයේ ආකාරය අනුව හානිකර අපද්‍රව්‍ය ප්‍රතිකාර කරන ප්‍රමාණය

**ඉලක්කය 12.8** - 2030 වන විට සියලුම ප්‍රදේශවල සිටින සියලුම දෙනාට තිරසර සංවර්ධනය හා ස්වභාවධර්මය සමග සුසංගයෝගයෙන් යුත් ජීවන රටාවන් ගත කිරීම පිළිබඳව දැනුවත්භාවයක් සහ ඊට අදාළ තොරතුරු ලැබී තිබීම තහවුරු කිරීම.

**දර්ශකය 12.8.1**(a) - ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති (b) විෂය මාලා (c) ගුරු අධ්‍යාපනය සහ (d)ශිෂ්‍ය ඇගයීම් කෙතරම් දුරට (i) ගෝලීය පුරවැසිභාවය පිළිබද අධ්‍යාපනය සහ (ii) තිරසර සංවර්ධනය (දේශගුණික විපර්යාස පිළිබඳ අධ්‍යාපනය ඇතුළත්ව යන අංශයන් තුළට ප්‍රවාහානුගත කර තිබේද යන්න

**අරමුණ 13 - දේශගුණික විපර්යාස සහ ඒවායේ බලපෑම් වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක වීම (Take Urgent Action to Combat Climate Change and its Impacts)**




තිරසර සංවර්ධන අරමුණු අතරින් 13වන අරමුණ වන්නේ දේශගුණික විපර්යාස සහ ඒවායේ බලපෑම් වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක වීමයි. ගෝලීය තිරසරභාවය වර්ධනය කිරීමේ දී බහුලව බලපානු ලබන සාධකයක් වන්නේ දේශගුණික විපර්යාස තත්ත්වයන්ය. එමගින් බලාපොරොත්තු වන සංවර්ධනයෙහි ප්‍රතිලාභ නොලැබීයාමට ඇති හැකියාව ද ඉහළ අගයක් ගනී. එබැවින් මෙම අරමුණ ඔස්සේ දේශගුණික විපර්යාස තත්ත්වයන් සහ එමගින් ගෝලීය හා දේශීය වශයෙන් ඇති වන්නා වූ බලපෑම්වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක වීමට වැඩසටහන් පිළියෙල කළ යුතුය. මෙම අරමුණ හා සම්බන්ධ ඉලක්ක 05ක් සහ දර්ශක 08ක් ඉදිරිපත් කර තිබේ.

**ඉලක්කය 13.1** - සියලුම රටවල කාලගුණය සම්බන්ධ විපත් සහ ස්වභාවික ආපදාවලට ඔරොත්තු දීමේ සහ එවැනි තත්ත්වයන්ට මුහුණ දීමේ හැකියාව ශක්තිමත් කිරීම.

**දර්ශකය 13.1.1.** - ජනගහනයේ පුද්ගලයින් ලක්ෂයකට හදිසි ආපදා හේතුවෙන් සිදුවන මරණ, අතුරුදහන් වන සහ සෘජුව බලපෑමට ලක්වන පුද්ගලයන් සංඛ්‍යාව

**දර්ශකය 13.1.2.** - 2015-2030 ආපදා අවදානම අවම කිරිම සඳහා වන සෙන්ඩායි කාර්ය රාමුවට අනුකූලව ජාතික අවදානම් අවම කිරීමේ ක්‍රමෝපායන් ක්‍රියාත්මක කරන රටවල් සංඛ්‍යාව

**දර්ශකය 13.1.3.** - ජාතික ආපදා අවම කිරීමේ ක්‍රමෝපායන්ට සමාන්තරව ප්‍රාදේශීය ආපදා අවම කිරීමේ ක්‍රමෝපායන් යොදාගෙන එය ක්‍රියාවට නංවා ඇති පළාත් පාලනය කරන ආයතන ප්‍රමාණය

**ඉලක්කය** 13.2 - ජාතික මට්ටමේ ප්‍රතිපත්ති ක්‍රමෝපායන් සහ සැලසුම්වලට කාලගුණ වෙනස්කම් අවම කිරීමේ ක්‍රියාමාර්ග ඇතුළත් කිරීම.

**දර්ශකය** 13.2.1. - ආහාර නිෂ්පාදනයට තර්ජනයක් නොවන පරිදි (ජාතික හැඩගැසීමේ සැලැස්මක්, ජාතික අධිෂ්ඨානශීලී දායකත්වය, ජාතික සන්නිවේදනය සහ අර්ධ වාර්ෂික යාවත්කාලීන වාර්තා සහ සෙසු දේශගුණික වෙනස්වීමේ අහිතකර බලපෑම් සඳහා හැඩගැසීමට ඔවුන්ගේ හැකියාව වැඩි කරන ඒකාබද්ධ ප්‍රතිපත්ති/ක්‍රමෝපාය/සැලසුම් සහ කාළගුණික වෙනස්වීම් හරිතාගාර වායු විමෝචනයන් අවම කිරීම සඳහා වන කැපවීම පිළිබඳ අදහස් හුවමාරු කරගෙන, ස්ථාපනය කර ක්‍රියාවට නංවා ඇති රටවල් සංඛ්‍යාව

**ඉලක්කය** 13.3 - කාලගුණ වෙනස්වීම අවම කිරීම, ඒ අනුව හැඩ ගැසීම, බලපෑම අවම කිරීම සහ පූර්ව අනතුරු ඇඟවීම සම්බන්ධයෙන් දැනුවත්භාවය ඉහළ නැංවීම සහ මානව සහ ආයතනික ධාරිතාවන් ඉහළ නැංවීමට ක්‍රියා කිරීම.

**දර්ශකය** 13.3.1. - ප්‍රාථමික, ද්විතීය හා තෘතීයික අධ්‍යාපන විෂයමාලාවලට ආපදා බලපෑම අවම කිරීම සහ පූර්ව දැනුම් දීමේ ක්‍රම ඇතුළත් කර ඇති රටවල් සංඛ්‍යාව

**දර්ශකය** 13.3.2. - හැඩගැසීම අවම කිරීම සහ තාක්ෂණික හුවමාරුව සඳහා වන ආයතනික පද්ධතිමය සහ පුද්ගලයන්ගේ ධාරිතා ගොඩනැංවීම සවිමත් කිරීම හා සංවර්ධනය සඳහා වන ක්‍රියාමාර්ග පිළිබඳ අදහස් සන්නිවේදනය සිදුකරගෙන ඇති රටවල් සංඛ්‍යාව

**ඉලක්කය** 13.**a** - එක්සත් ජාතීන්ගේ කාලගුණික වෙනස්වීම පිළිබඳ ප්‍රඥප්තියට අනුව සංවර්ධනය වෙමින් පවත්නා රටවලට කාලගුණික වෙනස්වීම් වලින් වන බලපෑම අවම කිරීම සඳහා ඵලදායී ක්‍රියාමාර්ග ගැනීමට හා ඒවා විනිවිදභාවයෙන් යුතුව ක්‍රියාත්මක කිරීමටත් හරිත කාලගුණ අරමුදල ඇති කිරීමටත් ඒ සඳහා 2020 වන විට සියලුම මූලාශ්‍රයන්ගෙන් ඒකාබද්ධව වාර්ෂිකව ඩොලර් මිලියන 100ක් එක්රැස් කිරීමට සංවර්ධනය වූ රටවල් පාර්ශවයේ එකඟතාව ලබා ගැනීම.

**දර්ශකය** 13.4.1 - ඩොලර් බිලියන 100ක සඳහා 2020-2025 කාලය තුළදී වාර්ෂිකව සපයන ලද ඇමරිකානු ඩොලර් ප්‍රමාණය

## අරමුණ 14 - තිරසර සංවර්ධනය සඳහා සාගර, මුහුදු සහ සාගර සම්පත් සංරක්ෂණය සහ පිරිමැසුම්දායී භාවිතය (Conserve and Sustainably Use the Oceans, Seas and Marine Resources for Sustainable Development)




සමුද්‍රීය පරිසර පද්ධතීන් මුහුණ පා ඇති ඍජු හෝ වක්‍ර අභියෝගයන් ජය ගැනීමේ අපේක්ෂාව සහිතව මෙම 14වන තිරසර සංවර්ධන අරමුණ හඳුන්වා දෙනු ලැබිණි. තිරසර සංවර්ධනය සඳහා සාගර, මුහුදු සහ සාගර සම්පත් සංරක්ෂණය සහ පිරිමැසුම්දායී භාවිතය සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් ඉලක්ක 10ක් සහ එම ඉලක්ක ඇගයීම වෙනුවෙන් වන දර්ශක 10ක් ද ඉදිරිපත් කර තිබේ.

**ඉලක්කය 14.1** - 2025 වන විට සමුද්‍රීය අපද්‍රව්‍ය පෝෂක දූෂණය වීම ද ඇතුළුව විශේෂයෙන් වගාබිම් පදනම් කරගත් ක්‍රියාකාරකම් මගින් සිදුවන සියලුම ආකාරයේ සමුද්‍රදූෂණය වැළැක්වීම සහ සැලකිය යුතු මට්ටමින් අවම කිරීම.

**දර්ශකය - 14.1.1.** වෙරළාසන්න සුපෝෂණ සහ පාවෙන ප්ලාස්ටික් අපද්‍රව්‍ය ඝනත්වය

**ඉලක්කය - 14.2** 2020 වන විට ආපදාවන්ට ඔරොත්තු දීමට සවිබල ගන්වමින් සහ සෞඛ්‍යවත් සහ ඵලදායීතාවයෙන් යුක්ත වන ආකාරයට සාගර කලාප යථා තත්ත්වයට පත් කරමින් සමුද්‍රීය සහ වෙරළබඩ පරිසර පද්ධති තිරසර අන්දමින් කළමනාකරණය කිරීම සහ ආරක්ෂා කිරීම.

**දර්ශකය - 14.2.1.** පරිසර පද්ධති පාදක ප්‍රවේශය භාවිතයෙන් කළමණාකරණය කෙරෙන විශේෂ ආර්ථික කලාප ප්‍රමාණය

**ඉලක්කය - 14.3** සියලුම මට්ටමේ විද්‍යාත්මක සහයෝගීතාවයෙන් යුක්තව සාගර ආම්ලීකරණය වීම මගින් ඇතිවන බලපෑම අවම කිරීම සහ එයට විසඳුම්සෙවීම.

**දර්ශකය - 14.3.1.** අනුමත නියැදි සාම්පල මධ්‍යස්ථානයන්හි මිනුම් කරන ලද සාමාන්‍ය සමුද්‍රීය ආම්ලිකතාවය (PH)

**ඉලක්කය - 14.4** 2020 වන විට මසුන්ගෙන් තිරසර වශයෙන් උපරිම අස්වැන්නක් ලබා දිය හැකි ආකාරයට මත්ස්‍ය සම්පත් හැකි කෙටිම කාලයකදී නැවත යථා තත්ත්වයට පත් කිරීම සඳහා කාර්යක්ෂම ලෙස මසුන් ඇල්ලීම පාලනය කිරීම සහ අසීමිතව, නීතිවිරෝධී, වාර්තා නොකළ සහ පාලනය නොකළ හා හානිකර මසුන් මැරීමේ ක්‍රම භාවිතය අවසන් කිරීම සහ විද්‍යාත්මක පදනමකින් යුක්ත කළමනාකරණ සැලසුම් ක්‍රියාත්මක කිරීම.

**දර්ශකය 14.4.1.** ජෛව විද්‍යාත්මක තිරසර මට්ටම් තුළ පවත්නා මත්ස්‍ය තොග ප්‍රමාණය

**ඉලක්කය 14.5** විද්‍යාත්මක තොරතුරු සහ ජාතික සහ අන්තර්ජාතික නීතිවලට අනුකූලව වෙරළබඩ සහ සමුද්‍රීය ප්‍රදේශවලින් 10%ක් සංරක්ෂණය කිරීම.

**දර්ශකය - 14.5.1.** සමුද්‍රීය ප්‍රවේශයට සාපේක්ෂව ආරක්ෂිත ප්‍රදේශයන්හී ව්‍යාප්තිය

**අරමුණ 15 - භූගෝලීය පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය, තිරසර වනාන්තර කළමනාකරණය, කාන්තාරීකරණයට එරෙහිව ක්‍රියාකිරීම ප්‍රතිස්ථාපනය කර ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම, ඉඩම් හායනය නැවැත්වීම සහ පුරුත්ථාපනය සහ ජෛව විවිධත්ව විනාශය නැවැත්වීම (Protect, Restore and Promote Sustainable Use of Terrestrial Ecosystems, Sustainably Manage Forests, Combat Desertification, and Halt and Reverse Land Degradation and Halt Biodiversity Loss)**




භූගෝලීය පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය, තිරසර වනාන්තර කළමනාකරණය, කාන්තාරීකරණයට එරෙහිව ක්‍රියා කිරීම ප්‍රතිස්ථාපනය කර ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම, ඉඩම් හායනය නැවැත්වීම සහ පුරුත්ථාපනය සහ ජෛව විවිධත්ව විනාශය නැවැත්වීම, තිරසර සංවර්ධන අරමුණු අතරින් 15 වන අරමුණ වේ. මෙම අරමුණෙහි ප්‍රධාන ඉලක්කය වන්නේ ස්වභාවික සම්පත් නිසි ලෙස කළමනාකරණය කිරීම තුළින් ගෝලීය තිරසරභාවය ඇති කිරීමයි. ඒ වෙනුවෙන් ඉලක්ක 12ක් සහ දර්ශක 14ක් හඳුන්වා දී තිබේ.

**ඉලක්කය 15.1** - 2020 වන විට භූමියේ සහ ගොඩ බිම අභ්‍යන්තරයේ පවත්නා මිරිදිය පරිසර පද්ධති සහ ඒවායින් ලැබෙන්නා වූ සේවාවන්, විශේෂ වනාන්තර, කඳු සහ වියළි බිම් අන්තර්ජාතික ගිවිසුම්වලට අනුකූල වන පරිදි සංරක්ෂණය, නැවත නගා සිටුවීම සහ තිරසර අන්දමින් භාවිතා කිරීම තහවුරු කිරීමට කටයුතු කිරීම.

**දර්ශකය 15.1.1.** වන ආවරණය සමස්ත භූමි ප්‍රදේශයේ පංගුවක් ලෙස

**දර්ශකය 15.1.2.** ආරක්ෂිත ප්‍රදේශ හා පරිසර පද්ධති ආකාරය අනුව භෞතික හා මිරිදිය ජෛව විවිධත්වය සඳහා වන වැදගත් ස්ථාන ප්‍රමාණය

**ඉලක්කය 15.2** - 2020 වන විට සියලුම වර්ගවල වනාන්තර තිරසර අන්දමින් කළමනාරණය කිරීම ප්‍රවර්ධනය, වන විනාශය නැවැත්වීම, විනාශ වූ වනාන්තර යථා තත්ත්වයට පත්කිරීම සහ ජගත් මට්ටමින් වනරෝපණය සහ නැවත වන වගාව වර්ධනය කිරීම.

**දර්ශකය 15.2.1.** - තිරසර වනාන්තර කළමණාකරණය සම්බන්ධයෙන් වන ප්‍රගතිය

**ඉලක්කය 15.3** - 2030 වන විට කාන්තාරකරණය තුරන් කිරීම, කාන්තාරකරණය, නියඟය සහ ගංවතුර නිසා බලපෑමට ලක්වූ ඉඩම් ද ඇතුළුව විනාශයට පත් වූ ඉඩම් සහ පස නැවත යථා තත්ත්වයට පත්කිරීම සහ ඉඩම් විනාශයට පත් නොවන පරිසරයක් බිහි කර ගැනීම.

**දර්ශකය 15.3.1.** - සමස්ත භූමි ප්‍රමාණයෙන් හායනයට ලක්ව ඇති ප්‍රමාණය

**ඉලක්කය 15.a** - ජෛව විවිධත්වයන් සහ පරිසර පද්ධති සංරක්ෂණය කිරීමට සහ තිරසර අන්දමින් භාවිත කිරීමට සියලුම මූලාශ්‍රයන්ගෙන් මූල්‍ය ප්‍රතිපාදන රැස් කිරීමට උනන්දු කිරීම සහ කැපී පෙනෙන ලෙස වැඩි කිරීම.

**දර්ශකය 15.a.1.** - ජෛව විවිධත්වය සහ පරිසර පද්ධතීන් සංරක්ෂණය හා තිරසර භාවිතය සඳහා වන නිළ සංවර්ධන ආධාර සහ රාජ්‍ය වියදම්

**ඉලක්කය 15.b** - තිරසර ලෙස වනාන්තර කළමනාකරණය සඳහා සියලුම මූලාශ්‍රවලින් සියලුම මට්ටම්වලට කැපී පෙනෙන ලෙස සම්පත් ලබා දීම සහ සංවර්ධනය වෙමින් පවත්නා රටවලට වන සංරක්ෂණය සහ නැවත වන වගා කිරීම ඇතුළත්ව කළමනාකරණ කටයුතු සඳහා ප්‍රමාණවත් දිරිගැන්වීම් ලබා දීම.

**දර්ශකය 15.b.1.** - ජෛව විවිධත්වය සහ පරිසර පද්ධතීන් සංරක්ෂණය හා තිරසර භාවිතය සඳහා වන නිල සංවර්ධන ආධාර සහ රාජ්‍ය වියදම්

**අරමුණ 16 - තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයන් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබාදීම සහ සැම මට්ටමකම ඵලදායී වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩ නැඟීම. (Promote Peaceful and Inclusive Societies for Sustainable Development, Provide Access to Justice for All and Build Effective, Accountable and Inclusive Institutions at All Levels)**




ශක්තිමත් ප්‍රජාතන්ත්‍රවාදී සමාජයකට අවශ්‍ය නීතියේ ආධිපත්‍ය සහ යහපාලනය තහවුරු කිරීම, සියල්ලන්ගේ මානව හිමිකම් තහවුරු කිරීම සහ රටෙහි සියල්ල ඇතුලත් වූ හා සාධාරණ වර්ධනය සහ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම උදෙසා වන ශක්තිමත් ආයතන ගොඩ නැඟීම මෙම 16වන තිරසාර සංවර්ධන අරමුණ මඟින් ඉදිරිපත් කර තිබේ. මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් ඉලක්ක 12ක් සහ දර්ශක 23ක් ඉදිරිපත් කර ඇත.

**ඉලක්කය 16.1 -** සියලුම ස්ථානයන්හි සියලුම ආකාරයේ ප්‍රචණ්ඩත්වයන් සහ ඒ ආශ්‍රිත මරණ කැපී පෙනෙන ලෙස අඩු කිරීමට සෑම රටක්ම ක්‍රියා කිරීම.

**දර්ශකය 16.1.1.** - ස්ත්‍රී පුරුෂභාවය හා වයස අනුව ජනගහනයන් පුද්ගලයන් 10,000ක් අතරින් සියදිවි නසා ගැනීම්වලට ලක්වන සංඛ්‍යාව

**දර්ශකය 16.1.2. -** ස්ත්‍රී පුරුෂභාවය හා වයස අනුව ජනගහනයන් පුද්ගලයන් ලක්ෂයකට ගැටුම් හා සම්බන්ධ හේතු නිසා සිදුවන මරණ සංඛ්‍යාව

**දර්ශකය 16.1.3.** - පසුගිය මාස 12 තුළදී කායික, මානසික හෝ ලිංගික හිංසනයට ගොදුරු වූ ජනගහණයේ ප්‍රමාණය

**දර්ශකය 16.1.4.** - තමන් ජීවත් වන ප්‍රදේශයේ හුදෙකලාව ගමන්බිමන් යාම ආරක්ෂාකාරී බව සිතන ජනගහනයේ ප්‍රමාණය

**ඉලක්කය 16.2 -** ළමුන් කෲර වධහිංසා කිරීම්වලට සහ අපයෝජනයට, සූරාකෑමට, කුට්ටනයට සහ සියලුම ආකාරයේ ප්‍රචණ්ඩත්වයන්ට ලක් වීම අවසන් කිරීමට කටයුතු කළ යුතුය.

**දර්ශකය 16.2.1. -** පසුගිය මාසයක කාල සීමාව තුළදී සිටි රැකවලුන් අතින් කායික දඬුවම් හෝ මානසික ප්‍රචණ්ඩත්වයන් අත්විඳීමට සිදු වූ වයස අවුරුදු 1-17 දක්වා ළමුන්ගේ ප්‍රමාණය

**දර්ශකය 16.2.2.** - ස්ත්‍රී පුරුෂභාවය හා වයස සහ උපයෝජනයේ ස්වරූපය අනුව ජනගහනයේ පුද්ගලයන් 100,000 ක් අතරින් මිනිස් ජාවාරමෙහි ගොදුරු බවට පත්වූ පුද්ගලයින් සංඛ්‍යාව

**දර්ශකය 16.2.3.** - වයස අවු 18 වන විට ලිංගික හිංසනය අත්විඳ ඇති වයස අවු 18-29 වයස් කාණ්ඩයේ තරුණ කාන්තාවන් සහ පිරිමින්ගේ ප්‍රමාණය

**ඉලක්කය 16.3 -** සියලුම දෙනාට නීතියේ සාධාරණත්වය ලබා ගැනීමට හැකි වීම සහ ජාතික සහ අන්තර්ජාතික මට්ටමින් නීතියේ ආධිපත්‍ය ප්‍රවර්ධනය කිරීමට සෑම රටක්ම වගබලා ගැනීම.

**දර්ශකය 16.3.1.** - පසුගිය මාස 12ක කාලය තුළ හිංසනයට ලක්වූ අය අතරින් නිසි බලධාරීන්ගේ නිළ වශයෙන් පිළිගත් ගැටුම් සමථකරණ යාන්ත්‍රණයන් වෙත වාර්තා කරන ලද හිංසනයට ලක් වූ පුද්ගලයන් ප්‍රමාණයන්

**දර්ශකය 16.3.2.** - සමස්ත සිරකරුවන් සංඛ්‍යාවෙන් දඬුවම් නියම නොකළ රැඳවියන් ප්‍රමාණය

**ඉලක්කය 16.4 -** 2030 වන විට නීති විරෝධී මූල්‍ය සහ ආයුධ ප්‍රවාහයන් කැපී පෙනෙන ලෙස අඩු කිරීම, සොරකම් කරන ලද වත්කම් නැවත ලබාගැනීම ශක්තිමත් කිරීම සහ සියලුම ආකාරගේ සංවිධානාත්මක අපරාධ තුරන් කිරීමට පියවර ගත යුතුය.

**දර්ශකය 16.4.1.** - අභ්‍යන්තර හා බාහිර නීති විරෝධී මුදල් ගණනේ සමස්ත අගය (ඇමරිකානු ඩොලර් වශයෙන්)

**දර්ශකය 16.4.2** - ජාත්‍යන්තර ක්‍රමෝපායන්ට සමාන්තරව නිසි බලයලත් නිලධාරියෙකු විසින් හඳුනාගත් හෝ තහවුරු කරගත් අල්ලාගන්නා ලද සොයාගන්නා ලද හෝ බාරදෙන ලද නීති විරෝධී සම්භවයක් සහිත ආයුධ ප්‍රමාණය

**ඉලක්කය 16.5 -** සෑම රටක් විසින්ම අල්ලස් සහ දූෂණ කැපී පෙනෙන ලෙස අඩු කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය.

**දර්ශකය 16.5.1.** - පසුගිය මාස 12ක කාලය තුළ රාජ්‍ය නිලධාරියෙකුට අල්ලස් ලබා දෙන ලද හෝ රජයේ නිලධාරියකු විසින් අල්ලස් ඉල්ලා සිටි අවස්ථා පිළිබඳ අත්දැකීමකට මුහුණපාන ලද පුද්ගලයන්ගේ ප්‍රමාණය

**දර්ශකය 16.5.2.** - පසුගිය මාස 12ක කාලය තුළදී රාජ්‍ය නිලධාරියකු හට අල්ලස් ලබාදුන් හෝ රජයේ නිලධාරියෙකු විසින් අල්ලසක් ඉල්ලා සිටින ලද අවස්ථා පිළිබඳ අත්විඳීමට මුහුණදුන් ව්‍යාපාර ප්‍රමාණය

**ඉලක්කය 16.a** - අන්තර්ජාතික සහගයෝගීතාව ද ලබා ගෙන ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සහ ත්‍රස්තවාදය සහ අපරාධ තුරන් කිරීම සඳහා විශේෂයෙන්ම දියුණු වෙමින් පවත්නා රටවල් ද ඇතුළුව සියලුම මට්ටම්වලට අදාළ ජාතික ආයතනවල ධාරිතාවන් ශක්තිමත් කිරීමට පියවර ගත යුතුය.

**දර්ශකය 16.a.1** - පැරිස් මූලධර්මය හා අනුකූලව ස්වාධීන ජාතික මානව හිමිකම් ආයතනයන්හි පැවැත්ම

**අරමුණ 17 - ක්‍රියාවට නැංවීමේ ක්‍රම සවිමත් කිරීම සහ තිරසර සංවර්ධනය සඳහා වන ගෝලීය සහයෝගිතාවයේ පුනර්ජීවනය (Strengthen the Means of Implementation and Revitalize the Global Partnership for Sustainable Development)**




අරමුණු අතරින් අවසාන අරමුණ වන්නේ තිරසර සංවර්ධනය වෙනුවෙන් ක්‍රියාවට නැංවීමේ ක්‍රම සවිමත් කිරීම සහ තිරසර සංවර්ධනය සඳහා වන ගෝලීය සහයයෝගිතාවයේ පුනර්ජීවනය ඇති කිරීමයි. මූල්‍ය තාක්ෂණය, ධාරිතාවන් ගොඩ නැංවීම, වෙළඳාම සහ පද්ධතිමය කරුණු යන ක්ෂේත්‍ර ඔස්සේ මෙම අරමුණ වෙනුවෙන් වන අරමුණු ඉටු කර ගැනීම අපේක්ෂිතය. ඒ අනුව මෙම අරමුණ ළඟා කර ගැනීම සඳහා ඉලක්ක 19ක් සහ දර්ශක 25ක් ඉදිරිපත් කර තිබේ.

**ඉලක්කය 17.1** - බදු සහ වෙනත් ආදායම් එක්රැස් කිරීම් වර්ධනය කිරීම සඳහා සංවර්ධනය වෙමින් පවත්නා රටවලට අන්තර්ජාතික සහයෝගය ලබා දීම ඇතුළුව දේශීය සම්පත් සජීවීකරණය.

**දර්ශකය 17.1.1.** - මූලාශ්‍රය අනුව දළ දේශීය නිෂ්පාදනයෙන් පංගුවක් ලෙස සමස්ත රාජ්‍ය ආදායම

**දර්ශකය 17.1.2.** - දේශීය අයවැයෙන් දේශීය බදු ආදායමෙහි පංගුව

**ඉලක්කය 17.2** - සංවර්ධිත රටවල් තම දළ ජාතික අදායමෙන් 0.7%ක ප්‍රතිශතයක් නිල සංවර්ධන ආධාර ලෙස සංවර්ධනය වෙමින් පවත්නා රටවල් වලට ලබා දීමේ හා සංවර්ධිත රටවල දළ ජාතික ආදායමෙන් 0.15% සහ 0.20% අතර ප්‍රමාණයක් නිල සංවර්ධන ආධාර ලෙස අවම වශයෙන් සංවර්ධනය වූ රටවලට ලබාදීමට සංවර්ධිත රටවල් විසින් ලබා දී ඇති පොරොන්දුව සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම සහ අඩුම සංවර්ධිත රටවලට ලබාදෙන නිල සංවර්ධන ආධාර දළ ජාතික ආදායමෙන් 20%ක් දක්වා නැංවීම.

**දර්ශකය 17.2.1.** - ආර්ථික සහයෝගීතාවය සහ සංවර්ධනය (OECD) සංවර්ධන සහය කමිටු දායකයන්ගේ දළ ජාතික ආදායම (GNI)හි පංගුවක් ලෙස ඌන සංවර්ධිත රටවල් සඳහා ශුද්ධ නිළ සංවර්ධන ආධාර ප්‍රමාණය

**ඉලක්කය 17.3** - විවිධ මූලාශ්‍ර මඟින් සංවර්ධනය වෙමින් පවත්නා රටවල් වලට අතිරේක මූල්‍ය සම්පත් සජීවීකරණය.

**දර්ශකය 17.3.1.** - සමස්ත දේශීය අයවැයෙන් පංගුවක් ලෙස ඍජු විදෙස් ආයෝජන (FDI) නිල සංවර්ධන ආධාර සහ දකුණු සහයෝගය

**දර්ශකය 17.3.2.** - සමස්ත දළ දේශීය නිෂ්පාදනයේ පංගුවක් ලෙස

**ඉලක්කය 17.4** - මූල්‍ය ණය, ණය සහනාධාර සහ ණය ප්‍රතිව්‍යුහගතකරණය අරමුණු කර ගත් සම්බන්ධීකරණය කරන ලද ප්‍රතිපත්ති මඟින් සංවර්ධනය වෙමින් පවත්නා රටවල් වලට දිගුකාලීන ණය ස්ථාවරභාවය සඳහා සහය ලබා දීම සහ අතිශයින් ණයගැතිභාවයට පත් වී ඇති දරිද්‍රතාවයෙන් පෙළෙන රටවලට ණය ආතතිකාරී තත්ත්වයෙන් මිදීම සඳහා විසඳුම් ලබා දීම අරමුණයි.

**දර්ශකය 17.4.1.** - භාණ්ඩ සහ සේවා අපනයනයන්හි කොටසක් ලෙස ණය සේවා

**ඉලක්කය 17.12** - සංවර්ධනය වූ රටවල් විසින් අවම වශයෙන් සංවර්ධනය වූ රටවලින් සිදුකරන්නා වූ ආනයනයන් සඳහා බල පැවැත්වෙන භාණ්ඩ නිෂ්පාදනය කරන ලද ස්ථානය පිළිබඳ වරණීය නීති විනිවිදභාවයකින් යුක්ත බව සහ සරල හා වෙළඳපොළට පිවිසීමට දායකත්වය සලසන බව තහවුරු කරන බවට වූ ලෝක වෙළඳ සංවිධානයේ තීරණයන්ට අනුව අවම වශයෙන් සංවර්ධනය වූ රටවලට දිගුකාලීනව පවත්නා ලෙස බදුවලින් සහ කෝටාවලින් නිදහස්ව වෙළඳපොළට පිවිසීමේ හැකියාව නියමිත වේලාවට ක්‍රියාවට නැංවීම.

**දර්ශකය 17.12.1.** - සංවර්ධනය වෙමින් පවතින රටවල්, ඌන සංවර්ධිත රටවල් සහ සංවර්ධනය වෙමින් පවතින කුඩා දූපත් රාජ්‍යයන්.

**ඉලක්කය 17.19** - 2030 වන විට දැනට පවත්නා ක්‍රියාමාර්ග ද උපයෝගී කරගෙන දළ දේශීය නිෂ්පාදනයට අතිරේකව තිරසර සංවර්ධනයේ ප්‍රගතිය මැනීමට මිනුම් සංවර්ධනය කිරීම සහ සංවර්ධනය වෙමින් පවත්නා රටවල සංඛ්‍යාන ධාරිතාවන් ගොඩනැංවීමට සහගයෝගය ලබා දීම.

**දර්ශකය 17.19.1.** - සංවර්ධනය වෙමින් පවත්නා රටවල සංඛ්‍යා ලේඛනමය ධාරිතා සංවර්ධනය සඳහා ඇති සම්පත් ප්‍රමාණය ඩොලර් අගයෙන්

**දර්ශකය 17.19.2.(a)** - පසුගිය වසර 10ක කාලය තුළදී අඩු කරමින් එක් ජන හා නිවාස සංගණනයක් හෝ පවත්වා (b) 100%ක උපත් ලියාපදිංචි මට්ටමක් සහ 80%ක මරණ ලියාපදිංචි මට්ටමක් ළගා කරගෙන ඇති රටවල් ප්‍රමාණය

# දෙවන පරිච්ඡේදය

## 2.1 තිරසර සංවර්ධන අරමුණු සහ පුස්තකාල

අන්තර්ජාතික පුස්තකාල සංගම් සංවිධානය නිර්වචනය කරන පරිදි (IFLA) පුස්තකාලයක් යනු පරිශීලකයන්ගේ තොරතුරුමය, පර්යේෂණමය, අධ්‍යාපනික, සංස්කෘතිකමය හෝ විනෝදාත්මක අවශ්‍යතා තොරතුරු, සම්පත්, සේවා සහ පහසුකම් සම්පූර්ණ කර දෙනු ලබන ආයතනයකි. මෙම ආයතනවල අරමුණු අනුව, පාඨක ස්වරූපය අනුව, සේවා සැපයීම අනුව, පුස්තකාල සම්පත්වල සංයුතිය අනුව වර්ග කිහිපයකට බෙදා දැක්විය හැකිය. ජාතික පුස්තකාල, අධ්‍යාපන පුස්තකාල, මහජන පුස්තකාල, පාසල් පුස්තකාල, පර්යේෂණ හා විශේෂ පුස්තකාල හා වෙනත් පුස්තකාල වශයෙන් ඒවා වෙන්කොට දැක්විය හැකිය. IFLA ආයතනය අනුව ගෝලීය වශයෙන් මහජන පුස්තකාල 320,000ක් සහ පාර්ලිමේන්තු, ජාතික, විශ්වවිද්‍යාල, පර්යේෂණ, පාසැල් සහ විශේෂ පුස්කතාල වශයෙන් විවිධ වූ මිලියනයකට වඩා වැඩි පුස්තකාල සංඛ්‍යාවක් දක්නට ලැබෙන බව සඳහන් කරයි.

පුස්තකාලයක මුඛ්‍ය අරමුණ වන පාඨකයාට දැනුම හා තොරතුරු සැපයීම ඉටු කර ගැනීම සඳහා, දැනුම අත්පත් කර ගැනීම, එම අත්පත් කරගත් දැනුම සංවිධානය කිරීම, පාඨක සේවා සැපයීම, තොරතුරු සේවා පවත්වාගෙන යාම හා තොරතුරු සාක්ෂරතාවය වර්ධනය කිරීම, ව්‍යාප්ති සේවා සංවිධානය කිරීම, අනාගත පරපුර වෙනුවෙන් තොරතුරු සංරක්ෂණය කිරීම වැනි මූලික කාර්යයන් රැසක් පුස්තකාල විසින් ඉටු කරනු ලබයි.

IFLA සංවිධානයට අනුව පර්යේෂණ හා දැනුම, තොරතුරු සඳහා ප්‍රවේශ වීමට ඇති හැකියාව මූලික මිනිස් අයිතිවාසිකමක් වන අතරම රටක්, සංවිධානයක්, ආයතනයක් වශයෙන් තිරසර සංවර්ධන අරමුණු අත්පත් කර ගැනීමට නම් පළමුව කළ යුත්තේ පුළුල් පරිසරයක දැනුම හා තොරතුරු අත්පත් කර ගැනීමයි [IFLA affirmed that access to information is a fundamental human right and should not be taken with levity because information is key in the attaintment of sustainable development goals, IFLA (2018)]. එපමණකින් නොනැවතී නිරන්තරයෙන් යාවත්කාලීන වන තොරතුරු ද ඉක්මණින් ලබාගත යුතුය. ඒ සඳහා ඇති ආයතනය වන්නේ පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථානයි. තිරසර සංවර්ධන අරමුණු වෙත ළඟා වීමේදී තොරතුරු ප්‍රධාන වන බැවින් තොරතුරු සඳහා ඇති ප්‍රවේශය සැපයීම සුළු කොට තැකිය නොහැකිය.

බ්‍රැඩ්ලේ සහ IFLA සංවිධානය මඟින් 2010 වර්ෂයේදී සිදු කළ සමීක්ෂණයක් ඔස්සේ නූතන පුස්තකාල, සමාජයේ යහපැවැත්ම සඳහා ඉටු කරන කාර්යයන් ගණනාවක් දක්වා ඇත. සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීම, පුස්තකාල තුළ තිරසර සංවර්ධන කවුළුවක් පවත්වාගෙන යාම, තොරතුරු සඳහා නිදහසේ ප්‍රවේශ වීමට හැකියාව ලබාදීම, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT) වෙනුවෙන් ඩිජිටල් දායකත්වය සැපයීම, නවෝත්පාදනය දිරිමත් කිරීම, වර්තමාන හා අනාගත පරම්පරාවන් සඳහා ගෝලීය දැනුම සඳහා අවශ්‍ය ප්‍රවේශය සැපයීම, දත්ත ප්‍රවේශය සැපයීම, කාලගුණික වෙනස්වීම් පිළිබඳ තොරතුරු සම්බන්ධව මහජනතාවට ප්‍රවේශ වීමට අවශ්‍ය පර්යේෂණ හා දැනුම ලබා දීමට සහයෝගය ලබාදීම සහ දේශීය දැනුම සංරක්ෂණය කිරීම ඉන් කිහිපයකි. විශේෂයෙන්ම විවිධ ක්ෂේත්‍රයන්හි හා විවිධ සමාජ මට්ටම් නියෝජනය කරනු ලබන පාඨකයන් පුස්තකාලයාධිපතින් හට හමුවන බැවින් තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධ දැනුවත්භාවය ප්‍රවර්ධනය කිරීමට එමඟින් හැකියාව ලැබේ. ඒ අනුව තිරසර සංවර්ධන ඉලක්කවල පවතින වැදගත්භාවය හා අන්තර්ගතය ප්‍රවර්ධනය කිරීම පුස්තකාලයාධිපතිවරු සතු ප්‍රධාන වගකීමක් ලෙස සඳහන් කළ හැකිය.

තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු, සම්පත් සැපයීමේ දී පුස්තකාලය යනු තිරසර සංවර්ධන ඉලක්කවලින් ඉස්මතු කොට දක්වන විවිධාකාරයේ සංවර්ධන ගැටළු (ප්‍රජා සෞඛ්‍ය , අධ්‍යාපනය, සිවිල් හා මානව අයිතිවාසිකම් ප්‍රාදේශීය මට්ටමින් පවතින තොරතුරු ව්‍යාප්තිය, රාජ්‍ය අංශයේ වැඩසටහන් හා සේවා බෙදා හැරීම, දරිද්‍රතාවය) සඳහා අවශ්‍ය විසඳුම් පුස්තකාල වලින් බලාපොරොත්තු වන බව ද බෙන්සන් සහ තවත් අය විසින් 2016 සහ 2019 වර්ෂවල නයිජීරියාව ආශ්‍රිතව සිදු කරන ලද පර්යේෂණයකින් අනාවරණය කරගෙන තිබේ.

තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පුස්තකාල පද්ධතියට දායක විය හැකි ආකාර ගණනාවක් තිබේ. ප්‍රජාව දැනුවත් කිරීම වෙනුවෙන් තොරතුරු සේවා හඳුන්වා දිය හැකි අතර ඒ ඒ අරමුණු ආශ්‍රිත විෂයන්ට අදාළව සේවා සපයන විශේෂ පුස්තකාලවලට කටයුතු කළ හැකි ක්‍රම කිහිපයකි. විෂයට අදාළව ප්‍රකාශන අත්පත් කර ගැනීම, තොරතුරු සේවා සංවිධානය කිරීම, ව්‍යාප්ති සේවා සංවිධානය කිරීම සිදු කළ හැකිය. ඒ අනුව පුස්තකාල තිරසර සංවර්ධන අරමුණු වෙනුවෙන් කටයුතු කරන පාර්ශවකරුවෙකු (Stakeholder), සංවර්ධනයේ නියෝජිතයෙකු (Development Agents) ලෙස ද ක්‍රියා කරයි IFLA (2018).

## 2.2 තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමට පුස්තකාලවල දායකත්වය

තිරසර සංවර්ධන අරමුණු 17 ළඟා කර ගැනීමේ අරමුණින් විවිධ ක්‍රියාකාරකම්, වැඩසටහන් සහ ව්‍යාපෘති රැසක් පුස්තකාල විසින් සාර්ථකව ක්‍රියාත්මක කරගෙන යනු ලබයි. එවැනි කාර්යයන් පිළිබඳ නිදසුන් දේශීය හා විදේශීය වශයෙන් ගෙනහැර දැක්විය හැකිය.

### 01. සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගීබව අවසන් කිරීම.

පුස්තකාල විසින් තොරතුරු සහ කුසලතා සඳහා ප්‍රවේශය ලබා දීමෙන් පුද්ගලයන්ට තම ජීවිත වැඩි දියුණු කර ගැනීමට අවශ්‍ය අවස්ථා සපයා දීම සහ රජය විසින් තීන්දු තීරණ ගැනීමට අවශ්‍ය සහාය ලබා දීම, සෑම තැනකම සිටින මිනිසුන්ගේ සමෘද්ධිය ඇති කිරීමටත්, ප්‍රජාවන් සහ අනෙකුත් අය සඳහා වන දරිද්‍රතාවය අඩු කිරීමට සහාය සැපයීම වෙනුවෙන් ලබා දෙන දායකත්වය මෙම තිරසර සංවර්ධන අරමුණ හමුවේ සපුරා ගැනීමට අපේක්ෂා කෙරේ.

මෙම අරමුණ සපුරා ගැනීම වෙනුවෙන් ශ්‍රී ලංකාවේ නැණසල ව්‍යාපෘතිය හරහා ඊ-පුස්තකාල (e-library) සේවය රජයේ ද අනුග්‍රහය ඇතිව ආරම්භ කර තිබේ. ශ්‍රී ලංකාව පුරා ග්‍රාමීයව පිහිටි ප්‍රදේශ ආශ්‍රිතව එම මධ්‍යස්ථාන 300කට ආසන්න ප්‍රමාණයක් ස්ථාපිත කර තිබේ. ඉන් බලාපොරොත්තු වන ප්‍රමුඛතම අරමුණ වන්නේ ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ ඩිජිටල් සාක්ෂරතාවය ඉහළ නැංවීම සහ නව තාක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමයි.

### 02. සාගින්න නැති කර ආහාර සුරක්ෂිතතාව සහ යහපත් පෝෂණ තත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම

කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා ඔස්සේ බෝග වෙළඳපොළ පිළිබඳ දත්ත සහ ක්ෂේත්‍රය පිළිබඳ පර්යේෂණ කිරීමට අවශ්‍යය පසුබිම සකසා දීම සහ ඵලදායී කෘෂිකර්මාන්තයට සහාය වන ගොවිතැන් ක්‍රම පිළිබඳ අවබෝධයක් හා සහාය ලබා දීම මෙම අරමුණ යටතේ පුස්තකාල මඟින් අපේක්ෂා කෙරේ. 2011-2014 කාලපරිච්ඡේදයේ දී රුමේනියාව විසින් පුස්තකාලයාධිපතීන් වෙනුවෙන් කරන ලද නව අන්තර්ජාල හා පරිගණක සේවා සැපයීම මඟින් ගොවීන් 100,000 අධික පිරිසක් වෙත මිලියන 184කට අධික සහනාධාර ලබා ගැනීමට හැකි විය. තවද රුමේනියාවේ පිහිටි පුස්තකාල වල පුස්තකාලයාධිපතීන් 1000කට අධික සංඛ්‍යාවක් සහභාගි වූ පුහුණු වැඩසටහනකින් අනතුරුව, ගොවීන් වෙනුවෙන් එහි ඇති වටිනාකම තේරුම්ගත් පුස්තකාලයාධිපතිවරුන් නගරාධිපතිවරුන්ගේ ද සහය ඇතිව පුස්තකාල ආශ්‍රිතව කෘෂිකාර්මික තොරතුරු ව්‍යාප්ත කිරීමට තීරණය කර තිබේ. එම වැඩසටහන යටතේ ගොවීන් විසින් පුස්තකාලවල පවතින තාක්ෂණය භාවිත කරන ආකාරය ඉගෙනීමටත්, මූල්‍යමය කටයුතු වෙත ප්‍රවේශ වීමටත් ඒවා කඩිනමින් රජයට ඉදිරිපත් කිරීමටත් අවශ්‍ය නෛතික දැනුම ලබා ගෙන එමඟින් ඔවුන්ගේ කාලය සහ මුදල් ඉතිරිකර ගැනීමට ද හැකියාව ලැබී තිබෙන බව සිදු කළ පර්යේෂණයකින් අනාවරණය වේ.

විශේෂයෙන්ම ශ්‍රී ලංකාව පිළිබඳ සලකා බැලීමේ දී බහුතර ජනගහනයක් කෘෂිකර්මාන්තය තම ජීවනෝපාය කර ගත් ජීවන රටාවකට හුරුවී ඇත. ශ්‍රී ලංකාවේ ද ප්‍රාදේශීය මට්ටමින් පවා ව්‍යාප්තව පවතින මහජන පුස්තකාල ජාලයක් දක්නට ලැබෙන බැවින් ගොවීන්ට සහ ඒ ආශ්‍රිතව තම රැකියා කටයුතු සිදු කරගෙන යනු ලබන ජනතාවට වටිනා තොරතුරු හා දත්ත රැසක් කාලීනව ලබා දීමට හැකියාව ලැබේ.

**03. නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරීම.**

පුස්තකාල ක්ෂේත්‍රය හරහා මෙම අරමුණ ඉටු කර ගැනීම වෙනුවෙන් දායක විය හැකි බව සඳහන් කළ හැක. ඒ අනුව වෛද්‍ය විද්‍යාල පුස්තකාල, රෝහල් ආශ්‍රිතව ක්‍රියාත්මක වන පුස්තකාල හා සෞඛ්‍ය ක්ෂේත්‍රය හා සම්බන්ධ අනෙකුත් පුස්තකාල මේ ආශ්‍රිත පුස්තකාල කිහිපයක් ක්‍රියාත්මක වේ. එම පුස්තකාල හරහා මහජන සෞඛ්‍ය පද්ධතිය වැඩි දියුණු කිරීමට සහාය වන වෛද්‍ය පර්යේෂණ සඳහා මහජන සෞඛ්‍ය තොරතුරු ලබා ගැනීමටත් පුද්ගලයන්ගේ යහපත් සෞඛ්‍ය තත්වයන් හා එය පවත්වාගෙන යාම සම්බන්ධයෙන් දැනුවත් කිරීම පිළිබඳව මේ ආශ්‍රිත පුස්තකාල මගින් ඉටු කරනු ලබන ප්‍රමුඛ කාර්යයක් ලෙස හඳුනාගත හැකි වේ.

ගෝලීය කෝවිඩ්-19 වසංගත තත්වය හමුවේ පුස්තකාල වල විශේෂයෙන්ම තම පාඨකයන් හා සේවාදායකයන් වෙත පහසුකම්/සේවා සැපයීමේ දී විවිධ ක්‍රම අනුගමනය කරන ලදී. පුස්තකාල සේවා ඩිජිටල්කරණය කිරීම, දුරකථන මාර්ගයෙන් පාඨකයන් වෙත අවශ්‍ය තොරතුරු සොයා දීම, ඊ-තොරතුරු පද්ධති හඳුන්වා දීම හා ඒ වෙනුවෙන් නොමිලේ ප්‍රවේශ වීමට අවස්ථාව සලසා දීම, මාර්ගගත ක්‍රමයට තම පුස්තකාල සාමාජිකයන් කෝවිඩ්-19 රෝගී තත්වය සම්බන්ධයෙන් දැනුවත් කිරීම ආදී ක්‍රියාමාර්ග ගණනාවක් ඔස්සේ පුස්තකාල වල දායකත්වය දක්වන ලදී. ශ්‍රී ලංකාව තුළ මෙන්ම විදේශීය රටවල් වලට අයත් බොහෝ පුස්තකාල කෝවිඩ්-19 කාලවකවානුව තුළ අඛණ්ඩව තම සේවාව පවත්වාගෙන යාමට උත්සුක විය.

උදාහරණයක් ලෙස කිර්ජිස්ථානයෙහි (Kyrgyzstan) ක්ෂය රෝග වසංගත තත්වයක් ලෙස උත්සන්නව ව්‍යාප්ත වූ විට ජාතික ක්ෂය රෝග වැළැක්වීමේ සහ පාලනය කිරීමේ වැඩසටහනක් එම රජය යටතේ පිහිටවනු ලැබීය. රජයේ මෙම අරමුණ සපුරා ගැනීම වෙනුවෙන් කිර්ජිස්ථාන්හි මහජන පුස්තකාල, විවිධ සිවිල් සංවිධාන (HOPE සහ Red Cresent Society) සමග එක්ව "No to TB"නමින් කිර්ජිස්ථාන පුස්තකාල තොරතුරු සම්මුතියක් (Kyrgyzstan Libraries Information Consortium- KLIC) ආරම්භ කරන ලදී. ඒ යටතේ මහජන පුස්තකාල සම්බන්ධ කරගනිමින් ග්‍රාමීය පුස්තකාල 190ක් කේන්ද්‍ර කර ගනිමින් ක්ෂය රෝගය සම්බන්ධයෙන් පුද්ගලයන් 800ක් දැනුවත් කිරීම හා පුද්ගලයින් 5,600ක් සම්බන්ධ කර ගනිමින් මහජන සංවාදයක් ද පවත්වා තිබේ.

**04. පරිපූර්ණ, සාධාරණ, ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම.**

සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම වගකීම පැවරුණු ආයතන අතර මහජන පුස්තකාල පද්ධතියට විශේෂ තැනක් හිමිවේ.

ඉගෙනීම සඳහා අවශ්‍ය තොරතුරු, දැනුම සපයනු ලබන ප්‍රමුඛතම ආයතනය වන්නේ පුස්තකාලයයි. විශේෂයෙන්ම අධ්‍යාපනයේ අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීම උදෙසා පුස්තකාල විසින් විශාල දායකත්වයක් ලබා දේ. ඒ අනුව අධ්‍යාපනය ප්‍රවර්ධනය අරමුණු කර ගනිමින් ඒ වෙනුවෙන් වන අරමුණු වර්තමාන සමාජය දැනුම පාදක කරගත් සමාජයක් (Knowledge Based Society) වශයෙන් හඳුන්වනු ලබයි. පැරණි සමාජය තුළ පුද්ගලයින්ගේ කාර්යභාරය සරල වූ නමුත් අධ්‍යාපනය හා එහි වර්තමාන ප්‍රවණතා හේතුවෙන් පුද්ගලයා හා සමාජය තුළ පවතින දැනුම ඔස්සේ එම කාර්යභාරය තවදුරටත් සංකීර්ණ ස්වභාවයක් ගෙන තිබේ. කියවීම, සවන්දීම, නිරීක්ෂණය, විවේචනාත්මක චින්තනය හා මාධ්‍ය ඔස්සේ දැනුම තව දුරටත් තහවුරු වන අතරම ඕනෑම රටක පුස්තකාල පද්ධතිය හරහා කියවීම ප්‍රචලිත කිරීම ප්‍රධාන අරමුණක් කොටගෙන තිබේ. ඒ අනුව කියවීම ඔස්සේ ලබා ගන්නා අධ්‍යාපනයේ ගුණාත්මකභාවය රටක සමාජ සංවර්ධනයේ වැදගත් දර්ශකයන් ලෙස හඳුනාගත හැක. විශේෂයෙන් රටක මානව සංවර්ධන මට්ටම අවබෝධ කර ගැනීමේ දී අධ්‍යාපනය හා ඒ ආශ්‍රිත නිර්ණායකයන් මානව සංවර්ධන මිනුමක් ලෙස භාවිත කරයි. අධ්‍යාපන මට්ටම පිළිබඳ අවබෝධ කර ගැනීමේ දී එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් හඳුන්වා දුන් මානව සංවර්ධන දර්ශකය (Human Development Index-HDI) සඳහා සාක්ෂරතාවය යන සංරචකය භාවිතයට ගනී.

මූලිකවම සාක්ෂරතාව හරහා පුද්ගලයෙකුට කියවීමට හා ලිවීමට ඇති හැකියාව පිළිබඳ ගණනය කරනු ලබන අතර පුස්තකාල විසින් කියවීම ප්‍රවර්ධනය කිරීම උදෙසා විවිධ ක්‍රියාමාර්ග ගෙන තිබේ.

සාම්ප්‍රදායික කියවීම යන අර්ථ දැක්වීමට සීමා නොවී පරිගණක සාක්ෂරතාව, මූල්‍ය සාක්ෂරතාව, සංස්කෘතික සාක්ෂරතාව, මාධ්‍ය සාක්ෂරතාව, දෘෂ්‍ය සාක්ෂරතාව, ඩිජිටල් සාක්ෂරතාව වැනි වෙනස් පැතිකඩ රාශියක් උදෙසා පුස්තකාල මඟින් අවශ්‍ය සේවා හා පහසුකම් සලසා දෙනු ලබයි. උදාහරණයක් ලෙස ශ්‍රී ලංකාවේ ජන හා නිවාස සංගණනය 2012 අනුව වයස අවුරුදු 10ට වඩා වැඩි පුද්ගලයින්ගේ සාක්ෂරතාව 95.7%ක මට්ටමක පවතින බව අනාවරණය වී තිබේ. එමෙන්ම සාක්ෂරතා අනුපාතය පුරුෂ 96.9%ක් සහ ස්ත්‍රී 94.6%ක් වේ. ඒ අනුව සාක්ෂරතාව සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ රටවල් අතරින් ඉහළ ස්ථානයක් හිමිකරගෙන තිබේ. විශේෂයෙන්ම මෙම තිරසර සංවර්ධන අරමුණු ඔස්සේ 4.6.1 ගෝලීය දර්ශකය (ස්ත්‍රී පුරුෂභාවය අනුව කිසියම් වයස් කාණ්ඩයකට අදාළ a.සාක්ෂරතා b.සංඛ්‍යානමය කාර්යය කුසලතාවයන් අත්පත්කරගෙන සිටින ජනගහනයේ ප්‍රමාණය) මඟින් සාක්ෂරතා මට්ටම නිර්ණය කිරීම අපේක්ෂා කරයි.

පුස්තකාල මඟින් සාක්ෂරතා ප්‍රවර්ධන වැඩසටහන් ඉගෙනීම සඳහා ආරක්ෂිත ස්ථානයක් වශයෙන් කටයුතු කිරීම තම දැනුම වර්ධනය කිරීම වෙනුවෙන් පර්යේෂකයන්ට අවශ්‍යය තොරතුරු හා දත්ත ලබා දෙමින් සහයෝගය ලබා දීම ඔස්සේ මෙම අරමුණ සාර්ථකව ඉටු කර ගැනීම හා ළඟා කර ගැනීම වෙනුවෙන් පුස්තකාල විසින් දායකත්වය ලබා දෙන ස්වභාවයක් හඳුනාගත හැක.

අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය වශයෙන් ක්‍රියාත්මක වන පාසල්, විශ්වවිද්‍යාල හා වෙනත් උසස් අධ්‍යාපනික ආයතන ඇතුළු තවත් අධ්‍යාපනය හා සම්බන්ධ ආයතන ආශ්‍රිතව පුස්තකාල පිහිටුවා ඇති අතර එමඟින් දැනුම වර්ධනය හා බෙදා ගැනීම වෙනුවෙන් පුස්තකාල විසින් විශාල කාර්යභාරයක් ඉටු කරනු ලබයි. එමඟින් සිවුවන අරමුණ හා සම්බන්ධ 4.3 ඉලක්කය වන 2030 වන විට සියලුම කාන්තාවන්ට සහ පිරිමින්ට ගුණාත්මක වශයෙන් ඉහළ සහ අඩු මුදලකට ලබා ගත හැකි විශ්ව විද්‍යාල අධ්‍යාපනය ද ඇතුළත්ව තාක්ෂණික, වෘත්තීය හා තෘතීක අධ්‍යාපනය ලබා ගැනීමට හැකි වීම ළඟා කර ගැනීමට අවශ්‍ය දායකත්වය ලබා දෙයි.

උදාහරණයක් ලෙස ස්විඩනයේ මල්මෝ නාගරික පුස්තකාලය (Malmo City Library) හරහා සමාජ සාමාජිකකරණය (Social Inclusion) හා තිරසර බව ඇති කිරීමේ සහ ඩිජිටල්කරණය නව මාවතකට යොමු කිරීම දිරිමත් කිරීමට කටයුතු කරනු ලබයි. එම පුස්තකාලයෙහි ක්‍රියාත්මක වන පුස්තකාල ඉගෙනුම් මධ්‍යස්ථානය ඔස්සේ "Get Started" නමින් ඩිජිටල්කරණය පිළිබඳ පාඨමාලා කිහිපයක් ආරම්භ කර ඇති අතර එමඟින් පාඨමාලාලාභීන් වෙත ඊ-මේල් ගිණුමක් ආරම්භ කිරීම, පවත්වාගෙන යාම, අන්තර්ජාලය වඩා හොඳින් හැසිරවීමට සහ ඒ ආශ්‍රිත තොරතුරු සැලසුම්කරණය පිළිබඳ දැනුම ලබා දීමට පියවර ගෙන තිබේ.

**05. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ළඟා කර සියලු කාන්තාවන්ට සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම.**

ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සුරැකීම හරහා වයස අවුරුදු 15ට වැඩි කාන්තාවන් සහ පුරුෂයන් සඳහා ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යාරක්ෂණය, තොරතුරු හා අධ්‍යාපනය සඳහා පූර්ණ සහ සමාන ප්‍රවේශයන් සුරක්ෂිත කරන නීති හා නිගමනය කරනු ලබන රටවල් 5.6.2 ගෝලීය දර්ශකය ශක්තිමත් කෙරේ. මේ ඔස්සේ විශේෂයෙන්ම පුස්තකාල හරහා තොරතුරු හා අධ්‍යාපනය සඳහා පූර්ණ හා සමාන ප්‍රවේශයන් සුරක්ෂිත කිරීම සිදු කරයි.

කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා විශේෂයෙන්ම තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය ඇතුළත්ව තාක්ෂණය ලබා ගැනීම සඳහා සාධනීය අවස්ථාවන් ලබාදීම යටතේ පුස්තකාල විසින් විවිධ ක්‍රියාමාර්ග වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබේ. උදාහරණයක් ලෙස නේපාලයේ තොරතුරු හා සම්පත් මධ්‍යස්ථාන (READ – Rural Education and Development) ආශ්‍රිත පුස්තකාල මඟින් කාන්තාවන්ගේ අයිතිවාසිකම් හා ඔවුන්ගේ ජීවන තත්වය උසස් කරලීමේ අරමුණින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරයි. ඒ යටතේ කාන්තා අයිතිවාසිකම්, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය, සෞඛ්‍යය, ප්‍රචණ්ඩත්වය සහ කාන්තාවන් වෙනුවෙන් බලපානු ලබන වෙනත් ගැටලු පිළිබඳ සම්මන්ත්‍රණ හා වැඩමුළු සංවිධානය කරනු ලබයි.

එරට පුස්තකාල මගින් කාන්තා කණ්ඩායම්හි (Women's Group) සාමාජිකත්වය ලබා ගැනීම වෙනුවෙන් දිරිමත් කරන අතර එම කාණ්ඩායම් වල සාමාජිකයින් මසකට වරක් මුණගැසී ඔවුන්ගේ අදහස් සාකච්ඡා කිරීම වෙනුවෙන් පුස්තකාලයෙහි වෙනම ස්ථානයක් වෙන්කොට තිබේ. මෙම READ මධ්‍යස්ථාන හරහා විවිධ ප්‍රායෝගික පාඨමාලා සහ සාක්ෂරතාව, සංඛ්‍යාත්මක දැනුම, ඉංග්‍රීසි භාෂාව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, ව්‍යවසායකත්ව හැකියාව සහ විකිණීම සඳහා විවිධ භාණ්ඩ සෑදීමේ පාඨමාලා ක්‍රියාත්මක කරයි. ඊට අමතරව නේපාලය පුරා පිහිටි මෙම මධ්‍යස්ථාන ඔස්සේ ජීවන කුසලතා, සෞඛ්‍ය, ඩිජිටල් සාක්ෂරතාව හා තාක්ෂණය සම්බන්ධ පුහුණු වැඩසටහන් ද ක්‍රියාත්මක කරයි.

තවද 5b ඉලක්කය ළඟා කර ගැනීම වෙනුවෙන් උගන්ඩා ජාතික පුස්තකාලය මගින් කාන්තා ගොවීන් වෙනුවෙන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ වැඩසටහන් නිර්මාණය කර තිබෙන අතර ඒ ඔස්සේ කෘෂිකර්මාන්තයේ දී අවශ්‍ය වන කාලගුණ අනාවැකි, බීජවල මිල, මාර්ගගත වෙළඳපොළ (Online Markets) පිළිබඳ දේශීය භාෂාව ආශ්‍රයෙන් තොරතුරු ලබා දෙයි. මෙම වැඩසටහන ඔස්සේ තාක්ෂණික හැකියාවන් හරහා කාන්තාවගේ ආර්ථික යහපැවැත්ම (Economic well-being) වර්ධනය කිරීම බලාපොරොත්තු වේ.

**07. සැමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබා ගැනීම සහ ඒවායේ තිරසර කළමනාකරණය සහතික කිරීම.**

මේ යටතේ සනීපාරක්ෂාව බලශක්ති භාවිතයන් සහ ජලය පිළිබඳ තොරතුරු සඳහා ප්‍රවේශ වීමට අවශ්‍ය සහය පුස්තකාල මගින් ලබාදීම අපේක්ෂා කරයි. 6a. ඉලක්කය වන 2030 වන විට ජලය එක්රැස් කිරීම, පිරිපහදු කිරීම, ජලය කාර්යක්ෂමව භාවිත කිරීම, අප ජලය පිරිසිදු කිරීම, ප්‍රතිචක්‍රීකරණය නැවත භාවිත කිරීම සඳහා තාක්ෂණය ද ඇතුළත්ව ජලය හා සනීපාරක්ෂක පහසුකම් පිළිබඳ වැඩසටහන් හා ක්‍රියාකාරකම් සඳහා සංවර්ධනය වෙමින් පවත්නා රටවලට ලබා දෙන අන්තර්ජාතික සහයෝගීතාව සහ ධාරිතාවන් ශක්තිමත් කිරීමේ සහයෝගය ඉහළ නැංවීම සපුරා ගැනීමට අපේක්ෂා කෙරේ. ඒ වෙනුවෙන් පුස්තකාල මඟින් අවශ්‍ය වැඩසටහන් හා ක්‍රියාකාරකම් සංවිධානය කිරීම සිදු කළ හැක.

6b. ඉලක්කය වන ජලය හා සනීපාරක්ෂක කටයුතු කළමනාකරණයේ දී ප්‍රාදේශීය ප්‍රජාවගේ සහභාගීත්වය දිරි ගැන්වීම සහ සහය ලබා දීමට හොන්ඩුයුරාස්හි සෑන් ජුආන් ප්ලෙන්ස් ප්‍රජා පුස්තකාලය (San Juan Planes Commiunity Library) මඟින් එහි ප්‍රජාව වෙත ආරක්ෂිත පානීය ජලය ලබා දීම වෙනුවෙන් ප්‍රමුඛ කාර්යයක් ඉටුකර තිබේ. එම පුස්තකාලයෙහි මූලිකත්වයෙන් නගර චතුරශ්‍ර මධ්‍යයෙහි පානීය ජලය ලබා දීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර තිබේ. විශේෂයෙන්ම ශ්‍රී ලංකාව පිළිබඳ සළකා බලන විට දිවයින පුරා ව්‍යාප්තව පවතින මහජන පුස්තකාල පද්ධතිය මඟින් තම පාඨකයන්ට අවශ්‍ය ආරක්ෂිත පානීය ජලය පුස්තකාල පරිසරය තුළදීම ලබා දීමට කටයුතු කර තිබේ. ආරක්ෂිත ක්‍රමවේදයක් තුළින් තිරසර කළමනාකාරීත්වයක් යටතේ විවිධ රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන සමග එක්ව පුස්තකාලවලින් ජලය හිඟ ප්‍රදේශවල නව ජල සැපයුම් ව්‍යාපෘති සහ යෝජනා ක්‍රම ආරම්භ කිරීමට මූලිකත්වය ගැනීම, ජල පෝෂක ප්‍රදේශ ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීම පිළිබඳ වැඩසටහන් පැවැත්වීම, ජල සැපයුමෙහි ආරක්ෂාව තහවුරු කිරීමට ජංගම විද්‍යාගාර මධ්‍යස්ථාන පුස්තකාල ආශ්‍රිතව පිහිටුවා ගැනීම සහ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වැනි ක්‍රියාකාරකම් සහ වැඩසටහන් රැසක් මෙම අරමුණ ළඟා කර ගැනීම වෙනුවෙන් සිදු කරනු ලබයි.

**07. සියල්ලන් සඳහා දැරිය හැකි විශ්වාසනීය තිරසර සහ නවීන බලශක්ති සැපයුම සහතික කිරීම**

මෙම අරමුණ ඔස්සේ ගෝලීය වශයෙන් බලශක්ති කාර්යක්ෂමතාවය වර්ධනය කිරීමට සහ පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගේ (Renewable Energy Sources) භාවිතය ප්‍රවර්ධනය කිරීම බලාපොරොත්තු වේ. තවද බලශක්තිය ලබා ගැනීමේ හැකියාව මත දරිද්‍රතාවය තුරන් කිරීම, සෞඛ්‍ය තත්වය ඉහළ නැංවීම, අධ්‍යාපනය, ජල සැපයුම, කාර්මීකරණය සහ දේශගුණික විපර්යාස කළමනාකරණය යන අනෙකුත් තිරසර සංවර්ධන අරමුණු රඳා පවතී. එබැවින් මෙම තිරසර සංවර්ධන අරමුණ ළඟා කර ගැනීම වෙනුවෙන් පුස්තකාල මඟින් සැලකිය යුතු දායකත්වයක් ලබා දිය යුතුය.

ලෝකයේ බොහෝ මහජන හා ප්‍රජා පුස්තකාල මිනිස්සුන්ට කියවීමට, අධ්‍යයනය කිරීමට, ආලෝකය ලබා ගැනීම සඳහා විශ්වාසනීය ප්‍රවේශයක් ලබා ගත හැකි ස්ථානයක් ලෙස කටයුතු කරයි. මේ යටතේ වන 7.1 ඉලක්කය, එනම් 2030 වන විට සියලු දෙනාටම අඩු මිලකට ලබාගත හැකි විශ්වාසදායී නවීන බලශක්ති මූලාශ්‍ර වලට ප්‍රවේශ විය හැකි බව තහවුරු කර තිබේ.

7.2 ඉලක්කය යටතේ, 2030 වර්ෂය වන විට බලශක්ති මූලාශ්‍රයන්හි පුනර්ජනනීය බලශක්ති කොටස ඉහළ නැංවීමට බලාපොරොත්තු වේ. ඒ වෙනුවෙන් පුස්තකාල සතු කාර්යභාරය සැලකීමේ දී පුස්තකාල පරිශ්‍රය තුළ මෙන්ම ප්‍රාදේශීයව ද ඉතා සාර්ථකව ක්‍රියාත්මක කළ හැකි පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් ආශ්‍රයෙන්, විශේෂයෙන්ම සූර්ය බලශක්තිය පදනම් කර ගනිමින් සූර්ය පැනල (Solar Panels) සවිකොට පුස්තකාලය සඳහා අවශ්‍ය බලශක්තිය ලබා ගැනීමේ හැකියාව පවතී. ඊට අමතරව පුස්තකාල ආශ්‍රිතව බලශක්ති භාවිතය අවම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම, ප්‍රමාණවත් පරිදි සූර්යාලෝකය ලැබෙන ආකාරයට පුස්තකාලය අභ්‍යන්තර සැලැස්ම සකස් කිරීම, පාරිසරික හානිය අවම කිරීමට අවශ්‍ය ගැලපීම් සිදු කිරීම, පුනර්ජනනීය බලශක්ති භාවිතයේ ඇති වැදගත්කම සහ බලශක්තිය කාර්යක්ෂමව භාවිත කිරීමේ ඇති අවශ්‍යතාවය සම්බන්ධයෙන් ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන්, ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් සංවිධානය කිරීම වැනි කටයුතු රැසක් ඉටු කළ හැකි වේ.

**08. සියල්ලන් සඳහාම පෝෂිත පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය පූර්ණ ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම**.

මෙම අරමුණ මගින් අපේක්ෂා කෙරෙන්නේ සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය පූර්ණ ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීමයි. මෙම අරමුණ වෙනුවෙන් පුස්තකාල මගින් තම පාඨකයන්ට සහ ප්‍රජාව වෙත විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ඔස්සේ තම දායකත්වය ලබා දිය හැකි වේ.

8.5 ඉලක්කය යටතේ 2030 වන විට අබාධිත පුද්ගලයන් සහ යෞවනයන් ද ඇතුළත්ව සියලුම කාන්තාවන් සහ පිරිමින් සඳහා ඵලදායී හා ගැළපෙන රැකියා අවස්ථා ලබා දීම සහ 8.6 ඉලක්කය වෙනුවෙන් 2030 වන විට අධ්‍යාපනය නොලබන, පුහුණුවක් නොලබන රැකියාවක් නොමැති යෞවනයන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමින් අඩු කිරීම යන ඉලක්කයන් මෙම අරමුණ ඔස්සේ ළඟා කර ගැනීමට අපේක්ෂා කරන අතර ඒ වෙනුවෙන් පුස්තකාල මගින් විවිධ අවස්ථා සලසා දිය හැක. උදාහරණ ලෙස කොළඹ මහජන පුස්තකාලය මගින් කොළඹ සහ ඊට තදාසන්න ප්‍රදේශවල ජීවත් වන පහළ ආදායම් ලබන ප්‍රජාවගේ විශේෂයෙන්ම කාන්තාවන්ගේ ජීවන තත්ත්වය වර්ධනය කිරීමේ අරමුණින් 2019 වර්ෂයේ ලෝක කාන්තා දිනය වෙනුවෙන් "ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධන වැඩසටහන" (Entrepreneurial Skills Development Programme) ආරම්භ කර තිබේ. ඒ යටතේ කාන්තාවන් වෙනුවෙන් ව්‍යාපාර හැකියා සංවර්ධන පාඨමාලා සඳහා සහභාගීවන්නන්ගේ කැමැත්ත හා අවශ්‍යතාවය පරිදි Small Enterprise Development Division (SED) යටතේ ලියාපදිංචි වී ඔවුන්ගේම නව ව්‍යාපාර ආරම්භ කිරීමට අවශ්‍ය දායකත්වය ලබාදීම සිදු කරයි. තවද රැකියා සඳහා අයදුම් කිරීමේ දී පුස්තකාල මගින් ඊට අවශ්‍ය තොරතුරු සහ පුහුණු අවස්ථා සලසා දීම මෙන්ම පුහුණු පුස්තකාල කාර්යමණ්ඩලයක් හරහා මාර්ගගත ආකාරයට අයදුම්පත් ඉදිරිපත් කිරීම, ගැළපෙන රැකියාවක් තෝරා ගැනීමට සහාය වීම සිදු කර තිබේ. උදාහරණයක් ලෙස යුරෝපීය සංගමය මගින් සෑම වර්ෂයකම එම සංගමය යටතේ වන මහජන පුස්තකාල හරහා රැකියා 25,0000කට ආසන්න ප්‍රමාණයක් මහජනතාව වෙත සොයා දෙනු ලබයි. රැකියාවන් ආශ්‍රිත ගැටළු පවතින යුරෝපීයන් මිලියන 4.1කට ආසන්න පිරිසකට එම ගැටළු විසඳා ගැනීමට සහාය වීම හා මිලියන 1.5කට ආසන්න යුරෝපීයන් ප්‍රමාණයකට නව රැකියා සඳහා අයදුම් කිරීම සඳහා එම මහජන පුස්තකාල මගින් සහාය වී ඇත.

**09. සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරි ගැන්වීම.**

මේ ඔස්සේ ප්‍රධාන වශයෙන් කුඩා ව්‍යාපාර, යටිතල පහසුකම් සහ කාර්මික සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කරයි. රටක නිෂ්පාදන අංශය එම රටේ ආර්ථික හා සමාජීය සංවර්ධනයේ ප්‍රධාන උත්ප්‍රේරක කාර්යභාරයක් ඉටු කරයි.

කර්මාන්තවලට අවශ්‍ය විද්‍යාත්මක පර්යේෂණ කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම සහ තාක්ෂණික දියුණුව ලබා දීමට අවශ්‍ය සහාය පුස්තකාල මඟින් ලබා දිය හැකිය. විශේෂයෙන්ම අධිවේගී අන්තර්ජාතික පහසුකම් ලබා දීම හා නවතම පර්යේෂණ හා නවෝත්පාදන කටයුතු සිදු කිරීමට අවශ්‍ය තොරතුරු, දැනුම ලබාදීම අපේක්ෂා කෙරේ. බොහෝ රටවල අවම ගාස්තුවක් හෝ අය නොකර මහජනතාවට අන්තර්ජාල පහසුකම් ලබා දෙනු ලබන ප්‍රමුඛතම හෝ එකම ආයතනය වන්නේ මහජන හෝ අධ්‍යාපනික පුස්තකාලයයි.

මෙම අරමුණ ළඟා කර ගැනීම සඳහා ලෝකයේ බොහෝ රටවලට අයත් මහජන හා අධ්‍යාපනික පර්යේෂණ පුස්තකාල මඟින් විවිධ ක්‍රියාමාර්ග ගනිමින් තම දායකත්වය ලබා දී තිබේ.

9.4 ඉලක්කය වන 2030 වන විට යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සහ කර්මාන්ත තිරසර කිරීම සඳහා නව තාක්ෂණය මඟින් සංවර්ධනය කිරීම, කර්මාන්ත ක්‍රියාවලියේ දී සම්පත් කාර්යක්ෂම ආකාරයට භාවිත කිරීම, වැඩි දියුණු කිරීම හා පිරිසිදු සහ පරිසරයට සුදුසු ගුණාත්මකභාවයෙන් ඉහළ තාක්ෂණයන් උපයෝගී කර ගැනීමට සියලුම රටවල් ඔවුන්ට පවත්නා ධාරිතාවන් අනුව මේ සම්බන්ධයෙන් පියවර ගැනීම වෙනුවෙන් බොහෝ පුස්තකාල තම දායකත්වය ලබා දී තිබේ. උදාහරණයක් ලෙස 2014 වර්ෂයේ දී ඕස්ට්‍රේලියාවේ එළිදක්වන ලද වාර්තාවක් මඟින් සොයා ගනු ලැබුවේ සෞඛ්‍ය ක්ෂේත්‍රය හා සම්බන්ධ රෝහල්, රාජ්‍ය දෙපාර්තමේන්තු, සංගම් සහ වෙනත් සංවිධාන විසින් ආයෝජනය කරනු ලබන සෑම ඩොලරයක්ම නැවත ඕස්ට්‍රේලියානු ඩොලර් 05ක (AUD $5) මුදලක් ප්‍රතිලාභයක් ලෙස නැවත ලැබුණු බවයි.

තවද ෆින්ලන්ත ජාතික පුස්තකාලය මඟින් පවත්වාගෙන යනු ලබන Open Science Lab හරහා පර්යේෂණ ප්‍රකාශන, පර්යේෂණ දත්ත සහ පර්යේෂණවලදී භාවිත කරනු ලබන ක්‍රමවේදයන් සම්බන්ධව සියලු දෙනා වෙත ප්‍රවේශ පහසුකම් ලබා දී තිබේ. ඊට අමතරව මෙම අරමුණ ඉටු කර ගැනීම වෙනුවෙන් පුස්තකාල මඟින් විවිධ සංවිධාන, සාකච්ඡා සහ සම්මන්ත්‍රණ සංවිධානය කරනු ලබයි. බටහිර කෙන්යාව සහ උගන්ඩාව යන රාජ්‍යයන් විසින් මෙවැනි වැඩසටහන් සංවිධානය කර තිබේ.

**10. රටවල් තුළ සහ ඒවා අතර අසමානතාවය අවම කිරීම.**

ආර්ථික, සමාජීය හා පාරිසරික සංවර්ධනයක් වෙනුවෙන් පුස්තකාල පද්ධතිය හරහා ලබා දෙන දායකත්වය සුවිශේෂී වේ. තොරතුරු සඳහා සමාන ප්‍රවේශයක් ලබාදීම, අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය, සංවිධානය හා රැස්වීමේ නිදහස, පුද්ගලයන්ගේ ස්වාධීනත්වය සුරකින ආයතනයක් ලෙස පුස්තකාල කටයුතු කරයි. ඒ අනුව ගෝලීය වශයෙන් ව්‍යාප්තව ඇති ග්‍රාමීය සහ නාගරික ප්‍රදේශවල පිහිටි පුස්තකාල මඟින් ආරක්ෂක සහ සිවිල් අවකාශයක් අසමානතාවලින් තොරව ගොඩනැඟීමට පුස්තකාල මඟින් දායකත්වය ලබා දෙයි.

සංවර්ධිත සහ සංවර්ධනය වෙමින් පවතින රටවල බොහෝ වශයෙන් විවිධ අසමානතාවයන් හඳුනාගත හැකි වේ. පාරිසරික හායනය, දරිද්‍රතාවය, දීර්ඝකාලීන විරැකියා තත්ත්වයන්, ගැටුම්, ප්‍රචණ්ඩත්වය, දේශපාලනික අස්ථාවරත්වය සහ ආයතනික වශයෙන් ඇති වන ගැටලු හරහා මෙම විවිධ අසමානතාවයන් ඇති වේ. මෙම තත්ත්වය අවම කිරීම උදෙසා පුස්තකාල මඟින් සියලු පුරවැසියන්ට සමාන ආකාරයෙන් පුස්තකාල සේවා සැපයිය හැක.

10.7 ඉලක්කයවන මනාව කළමනාකරණය කරන ලද සහ සැලසුම් කරන ලද ආකාරයට සංක්‍රමණ කටයුතු ක්‍රියාවට නැංවීමද ඇතුළත්ව වගවීමෙන් යුක්තව, මනාව සංවිධානගතව, ආරක්ෂාකාරීව, ජනතාවට අවශ්‍ය ස්ථාන කරා යාමට සහ සංක්‍රමණය වීමේ පහසුකම් සැලසීම සඳහා පුස්තකාල විසින් විවිධ වැඩසටහන් හා ක්‍රියාමාර්ග ගෙන තිබේ.

ඊට උදාහරණ ලෙස ඇමරිකාවේ පිහිටා ඇති ක්වීන්ස් පුස්තකාලය (Queens Library) මඟින් නව ඇමරිකානු වැඩසටහන (New America Programme) නමින් ඇමරිකා එක්සත්ජනපදයෙහි පදිංචියට පැමිණි නව සංක්‍රමණිකයන් වෙත ඉංග්‍රීසි භාෂා පුහුණු වැඩසටහන් ක්‍රියාකාරකම් සහ තොරතුරු ලබාදීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. ඊට අමතරව හාර්ට්ෆෝඩ්හි සංස්කෘතික වටිනාකම් සහ සිවිල් වටිනාකම් සම්බන්ධයෙන් නව සංක්‍රමණිකයන් වෙත හඳුන්වාදීමේ වැඩසටහන් සංවිධානය කර තිබේ.

කැනඩාවෙහි ටොරොන්ටෝ මහජන පුස්තකාලය (Toronto Public Library) මඟින් එහි නව පදිංචිකරුවන් වෙත නව පදිංචි කිරීමේ සේවාවන් හඳුන්වා දී තිබේ. ඒ යටතේ නීතිමය, ළමා රැකවරණය, නිවාස, සෞඛ්‍ය, අධ්‍යාපනය යන අංශ කෙරෙහි අවධානය සහ සහය ලබා දෙනු ලබයි. දෘෂ්‍යාබාධිත හා ඒ ආශ්‍රිත රෝග තත්වයන්ගෙන් පසුවන ජනතාව වෙත පුස්තකාල පහසුකම් සැපයීමේ දී ඔවුන්ට ගැටළුවක් ඇති නොවන පරිදි අනෙක් පුස්තකාල පාඨකයන් සඳහා මෙන් සාමාන්‍ය සේවා සහ පහසුකම් ලබා දීමට පුස්තකාල මඟින් කටයුතු කරයි. ශ්‍රී ලංකාවේ ජාතික පුස්තකාලය මඟින් දෘශ්‍යාබාධිත පාඨකයන් හා සාමාජිකයන් වෙනුවෙන් කථන පොත් (Talking books), බ්‍රේල් මාධ්‍ය පොත් සහ තොරතුරු ගවේෂණ මූලාශ්‍ර සහ සේවා සැපයීම සිදු කරයි. ඒ ඔස්සේ දෘෂ්‍යාබාධිත පුද්ගලයන් වෙනුවෙන් වන අයිතිවාසිකම් සුරැකීමට කටයුතු කරයි.

**11. නගර සහ ජනාවාස පරිපූර්ණ ආරක්ෂිත සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම.**

මෙහි අරමුණ වන්නේ  ආපදා හා දේශගුණික විපර්යාස තත්ත්වයන් සමඟ සාර්ථකව කටයුතු කිරීමේ දී නිවාස, ප්‍රවාහන, පොදු ස්ථාන සහ නාගරික පරිසරය ක්‍රමානුකූලව සකස් කිරීමයි. අනාගත පරම්පරාවන් වෙනුවෙන් මිල කළ නොහැකි වටිනාකමකින් යුත් ඕනෑම ආකාරයක ලේඛන උරුමය ආරක්ෂා කිරීම හා සංරක්ෂණය කිරීම ද මීට අයත්ය.

11.4 ඉලක්කය වන ලෝකයේ ස්වභාවික සහ සංස්කෘතික උරුමයන් රැක ගැනීම හා ආරක්ෂා කර ගැනීම සඳහා වූ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම වෙනුවෙන් පුස්තකාල කැපී පෙනෙන දායකත්වයක් ලබා දෙයි.

තිරසර නාගරික සංවර්ධනයේ දී ප්‍රවාහන ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම මඟින් ජනතාව දැනුවත් කිරීම අරමුණු කර ගෙන 2015 වර්ෂයේ දී පළමු චීනයේ බීජිං උමං පුස්තකාලය (M' Subway-Library) එම දුම්රිය ස්ථානයේ විවෘත කර ඇත. මෙම පුස්තකාල ඔස්සේ මඟින් පාඨකයන් ලෙසත් (Passengers are readers), පාඨකයන් මඟින්ලෙසත් (Readers are Passengers) සහ සියලු දෙනා වෙනුවෙන් වන කියවීමේ නැවතුම්පළක් (Reading Station for Everyone) ලෙස අර්ථ ගන්වා ඇත. කිසිදු අය කිරීමකින් තොරව ඊ-පොත් බාගත කිරීමේ හැකියාව, සාම්ප්‍රදායික සංස්කෘතිය පවත්වාගෙන යාම සහ ප්‍රවර්ධනය කිරීම, ජනතාවගේ කියවීම ප්‍රවර්ධනය කිරීම සහ චීන ජාතික පුස්තකාලයෙහි සම්පත් සහ සේවා පොදු මහජනතාවට භාවිත කිරීමට අවකාශය සැලසීම මින් බලාපොරොත්තු වේ.

11.a ඉලක්කය මගින් 2030 වන විට සියලු දෙනා වෙත අන්තර්කරණය වූ සහ තිරසර නාගරීකරණය වැඩි දියුණු කිරීම සහ සියළුම රටවල සහභාගීත්ව, ඒකාබද්ධ සහ තිරසර මානව ජනාවාස සැලසුම් කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා ධාරිතාවන් වැඩි දියුණු කිරීම අපේක්ෂා කරයි.

ජාත්‍යන්තර පුස්තකාල සංගමයේ (IFLA) නිර්වචනයට අනුව හරිත හා තිරසර පුස්තකාලයක් යනුවෙන් හැඳින්වෙන්නේ පාරිසරික, ආර්ථික සහ සමාජීය තිරසරභාවය සැලකිල්ලට ගන්නා පුස්තකාලයකි. හරිත හා තිරසර පුස්තකාල ඕනෑම ප්‍රමාණයකින් යුක්ත විය හැක. නමුත් ඒවාට පැහැදිලි තිරසර න්‍යාය පත්‍රයන් තිබිය යුතුය. (A green library is a library which takes into account environmental' economic and social sustainablitiy. Green and sustainable libraries may be of any size, but they should have a clear sustianbilitiy agenda). ඒ අනුව හරිත ගොඩනැගිල්ලක් සහ ඊට අදාල උපකරණ හරිත කාර්යාලීය මූලධර්ම, තිරසර ආර්ථිකය, තිරසර පුස්තකාල සේවා, සමාජ තිරසරභාවය, පාරිසරක කළමනාකරණය, සාමාන්‍ය පාරිසරික අරමුණු සහ වැඩසටහන් සඳහා කැපවීම යන කරුණු එම න්‍යාය පත්‍රයට ඇතුළත් විය යුතු බවද ඉන් අවධාරණය කර තිබේ.

ඒ අනුව නගර සහ ජනාවාස පරිපූර්ණ ආර්ථික, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම යන මෙම තිරසර සංවර්ධන අරමුණ ළඟා කර ගැනීම වෙනුවෙන් පුස්තකාල විසින් සුවිශේෂී දායකත්වයක් ලබා දෙන බව සඳහන් කළ යුතුය.

**12. තිරසර පාරිභෝජනය සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම.**

තිරසර පාරිභෝජනය හා නිෂ්පාදන රටාවන් දිරිගැන්වීම, සම්පත් සහ බලශක්ති කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම ඔස්සේ ආර්ථික සමාජ සහ පාරිසරික වියදම හානිය අවම කර ගැනීම වෙනුවෙන් මෙම අරමුණ ගොඩනගා තිබේ. මෙම අරමුණට අදාළව ඉදිරිපත් කර තිබෙන ඉලක්ක සහ දර්ශක දෙස අවධානය යොමු කිරීමේ දී පුස්තකාල හරහා එම ඉලක්ක සහ දර්ශක ඉතා සාර්ථකව සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් ඊට දායකත්වය ලබා දිය හැකි බව සඳහන් කළ යුතුය.

උදාහරණයක් ලෙස 2.6 ඉලක්කය විශේෂයෙන්ම විශාල සහ ජාත්‍යන්තර සමාගම් ඇතුළු සියලු සමාගම්වල තිරසර භාවිතයෙන් යොදා ගැනීමට පෙළඹවීම සහ ඔවුන්ගේ වාර්තා කිරීමේ චක්‍රයට තිරසර තොරතුරු ඒකාබද්ධ කිරීම, දිරි ගැන්වීම, සපුරා ගැනීම වෙනුවෙන් පුස්තකාල විසින් විවිධ කාර්යයන් ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කරන ආකාරයක් දක ගත හැකි වේ. IFLA ආයතනය විසින් පාරිසරික හා තිරසරභාවය සම්බන්ධ ගැටලුව පිළිබඳව විශේෂ උනන්දුවක් දක්වා (SIG) කණ්ඩායම් මඟින් අවධානය යොමු කර තිබේ. පාරිසරික තිරසාරත්වය යන පුස්තකාල අංශය (ENSULIB) සහ ඇමරිකානු පුස්තකාල සංගමය මඟින් 2015 ජුනි මාසයේදී තිරසර පුස්තකාල සම්බන්ධයෙන් යෝජනාවක් සම්මත කර ගන්නා ලදී.

තවද 12.8 ඉලක්කය මඟින් ඉදිරිපත් කර තිබෙන 2030 වන විට සියලුම ප්‍රදේශවල සිටින සියලුම දෙනාට තිරසර සංවර්ධනය සහ ස්වභාවධර්මය සමඟ සුසංයෝගයෙන් යුත් ජීවන රටාවක් ගත කිරීම පිළිබඳව දැනුවත්භාවයක් සහ ඊට අදාල තොරතුරු ලැබී තිබීම තහවුරු කිරීම සම්බන්ධයෙන් ද පුස්තකාල මඟින් විවිධ ක්‍රියාකාරකම් රැසක් ගෙන තිබේ. මෙම අරමුණ තහවුරු කිරීම වෙනුවෙන් පුස්තකාල මඟින් සියලු දෙනා වෙත තොරතුරු සඳහා පවතින ප්‍රවේශය තහවුරු කරයි. එමෙන්ම සියලු රටවල් සඳහා තොරතුරු සඳහා ප්‍රවේශවීමේ හැකියාව තහවුරු කර ඇති අතර ඒ වෙනුවෙන් අන්තර් පුස්තකාල පිරුළු සේවාව ඔස්සේ අන්තර්ජාතික දායකත්වය ලබා දී තිබේ. මෙය IFLA සංවිධානය සහ ලෝක බුද්ධිමය දේපල සංවිධානය (WIPO) මඟින් මෙවැනි අත්‍යවශ්‍ය සේවා සැපයීම සහතික කිරීම වෙනුවෙන් IFLA ආයතනය සමග එක්ව කටයුතු කර ඇත. එමෙන්ම මෙම ඉලක්කය ඉටු කර ගැනීම වෙනුවෙන් පුස්තකාල මඟින් ඒ ආශ්‍රිත පාඨකයන් හා ප්‍රජාව සම්බන්ධ කර ගනිමින් විවිධ සංවාද, පුහුණු වැඩසටහන්, ප්‍රදර්ශන සහ වෙනත් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම කළ හැක.

**13. දේශගුණික විපර්යාස හා ඒවායේ බලපෑම්වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක වීම සහ ළඟා කර ගැනීම.**

පුස්තකාල, තිරසර ආයතන (Sustainable Institutions) ලෙස සරලව හැඳින්විය හැක. පර්යේෂණ දත්ත සහ දැනුම බෙදා හැරීම වෙනුවෙන් පුස්තකාල මඟින් විශේෂිත කාර්යභාරයක් ඉටු කරනු ලබයි. ආපදා කළමණාකරණය සහ ඒ අනුව තිරසර සංවර්ධන අරමුණු අතරින් 13වන අරමුණ වන දේශගුණික විපර්යාස හා ඒවායේ බලපෑම්වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක වීම සහ ළඟා කර ගැනීම වෙනුවෙන් පුස්තකාල පද්ධතිය මඟින් සැලකිය යුතු ක්‍රියාමාර්ග ගෙන තිබෙන බව අනාවරණය වේ. මෙම අරමුණ සපුරාලීම වෙනුවෙන් ඉලක්ක 05ක් සහ දර්ශක 08ක් ඉදිරිපත් කර තිබේ. 13.3 ඉලක්ක වන කාලගුණය වෙනස්වීම අවම කිරීම, ඒ අනුව හැඩ ගැසීම, බලපෑම් අවම කිරීම සහ පූර්ව අනතුරු සම්බන්ධයෙන් දැනුවත්භාවය ඉහළ නැංවීම සහ මානව සහ ආයතනික ධාරිතාවන් ඉහළ නැංවීම සම්බන්ධයෙන් පුස්තකාල විසින් විවිධ වැඩසටහන්, ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කර තිබේ. පුස්තකාල මඟින් දේශගුණික විපර්යාස සම්බන්ධයෙන් පර්යේෂණ කිරීමට සහ දැනුම ව්‍යාප්ත කිරීම වෙනුවෙන් අවශ්‍ය වන දත්ත සහ තොරතුරු සඳහා වන ප්‍රවේශය ලබාදෙයි. අන්තර්ජාල පහසුකම් සැපයීම මෙම විෂය සම්බන්ධයෙන් වන පුස්තකාල එකතු පවත්වා ගෙනයාම ඔස්සේ ඊට අවශ්‍ය සහය ලබා දෙයි. දේශගුණික විපර්යාස තත්වයන් වර්තමානය වන විට හදිසි ගෝලීය තත්වයන් ලෙස හඳුනාගෙන තිබේ. ඊට මුහුණ දීම වෙනුවෙන් ජනතාව විශ්ව විද්‍යාලයීය පුස්තකාල සමඟ සහ මහජන පුස්තකාල සමඟ ද සම්බන්ධීකරණයක් ඇතිව කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ.

තිරසර බව වෙනුවෙන් භාවිත කරන වඩාත් ජනප්‍රිය ප්‍රමිතීන්ගෙන් එකක් වන්නේ ISO1400:2004 පාරිසරික කළමනාකරණ පද්ධතියයි. තිරසර සංවර්ධන අරමුණු වෙත සාර්ථකව යොදා ගත හැකි මෙම ප්‍රමිතිය හුඑල්වා විශ්ව විද්‍යාලය (University of Huelva) මගින් පාරිසරික අංශවලට අදාළ ක්‍රියාවලි සහ ක්‍රියාපටිපාටි කළමනාකරණය කිරීම වෙනුවෙන් ISO තත්ත්ව ආශ්‍රයෙන් පද්ධතියක් ක්‍රියාත්මක කර තිබේ. පුස්තකාල ISO ප්‍රමිති මිනුම භාවිත කර තිබේ.

**14. සාගර, මුහුදු සහ සාගර සම්පත් සංරක්ෂණය සහ පිරිමැසුම්දායී භාවිතය**

මෙම අරමුණ ළගා කර ගැනීම වෙනුවෙන් පුස්තකාල විවිධ ක්ෂේත්‍ර යටතේ තම දායකත්වය ලබා දීමට ක්‍රියා කර ඇත. සංවර්ධනය වෙමින් පවත්නා කුඩා දිවයින් රාජ්‍යවලට සහ අවම වශයෙන් සංවර්ධනය වූ රටවලට සමුද්‍රීය ජෛව විවිධත්වයේ දායකත්වය වැඩි දියුණු කිරීම සඳහා අන්තර් රාජ්‍ය සාගර විද්‍යාත්මක කොමිසමේ ක්‍රියාපටිපාටිය සහ සමුද්‍රීය තාක්ෂණය පරිණාමය කිරීමේ මාර්ගෝපදේශ සැලකිල්ලට ගනිමින් විද්‍යාත්මක දැනුම වර්ධනය කිරීම, පර්යේෂණ ධාරිතාවන් සංවර්ධනය කිරීම සහ සමුද්‍රීය තාක්ෂණය හුවමාරු කිරීම සඳහා පුස්තකාල ක්ෂේත්‍රයට දායක විය හැකිය (14.a ඉලක්කය). විශ්වවිද්‍යාල, උසස් අධ්‍යාපනික ආයතන, පර්යේෂණ හා තාක්ෂණ පුස්තකාල මගින් වැඩසටහන් පැවැත්වීමෙන් මෙම අරමුණ ළගා කර ගැනීමට අවශ්‍ය සහාය ලබාදිය හැකි වේ.

මීට අමතරව 14.5 ඉලක්කය මගින් 2020 වන විට හොඳම විද්‍යාත්මක තොරතුරු සහ ජාතික සහ අන්තර්ජාතික නීතිවලට අනුකූලව වෙරළබඩ හා සමුද්‍රීය ප්‍රදේශවලින් 10%ක් සංරක්ෂණය කිරීම අපේක්ෂා කරයි. මෙම ඉලක්කය අනුව ඉන්දුනීසියානු ජාතික පුස්තකාලය මගින් වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කර තිබේ. ඉන්දුනීසියාව පුරා පිහිටා ඇති අධ්‍යාපනික කටයුතු වෙනුවෙන් ඉතා අපහසුවෙන් ප්‍රවේශ වන හා පහසුකම් රහිත දූපත් ගණනාවක් වෙනුවෙන් එම දූපත්වාසීන්ගේ අධ්‍යාපනික හා සාක්ෂරතා මට්ටම් ඉහළ නැංවීම උදෙසා බොහෝ පුස්තකාල සේවා බෝට්ටු මාර්ගයෙන් එම දූපත්වලට සැපයීමට කටයුතු කර තිබේ. තිරසර සංවර්ධනය සඳහා සාගර, මුහුදු සහ සාගර සම්පත් සංරක්ෂණය සහ පිරිමැසුම්දායී භාවිතය වෙනුවෙන් වන මෙම අරමුණ ඉටු කර ගැනීම වෙනුවෙන් පුස්තකාල මගින් සැලකිය යුතු දායකත්වයක් ලබා දිය හැකි බවයි.

**15. භූගෝලීය පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය, තිරසර වනාන්තර කළමනාකරණය, කාන්තාරීකරණයට එරෙහිව ක්‍රියා කිරීම, ප්‍රතිස්ථාපනය කර ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම, ඉඩම් හායනය නැවැත්වීම සහ පුනරුත්ථාපනය, ජෛව විවිධත්ව විනාශය නැවැත්වීම.**

මේ ඔස්සේ අපේක්ෂා කරනු ලබන්නේ ජෛව විවිධත්වය සහ වාසස්ථාන ආශ්‍රිතව වන හානිය අවම කිරීම සඳහා තිරසර ඉඩම් සහ වන කළමනාකරණ යෙදීම්වල භාවිතයන් සම්බන්ධයෙනි. ශ්‍රී ලංකාව ලෝකයේ ජෛව විවිධත්වය ඇති සංකේන්ද්‍රික ස්ථාන 35 අතරින් එකක් වශයෙන් හඳුනා ගැනේ. ඒ අනුව ශ්‍රී ලංකාව මෙම අරමුණඉටු කර ගැනීම වෙනුවෙන් සැලකිය යුතු මට්ටමේ දායකත්වයක් ලබා දිය යුතු වේ. 1992 වර්ෂයේදී පවත්වන ලද රියෝ මිහිකත සමුළුවේ දී (Rio Earth Summit) රාජ්‍ය නායකයින් 150කගේ අනුමැතිය සහිතව තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය උදෙසා ඇතිකර ගත් ජෛව විවිධත්වය සම්බන්ධ ක්‍රියාකාරකම් පුස්තකාල ප්‍රවර්ධනය කිරීම මින් අපේක්ෂා කෙරේ.

ඊට අමතරව ජෛව විවිධත්වය සම්බන්ධ පුස්තකාල ද්‍රව්‍ය විශේෂයෙන්ම මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යයන් ආශ්‍රයෙන් පුස්තකාල තුළ එකතුවක් ගොඩනගා ගැනීම වැදගත් වේ. ජර්මනියේ බැඩ් ඕල් ඩිස්ලෝ නාගරික පුස්තකාලය (Stadtbibliothek Bad Oldesle) මගින් "Harvest Your City" නමින් හරිත සංකල්පයේ ගෙවතු වගා ව්‍යාපෘතියක් ආරම්භ කර තිබෙන්නේ මෙම ඉලක්කය සාක්ෂාත් කරගැනීමටයි. ඒ සමගම දේශීය වශයෙන් ව්‍යාප්ත වූ පුස්තකාල නාගරික ගෙවතු වගා සහිතව සහ පුස්තකාල ගොඩනැගිලි තිරසරභාවය සම්බන්ධ පවතින අවකාශයන් බවට පත් කරන ලදී. මෙම ව්‍යාපෘතිය ඔස්සේ 4, 11, 12, 17 තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීමට අවශ්‍ය දායකත්වය ලබාදීමට අපේක්ෂා කෙරේ.

බල්ගේරියාවේ Zachary kniazheski පුස්තකාලය මගින් "Wildlife around us get to know and protect" ව්‍යාපෘතිය ඔස්සේ වනජීවීන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර වන ජීවීන් සහ මහජනතාව එකට ජීවත්ව සිටීමේ ඇති ප්‍රතිඵල සම්බන්ධයෙන් ගුරුවරුන්, ශිෂ්‍යයන්, දෙමව්පියන් සහ සිවිල්

පුරවැසියන් සම්බන්ධ කර ගනිමින් ව්‍යාපෘතිය ක්‍රියාවට නංවා තිබේ. මෙම කරුණු මඟින් භූගෝලීය පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය ජෛව විවිධත්ව විනාශය නැවැත්වීම වෙනුවෙන් පුස්තකාල මඟින් සැලකිය යුතු දායකත්වයක් ලබා දෙන බව තහවුරු වේ.

**16. සාමකාමී සහ පරිපූර්ණ සමාජයක් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබා දීම සහ සෑම මට්ටමකටම ඵලදායී වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැගීම.**

පුස්තකාල මඟින් සාමකාමී වාතාවරණයක් සහිත ඵලදායී සමාජයක් ඇති කිරීමට විශාල දායකත්වයක් ලබා දිය හැකි අතර සංවර්ධනය වෙනුවෙන් තොරතුරු සන්නිවේදනයට, සංවිධානය කිරීමට, ගොඩනැංවීමට හා භාවිත කිරීමට පුස්තකාලය සතු හැකියාවන් යොදා ගත හැකිය.

16.10 ඉලක්කය ඔස්සේ ජාතික නීති පද්ධතියට සහ අන්තර්ජාතික ප්‍රඥප්තීන්, ගිවිසුම්වලට අනුකූලව මහජනතාවට තොරතුරු ලබාගැනීමට ඇති අයිතිය තහවුරු කිරීම සහ මූලික නිදහස ආරක්ෂා කිරීමට පුස්තකාල පද්ධතියට දායක විය හැකිය.

යුරෝපා කලාපයට අයත් මෝල්ඩෝවා රාජ්‍යයෙහි පුස්තකාල මඟින් විවෘත රාජ්‍ය හවුල්කාරීත්ව (Open Government Partnership – OGP) ක්‍රියාකාරී සැලසුම් සඳහා දායකත්වය දක්වා තිබේ. එය රාජ්‍ය සිවිල් සමාජය සහ ව්‍යාපාර මඟින් සැදුම්ලත් ක්‍රියාකාරී සැලැස්මකි. මෙහිදී පුස්තකාලයාධිපතිවරුන් සිවිල් සමාජ රැස්වීම් සඳහා සහභාගි වන අතර රටේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම සංවර්ධනය කිරීම උදෙසා සහ තොරතුරුවලට ප්‍රවේශ වීමේ අධාරකරුවෙකු ලෙස කටයුතු කරයි.

ස්විස්ටර්ලන්තයේ ක්‍රියාත්මක වන "The Globethics.net Digital Library on Ethics" හරහා ව්‍යවහාරික ආචාර ධර්ම සහ දේව ධර්මය පිළිබඳව ක්‍රියාත්මක වන විශාලතම මාර්ගගත ඩිජිටල් පුස්තකාලය ඔස්සේ ගෝලීය වශයෙන් දැනුම හුවමාරු කර ගැනීමට පහසුකම් සපයා තිබේ. ඒ ඔස්සේ නායකත්වය, යහපාලනය සහ වටිනාකම් මත පදනම් වූ තීරණ ගැනීම සහ ක්‍රියාවලි වෙනුවෙන් දායකත්වය ලබා දී ඇති බව අනාවරණය වේ. තිරසර සංවර්ධනය සඳහා කටයුතු කිරීමේදී සාමකාමී සහ පරිපූර්ණ සමාජයක් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබාදීම සහ සෑම මට්ටමකම ඵලදායී වගකීම් සහිත ආයතනයක් ලෙස කටයුතු කිරීමට පුස්තකාල උනන්දු වීම මඟින් විශාල දායකත්වයක් ලබා දෙන බව මෙමඟින් පැහැදිලි වේ.

**17. තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාවට නැංවීමේ ක්‍රම සවිමත් කිරීම සහ තිරසර සංවර්ධනය සඳහා වන ගෝලීය සහයෝගිතාවයේ පුනර්ජීවනය උදෙසා කටයුතු කිරීම.**

තිරසර සංවර්ධන අරමුණු අතරින් අවසාන අරමුණ වන්නේ, තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාවට නැංවීමේ ක්‍රම සවිමත් කිරීම සහ තිරසර සංවර්ධනය සඳහා වන ගෝලීය සහයෝගිතාවයේ පුනර්ජීවනය උදෙසා කටයුතු කිරීමයි. ගෝලීය සහයෝගීතාවය ගොඩනැංවීම වෙනුවෙන් පුස්තකාල මඟින් සුවිශේෂී දායකත්වයක් ලබාදෙයි. පුස්තකාල තනිව ක්‍රියාත්මක නොවී අන්තර්ජාතික වශයෙන් සබඳතා ගොඩනගා ගැනීම තුළින් කලාපීය මෙන්ම ගෝලීය වශයෙන් දැනුම හුවමාරු කර ගැනීමට, පර්යේෂණ සිදු කිරීමට සහ සංවර්ධනය සඳහා වන අවකාශයන් ගොඩනගා ගැනීම වෙනුවෙන් සහයෝගීතාවය ලබා දෙනු ලබයි (17.8.1 ගෝලීය දර්ශකය වන අන්තර්ජාලය භාවිතයට ගන්නා පුද්ගලයන් ප්‍රමාණය තීරණය කිරීම අපේක්ෂා කරයි.)

මෙම අරමුණ සපුරා ගැනීම වෙනුවෙන් අන්තර්ජාතික පුස්තකාල සංගම් සංවිධානය (IFLA) මඟින් ක්‍රියාකාරකම් රැසක් ක්‍රියාත්මක කර තිබේ. ප්‍රජාව වෙත අවම පිරිවැයකින් අන්තර්ජාල පහසුකම් සපයා දෙනු ලබන ප්‍රමුඛතම ආයතනයක් ලෙස පුස්තකාල හඳුනාගත හැකි අතර ඇතැම් රටවල මහජන හා අධ්‍යාපනික පුස්තකාල උපයෝජකයින්ට නොමිලේ අන්තර්ජාල පහස. මීට අමතරව විවිධ රාජ්‍ය නොවන සංවිධාන (NGO) සහ විවිධ සමාජ සුබසාධන සංවිධාන පුස්තකාල ක්‍රියාත්මක කරන දැනුම, අධ්‍යාපනය, කුසලතා වැඩිදියුණු කිරීම උදෙසා අවශ්‍ය වන සහාය ලබා දෙමින් ගෝලීය සහයෝගීතාවයන් ලබාදීම සිදු කරයි. උදාහරණයක් ලෙස ප්‍රංශයේ ක්‍රියාත්මක වන දේශසීමා නොමැති පුස්තකාල සංකල්පය (Biblio the ques Sans Frontieres - Libraries without Boarders) හරහා තොරතුරු සහ දැනුම අවශ්‍ය වන නමුත් ඒ වෙත ළඟා විය නොහැකි ජනතාව වෙත සේවා සපයනු ලබයි.

මෙම සංවිධානය රටවල් 50ක භාෂා 23කට ආසන්න ප්‍රමාණයකින් අධ්‍යාපනය, සෞඛ්‍ය, රැකියා, පුරවැසිභාවය, පරිසරය, තිරසරභාවය, ආබාධිත තත්ත්වය සහ තාක්ෂණය පිළිබඳ දැනුම ලබාදෙයි.

මෙම අරමුණ ඉටුකර ගැනීම වෙනුවෙන් යුරෝපා කලාපයට අයත් පුස්තකාල මඟින් මානව පුස්තකාල (Human Libraries) සංකල්පය භාවිතයට ගෙන ඇත. මෙමඟින් දේශීයව සහ අන්තර්ජාතිකව සමාජ, ආගමික සහ වාර්ගික ක්ෂේත්‍රයන් තුළ පවතින ගැටුම් වැළැක්වීමට සහ විවෙනස් කොට සැලකීම් වෙනස් කිරීමට අවශ්‍ය සුරක්ෂිත වටපිටාවක් නිර්මාණය වේ. මේ අනුව පුස්තකාල ප්‍රජා පාදක ගෝලීය ජාලයක් බවට පත්වෙමින් මෙම අරමුණ ඉටු කර ගැනීම වෙනුවෙන් දායකත්වය ලබා දෙයි.

## තෙවන පරිච්ඡේදය

### 3.1 පර්යේෂණ අරමුණු

2015 වර්ෂයෙන් ආරම්භ වී වසර 15ක් තුළ අත්පත් කරගත යුතු තිරසර සංවර්ධන අරමුණු පිළිබඳ ශ්‍රී ලංකාවේ පුස්තකාලවල පවතින අවබෝධය හා ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් පිළිබඳ තොරතුරු රැස් කිරීම සඳහා වූ මෙම සමීක්ෂණයෙහි අරමුණු කිහිපයකි.

- තිරසර සංවර්ධන අරමුණු පිළිබඳ ශ්‍රී ලංකාවේ පුස්තකාලවල පවතින අවබෝධය සහ දැනුවත්භාවය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම.
- තිරසර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම වෙනුවෙන් පුස්තකාල මඟින් දායකත්වය ලබා දී ඇති ආකාරය පිළිබඳ අධ්‍යයනය කිරීම.
- තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පුස්තකාල විසින් වෙනත් ආයතන සමඟ සම්බන්ධ වී කටයුතු කරන ආකාරය හඳුනා ගැනීම.
- තිරසර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීමේදී, පුස්තකාල වශයෙන් මුහුණපාන අභියෝග සහ ගැටලු සම්බන්ධයෙන් විමසා බැලීම.
- 2030 වන විට තිරසර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම වෙනුවෙන් පුස්තකාල මඟින් ඉදිරියේදී ගත යුතු පියවර සහ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් තීරණ ගැනීමට අවශ්‍ය නිගමන හා නිර්දේශ ඉදිරිපත් කිරීම.

### 3.2 පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සඳහා සමීක්ෂණ ක්‍රමවේදය (Survey Method) යොදාගන්නා ලදී. සමස්ත සංගහනය නියෝජනය වීම සඳහා ශ්‍රී ලංකාව පුරා ව්‍යාප්තව පවතින පුස්තකාල යොදාගත් අතර (ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය, මහජන පුස්තකාල, විශ්ව විද්‍යාල හා අධ්‍යාපනික, ආයතනික පුස්තකාල) එම පුස්තකාල ආශ්‍රිත පුස්තකාලයාධිපතිවරුන් සහ තොරතුරු නිලධාරීන් ඇතුළත්ව සමස්ත සංගහණය නියැදිය ලෙස සලකා බලන ලදී. ඔවුන් වෙත මාර්ගගතව (online) ප්‍රශ්නාවලියක් (google form) ඉදිරිපත් කර පිළිතුරු (මාර්ගගතව) ලබා ගත් අතර ප්‍රතිචාර සහිතව ලද පිළිතුරු ප්‍රශ්නාවලි සංඛ්‍යාව 250කි. එමඟින් රැස් කරගත් දත්ත Ms Excel භාවිතයෙන් විශ්ලේෂණය කර වගු හා ප්‍රස්තාර ඇසුරින් ඉදිරිපත් කරන ලදී.

වගු අංක 01 : ප්‍රතිචාර දක්වන ලද පුස්තකාල ප්‍රමාණය

| පුස්තකාල වර්ගය | ප්‍රතිශතය (%) |
|---|---|
| ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය | 2.8 |
| විශ්වවිද්‍යාල පුස්තකාල | 3.2 |
| මහජන පුස්තකාල | 84 |
| පර්යේෂණ පුස්තකාල | 3.2 |
| පිරිවෙන් පුස්තකාල | 0.8 |
| ගුරු විද්‍යාල/අධ්‍යාපන විද්‍යාපීඨ පුස්තකාල | 0.8 |
| කාර්මික/තාක්ෂණික විද්‍යාල පුස්තකාල | 0.8 |
| දෙපාර්තමේන්තු /අමාත්‍යාංශ පුස්තකාල | 2.8 |
| වෙනත් පුස්තකාල | 1.6 |

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත

තිරසර සංවර්ධන අභිමතාර්ථ ක්‍රියාත්මක කර එහි ප්‍රතිලාභ අත්පත් කර ගැනීමේ වගකීම පැවරී ඇත්තේ රටක විවිධ අවශ්‍යතා වෙනුවෙන් පිහිටුවා ඇති ආයතන පද්ධතියටයි. එම ආයතන රාජ්‍ය අංශයට අයත් හෝ පෞද්ගලික අංශයට අයත් ලෙස පැවතිය හැකිය. රාජ්‍ය අංශයට අයත් ආයතන ජාතික මට්ටමින් මෙන්ම පළාත් මට්ටමින් ක්‍රියාත්මක වන අතර මෙම ආයතන දෙවර්ගය යටතේම පුස්තකාල දක්නට ලැබේ. ජාතික පුස්තකාලය, විශ්ව විද්‍යාල පුස්තකාල, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල හා පර්යේෂණ ආයතන සතු පුස්තකාල අයත් වන්නේ ජාතික මට්ටමින් වන අතර මහජන පුස්තකාල ප්‍රාදේශීය පාලන ඒකක වන පළාත් පාලන ආයතන හරහා පාලනය වේ. සමීක්ෂණය සඳහා මෙම දෙවර්ගයටම අයත් පුස්තකාල වෙත ප්‍රශ්නාවලි යොමු කළ අතර බහුතර ප්‍රතිචාර ප්‍රමාණයක් ලැබී තිබූයේ මහජන පුස්තකාල ආශ්‍රයෙනි.

## 3.3 දත්ත විශ්ලේෂණය


### 3.3.1. තිරසර සංවර්ධන අරමුණු හා ඒ ආශ්‍රිත තොරතුරු පිළිබඳව පුස්තකාලවල පවතින අවබෝධය සහ දැනුවත්භාවය

පුස්තකාල ක්ෂේත්‍රය තුළ තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේදී ඒ පිළිබඳ පවතින දැනුවත්භාවය අත්‍යාවශ්‍ය සාධකයක් බැවින් සමීක්ෂණය ඔස්සේ තිරසර සංවර්ධන ඉලක්ක, අරමුණු සහ ගෝලීය දර්ශක, තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමට ඇති කාලසීමාවන්, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක තිරසර සංවර්ධන කවුන්සිලය පිළිබඳ පවතින දැනුවත්භාවය සහ තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීම වෙනුවෙන් ක්‍රියාත්මක කරන ලද වැඩමුළු, සම්මන්ත්‍රණ සහ ඒ වෙනුවෙන් පුස්තකාල වෘත්තිකයන් දක්වන ලද දායකත්වය පිළිබඳව විමසන ලදී.

වගු අංක 01 : තිරසර සංවර්ධන අරමුණු හා ඒ ආශ්‍රිත තොරතුරු පිළිබඳව පුස්තකාලවල පවතින අවබෝධය සහ දැනුවත්භාවය

| ප්‍රකාශය | ප්‍රතිචාර සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | දැනුවත්ව ඇත | දැනුවත් නොමැත | නිශ්චිත අදහසක් නොමැත |
| එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ඉදිරිපත් කරන ලද තිරසර සංවර්ධන අරමුණු පිළිබඳ ඔබ දැනුවත්ද? | 164 (65.6%) | 47 (18.8%) | 39 (15.6%) |
| තිරසර සංවර්ධන අරමුණු සඳහා වන ඉලක්ක සහ ගෝලීය දර්ශක පිළිබඳ ඔබ දැනුවත්ද? | 128 (51.2%) | 86 (34.4%) | 36 (14.4%) |
| තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමට ඇති කාල සීමාව පිළිබඳ ඔබ දැනුවත්ද? | 123 (49.2%) | 86 (34.4%) | 41 (16.4%) |
| ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන සභාව (Sustainable Development Council) පිළිබඳ ඔබ දැනුවත්ද? | 102 (40.8%) | 111 (44.4%) | 37 (14.8%) |
| තිරසර සංවර්ධන අරමුණු පිළිබඳ පවත්වන වැඩමුළු හා සම්මන්ත්‍රණ වලට සහභාගී වී ඇත්ද යන වග | 59 (23.6%) | 187 (74.8%) | 4 (1.6%) |


මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත




ප්‍රස්තාර අංක 01 : එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ඉදිරිපත් කරන ලද තිරසර සංවර්ධන අරමුණු පිළිබඳ දැනුවත්භාවය

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත


ඉහත ප්‍රස්තාර අංක 01ට අනුව සමීක්ෂණය සඳහා ප්‍රතිචාර දක්වන ලද පුස්තකාල අතරින් පුස්තකාල 164 (65.6%) තිරසර සංවර්ධන අරමුණු පිළිබඳව දැනුවත්භාවයක් පවතින බව අනාවරණය විය. සමස්ථ ප්‍රතිචාර අතරින් පුස්තකාල 47කට අයත් පුස්තකාලයාධිපතිවරුන් සහ තොරතුරු නිලධාරීන් 18.8%ක් ප්‍රකාශ කර තිබෙන්නේ තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් දැනුවත්භාවයක් නොමැති බවයි. මුළු ප්‍රතිචාර අතුරින් 15.6%ක (පුස්තකාල 39) ප්‍රමාණයක් තිරසර සංවර්ධන අරමුණු පිළිබඳව නිශ්චිත අදහසක් නොමැති බව ද සඳහන් කර තිබේ.




ප්‍රස්තාර අංක 02 : තිරසර සංවර්ධන අරමුණු සඳහා වන ඉලක්ක සහ ගෝලීය දර්ශක පිළිබඳ දැනුවත්භාවය

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත


තිරසර සංවර්ධන අරමුණු සඳහා වන ඉලක්ක සහ ගෝලීය දර්ශක පිළිබඳ පවතින දැනුවත්භාවය සම්බන්ධව ද මෙම සමීක්ෂණයේදී අවධානය යොමු කරන ලදී. තිරසර සංවර්ධනය සඳහා වන මෙම ගෝලීය ඉලක්ක හා දර්ශක සම්බන්ධයෙන් 51.2%කට ආසන්න පුස්තකාලයාධිපතිවරුන් සහ තොරතුරු නිලධාරින් ප්‍රමාණයක් දැනුවත්ව තිබෙන බව සඳහන් කර තිබේ. 34.4%ක ප්‍රතිශතයක් මෙම ගෝලීය දර්ශක සම්බන්ධයෙන් දැනුවත්ව නොමැති අතර 14.4%ක ප්‍රතිශතයක් මෙම ගෝලීය දර්ශක සම්බන්ධයෙන් නිශ්චිත අදහසක් නොමැති බව ද සඳහන් කර තිබේ.




ප්‍රස්තාර අංක 03 : තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමට ඇති කාල සීමාව පිළිබඳ දැනුවත්භාවය

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත


එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ගෝලීය සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් 2015 වර්ෂයේ දී හඳුන්වා දෙනු ලැබූ තිරසර සංවර්ධන අරමුණු 2030 වර්ෂය වන විට ලඟා කර ගත යුතුව ඇත. ඒ අනුව මෙම තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමට ඇති අවසාන වර්ෂය පිළිබඳව තොරතුරු ලබා ගන්නා ලදී. මුළු ප්‍රතිචාර අතරින් 49.2%ක ප්‍රමාණයක් ඒ පිළිබඳ දැනුවත්ව ඇති අතර 34.4%ක් මෙම අරමුණු ලඟා කරගෙන අවසන් වීමට නියමිත වර්ෂය පිළිබඳ දැනුවත්භාවයක් නොමැති බව ප්‍රකාශ කර තිබේ. 16.4%ක ප්‍රතිශතයක් මේ සම්බන්ධව නිශ්චිත පිළිතුරක් ප්‍රකාශ කර නැත.




ප්‍රස්තාර අංක 04 : තිරසර සංවර්ධන සභාව පිළිබඳව පවතින දැනුවත්භාවය

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත

තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීම වෙනුවෙන් ඒ ඒ රටවල් විසින් විවිධ ප්‍රතිපත්ති, ක්‍රියාමාර්ග හා වැඩසටහන් රාශියක් සැලසුම් කර ක්‍රියාවට නංවනු ලබයි. විශේෂයෙන්ම ශ්‍රී ලංකාව තුළ තිරසර සංවර්ධනය වෙනුවෙන් හා එම අරමුණු සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් **"සැමට තිරසර ලෙස සංවර්ධිත ශ්‍රී ලංකාවක්"** යන තේමාව යටතේ තිරසර සංවර්ධන සභාව (Sustainable Development Council) පිහිටුවන ලදී. තිරසර සංවර්ධන පනතට අනුකූලව පිහිටුවන ලද තිරසර සංවර්ධන සභාව මඟින් තිරසර සංවර්ධනය සඳහා වූ 2030 න්‍යාය පත්‍රය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය, පහසුකම් සැපයීම, අධීක්ෂණය, ඇගයීම සහ වාර්තා කිරීමේ වගකීම් දරන රාජ්‍ය ආයතනය වශයෙන් කටයුතු කරනු ලබයි. මෙම සමීක්ෂණය හරහා තිරසර සංවර්ධන සභාව පිළිබඳව පවතින දැනුවත්භාවය සම්බන්ධයෙන් ද තොරතුරු ලබා ගන්නා ලදී. ප්‍රස්තාර අංක 04ට අනුව ලබා දී ඇති මුළු ප්‍රතිචාර සංඛ්‍යාව අතරින් 40.8%කට ආසන්න ප්‍රතිශතයක් තිරසර සංවර්ධන සභාව පිළිබඳ දැනුවත්භාවයක් පවතින බව සඳහන් කර තිබේ. නමුත් බහුතර පිරිසක් එනම් 44.8%කට ආසන්න පුස්තකාල ප්‍රමාණයක් තිරසර සංවර්ධන සභාව පිළිබඳ දැනුවත්භාවයක් නොමැති බව සඳහන් කර තිබේ. 14.8%ක ප්‍රමාණයක් මෙම තිරසර සංවර්ධන සභාව සම්බන්ධයෙන් නිශ්චිත අදහසක් නොමැති බව දක්වා ඇත. ඒ අනුව පුස්තකාලයාධිපතිවරුන්ට මෙම ආයතනය පිළිබඳව නිසි අවබෝධයක් නොමැති බව තහවුරු විය.




ප්‍රස්තාර අංක 05: තිරසර සංවර්ධන අරමුණු පිළිබඳ පවත්වන වැඩමුළු හා සම්මන්ත්‍රණ වලට සහභාගී වීම

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත

තිරසර සංවර්ධන අරමුණු පිළිබඳ වෘත්තිකයන් හා ප්‍රජාව දැනුවත් කිරීම සඳහා වන වැඩමුළු, සම්මන්ත්‍රණ එක් එක් ආයතන විසින් පවත්වනු ලැබේ. ඇතැම් ආයතන රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන මෙන්ම මේ සම්බන්ධව ක්‍රියාත්මක වන වෙනත් ආයතන මඟින් තිරසර සංවර්ධනය සම්බන්ධයෙන් වන මාතෘකා පදනම් කරගෙන ජාතික හා අන්තර්ජාතික වශයෙන් විවිධ සම්මන්ත්‍රණ හා වැඩමුළු පවත්වනු ලැබේ. ප්‍රතිචාර දැක්වීමට ඉදිරිපත් වූ පුස්තකාල අතරින් තිරසර සංවර්ධන අරමුණු පිළිබඳ වෘත්තිකයන් හා ප්‍රජාව දැනුවත් කිරීම සඳහා සම්මන්ත්‍රණ හා වැඩමුළුවලට සහභාගී වී ඇති ප්‍රමාණය ඉතා අවම අගයක් ගනී. 23.4%කට ආසන්න පුස්තකාල ප්‍රමාණයක් සම්මන්ත්‍රණ හා වැඩමුළුවලට සහභාගී වී ඇති අතර බහුතර පුස්තකාල ප්‍රමාණයක් එනම් 74.8%ක් මෙවැනි අවස්ථාවලට සම්බන්ධ වී නොමැති බව සඳහන් කළ යුතුය. 1.6%ක ප්‍රතිශතයක් නිශ්චිත පිළිතුරක් සඳහන් කර නොමැත.

### 3.3.2. තිරසර සංවර්ධන අරමුණු පිළිබඳව පුස්තකාල හා පුස්තකාල වෘත්තිකයන්ගේ පවතින දැනුවත්භාවය

තිරසර සංවර්ධන අරමුණු 17 පිළිබඳව පුස්තකාල හා පුස්තකාල වෘත්තිකයන්ගේ පවතින දැනුවත්භාවය සම්බන්ධයෙන් අධ්‍යයනය කළ අතර ඊට ඉදිරිපත් කරන ලද ප්‍රශ්නවලට පිළිතුරු සපයා ඇත්තේ පහත පරිදිය.

වගු අංක 02 : තිරසර සංවර්ධන අරමුණු 17 පිළිබඳව පුස්තකාල හා පුස්තකාල වෘත්තිකයන්ගේ පවතින දැනුවත්භාවය

| තිරසර සංවර්ධන අරමුණ | හොඳින් දැනුවත්ව ඇත (%) | මධ්‍යස්ථ දැනුවත්භාවයක් ඇත (%) | තරමක් දුරට දැනුවත්භාවයක් ඇත (%) | දැනුවත්භාවයක් නොමැත (%) |
|---|---|---|---|---|
| අරමුණ- 01 | 14.8 | 41.6 | 36 | 7.6 |
| අරමුණ- 02 | 22.4 | 36.8 | 35.2 | 5.6 |
| අරමුණ- 03 | 24.8 | 36.8 | 31.2 | 7.2 |
| අරමුණ- 04 | 24.8 | 45.2 | 24.4 | 5.6 |
| අරමුණ- 05 | 24.8 | 43.2 | 26.4 | 5.6 |
| අරමුණ- 06 | 25.6 | 40.4 | 27.2 | 6.8 |
| අරමුණ- 07 | 11.6 | 40.8 | 33.2 | 14.4 |
| අරමුණ- 08 | 13.2 | 41.2 | 34.8 | 10.8 |
| අරමුණ- 09 | 12 | 40 | 34 | 14 |
| අරමුණ- 10 | 12 | 38.4 | 34.8 | 14.8 |
| අරමුණ- 11 | 16.8 | 32.8 | 33.2 | 17.2 |
| අරමුණ- 12 | 16 | 35.6 | 34.8 | 13.6 |
| අරමුණ- 13 | 21.2 | 32 | 32.8 | 14.8 |
| අරමුණ- 14 | 16.4 | 32 | 30.4 | 22.4 |
| අරමුණ- 15 | 11.6 | 35.2 | 34 | 19.2 |
| අරමුණ- 16 | 10.8 | 43.6 | 30 | 15.6 |
| අරමුණ- 17 | 8.4 | 38.4 | 30.8 | 22.4 |

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත

I) පළමු අරමුණ වන්නේ සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීමයි. ප්‍රතිචාර අතරින් 56.4%ක ප්‍රමාණයක් මෙම අරමුණු සම්බන්ධයෙන් මධ්‍යස්ථ දැනුවත්භාවයක් පවතින බව සඳහන් කොට ඇත. 36%කට ආසන්න ප්‍රතිශතයක් මෙම අරමුණු සම්බන්ධයෙන් තරමක් දුරට දැනුවත් වී තිබෙන බව පැහැදිලි වේ. නමුත් මුළු ප්‍රතිචාර සංඛ්‍යාව අතරින් 7.6%කට ආසන්න ප්‍රතිශතයක් මෙම අරමුණ සම්බන්ධයෙන් දැනුවත්භාවයක් නොමැති බව අනාවරණය විය.

II) සාගින්න නැතිකර, ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්ත්වයක් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම සම්බන්ධව ලබා දී ඇති ප්‍රතිචාර අතරින් 60%කට ආසන්න ප්‍රතිශතයක් මෙම අරමුණ පිළිබඳ දැනුවත්භාවයකින් යුක්තය. විශේෂයෙන්ම 2030 වර්ෂය වන විට සාගින්න තුරන් කිරීම සහ ළදරුවන් ඇතුළු දරිද්‍රතාවයෙන් පෙළෙන සහ අවධානමකට ලක් වී තිබෙන ජනතාව ආරක්ෂාකාරී,

පෝෂණයෙන් යුතු ප්‍රමාණවත් ආහාර ලබා ගැනීමට අවස්ථාව ලබාදීම මෙහි මූලික බලාපොරොත්තුව වේ. තවද 5.2%කට ආසන්න ප්‍රතිශතයක් මෙම අරමුණ සම්බන්ධයෙන් දැනුවත් වී නොමැති බව තහවුරු විය.

III) නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ පිළිබඳ 61.6%ක ප්‍රතිශතයක් දැනුවත් බව සඳහන් කර තිබෙන අතර 31.6%ක ප්‍රතිශතයක් මෙම අරමුණ සම්බන්ධයෙන් සාමාන්‍යයෙන් දැනුවත්භාවයක් ඇතිබවත්, සමස්ථ ප්‍රතිචාර සංඛ්‍යාව අතරින් 7.2% ක ප්‍රමාණයක් මේ සම්බන්ධයෙන් දැනුවත්වීමක් නොමැති බව ඉහත තොරතුරුවලට අනුව පෙනීයයි.

IV) පරිපූර්ණ, සාධාරණ, ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම යන අරමුණ පිළිබඳ දැනුවත්භාවය 24.8%කි. 45.2%කට ආසන්න ප්‍රමාණයක් මේ පිළිබඳව මධ්‍යස්ථ දැනුවත්භාවයක් ඇත. 24.4%ක ප්‍රමාණයක් මෙම අරමුණ සම්බන්ධව තරමක්දුරට දැනුවත්ව තිබෙන නමුත් 5.6%කට ආසන්න ප්‍රතිශතයක් දැනුවත් නොමැති බව හෙළි විය. අනෙකුත් අරමුණුහා සැලකීමේදී ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සම්බන්ධව පවතින දැනුවත්භාවය ඉහළ අගයක ඇතිබව සඳහන් කළ හැකිය.

V) ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව ළඟා කර සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීමට අදාළ අරමුණපිළිබඳ දැනුවත්භාවය 24.8%කි. 43.2% ක ප්‍රතිශතයක් මධ්‍යස්ථ දැනුවත්භාවයක් සහිතය. 26.4%ක ප්‍රමාණයක් තරමක් දුරට දැනුවත්ව ඇති අතර 5.6%ක ප්‍රතිශතයකට මෙම අරමුණ සම්බන්ධව පැහැදිලි අවබෝධයක් නොමැති බව අනාවරණය විය.

VI) සැමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබාගැනීම සහ ඒවායේ තිරසර කළමණාකරණය සහතික කිරීමයි. සමීක්ෂණයට අනුව 25.6% ප්‍රමාණයක් මෙම අරමුණ සම්බන්ධයෙන් දැනුවත්ව ඇති ස්වභාවයක් හඳුනාගත හැකි වේ. 40.4%ක ප්‍රමාණයක් මධ්‍යස්ථව දැනුවත්ව ඇති අතර 27.2%ක ප්‍රතිශතයක් තරමක් දුරට දැනුවත්භාවයක් පවතින බව දක්වා ඇති අතර 6.8%ක ප්‍රතිශතයක් දැනුවත් නැත.

VII) සියල්ලන් සඳහා දැරිය හැකි විශ්වාසනීය තිරසර සහ නවීන බලශක්ති සැපයුම සහතික කිරීම වෙනුවෙන් වන තිරසර සංවර්ධන අරමුණු පිළිබඳ හොඳින් දැනුවත් වූ ප්‍රතිශතය 11.6%ක අවම අගයක් වන අතර 40.8% ප්‍රතිශතයක් මේ සම්බන්ධයෙන් මධ්‍යස්ථ දැනුවත්භාවයක් පවතින බව පෙන්වා දිය හැකිය.

VIII) සියල්ලන් සඳහා පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය පූර්ණ ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීමේ අරමුණ පිළිබඳ දැනුවත් ප්‍රතිශතය 13.2%කි. මධ්‍යස්ථව හා තරමක්දුරට දැනුවත් වූ ප්‍රතිශතය පිළිවෙලින් 41.2% හා 34.8% කි.

ix) නවවන අරමුණ වන්නේ සවිමත් යටිතල පහසුකම් ගොඩනැඟීම සහ පරිපූර්ණ ලෙස තිරසර කාර්මිකරණ ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරිගැන්වීමයි. 12% සහ 40.%කට ආසන්න ප්‍රතිශතයක් මෙම අරමුණ සම්බන්ධයෙන් පිළිවෙලින් හොඳින් දැනුවත් හා මධ්‍යස්ථව දැනුවත්භාවයකින් යුතු බව අනාවරණය වේ. ප්‍රතිචාර සංඛ්‍යාව අතරින් 34%ක ප්‍රතිශතයක් තරමක්දුරට දැනුවත්ව තිබෙන නමුත් 14%කට ආසන්න ප්‍රතිශතයක් දැනුවත් නොමැත.

X) රටවල් තුළ සහ ඒවා අතර අසමානාත්මතාවය අඩු කිරීම යන මෙම අරමුණ සම්බන්ධ දැනුවත්භාවය පිළිබඳ සලකා බැලීමේ දී පෙනී යන්නේ පිළිවෙලින් 12%ක් හා 38.4%කට ආසන්න ප්‍රතිශතයක් ඉතා හොඳ හා මධ්‍යස්ථ දැනුවත්භාවයක් පවතින බවයි. 34.8%කට ආසන්න ප්‍රතිශතයක් මේ පිළිබඳව තරමක්දුරට දැනුවත්භාවයක් පවතින නමුත් 14.8%කට ආසන්න ප්‍රතිශතයක් මේ පිළිඳව මූලික අවබෝධයක් නොමැති බව අනාවරණය වේ.

xi) නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම හා නගරවල තිරසර බව ඉහළ නැංවීම සඳහා සංතුලිත ප්‍රවේශයක් තුළින් විසඳුම් සෙවිය යුතු අංශ ගණනාවක් වැඩි දියුණු කිරීම මෙම අරමුණ ඔස්සේ බලාපොරොත්තු වේ. මුළු ප්‍රතිචාරිකයන් අතරින් 16.8%කට ආසන්න ප්‍රතිශතයක් මෙම අරමුණ සම්බන්ධව හොඳින් දැනුවත්ව ඇති අතර 32.8%කට ආසන්න ප්‍රතිශතයක් මේ පිළිබඳ මධ්‍යස්ථ දැනුවත්භාවයක් පවතී. මුළු ප්‍රතිචාර අතරින් 17.2%කට ආසන්න අගයක් මෙම අරමුණ සම්බන්ධව දැනුවත්භාවයක් නොපවතින බව තහවුරු විය.

XII) තිරසර පරිභෝජන සහ නිෂ්පාදන රටාවක් සහතික කිරීම, තිරසර පරිභෝජනය සහ නිෂ්පාදන ප්‍රතිපත්ති ඵලදායී අන්දමින් ක්‍රියාවට නැංවීම සඳහා ඒවා සියලු ජාතික ප්‍රතිපත්ති සහ සැලසුම් වලට නිසි පරිදි අනුකලනය කළ හැකිවීම සම්බන්ධයෙන් පුස්තකාල වෘත්තිකයන් සතුව පවතින දැනුවත්භාවය පිළිබඳ සලකා බැලීමේදී මුළු ප්‍රතිචාර සංඛ්‍යාව අතරින් 16%ක ප්‍රමාණයක් මෙම අරමුණ සම්බන්ධයෙන් හොඳින්ම දැනුවත්ව ඇති අතර 35.6%කට ආසන්න ප්‍රතිශතයක් මධ්‍යස්ථ දැනුවත්භාවයක් පවතින බව සඳහන් කර තිබේ. 34.8%ක ප්‍රමාණයක් සමස්ථ ප්‍රතිචාර සංඛ්‍යාවන් මෙම අරමුණ සම්බන්ධයෙන් තරමක් දුරට දැනුවත්ව තිබෙන අතර 13.6%කට ආසන්න ප්‍රතිශතයක් මේ පිළිබඳව අදහසක් නොමැතිබව දක්වා තිබේ.

XIII) දේශගුණික විපර්යාස සහ ඒවායේ බලපෑම්වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක වීමේ අරමුණ සම්බන්ධයෙන් පුස්තකාලවේදීන් සතුව පවතින දැනුවත්භාවය පිළිබඳ සලකා බැලීමේ දී අනාවරණය වන්නේ 22%කට ආසන්න ප්‍රතිශතයක් මේ පිළිබඳව හොඳින් දැනුවත්ව ඇති ස්වභාවයකි. 32%ක ප්‍රමාණයක් මධ්‍යස්ථව දැනුවත්ව තිබෙන අතර 32.8%කට ආසන්න ප්‍රතිශතයක් තරමක් දුරට දැනුවත්භාවයක් තිබෙන බව දක්වා ඇත. මුළු ප්‍රතිචාර අතරින් 14.8%ක ප්‍රමාණයක් කිසිදු දැනුවත්භාවයක් නොමැති බව සඳහන් කර තිබේ.

XIv) තිරසර සංවර්ධනය සඳහා සාගර, මුහුදු සහ සාගර සම්පත් සංරක්ෂණය සහ පිරිමැසුම්දායී භාවිතය තිරසර සංවර්ධන අරමුණු අතරින් 14වන අරමුණ වේ. පිළිවෙලින් 16.4%ක් හා 31.6%ක ප්‍රතිශතයක් මෙම අරමුණ සම්බන්ධයෙන් දැනුවත්භාවයක් පවතින බව තහවුරු කර තිබේ. 30.4%ක ප්‍රතිශතයක් මෙම තිරසර සංවර්ධන අරමුණ පිළිබඳව තරමක දැනුවත්භාවයක් උසුලන බව දක්වා තිබේ. 22.4%කට ආසන්න ප්‍රතිශතයක් මෙම තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධව කිසිදු දැනුවත්භාවයක් නොදක්වන බව පෙන්වා දී ඇත.

Xv) භූගෝලීය පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය තිරසර වනාන්තර කළමනාකරණය කාන්තාරීකරණයට එරෙහිව ක්‍රියා කිරීම, ප්‍රතිස්ථාපනය කර ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම, ඉඩම් හායනය නැවැත්වීම සහ පුනරුත්ථාපනය, ජෛව විවිධත්ව විනාශය නැවැත්වීම 15වන අරමුණයි. මෙම අරමුණ සම්බන්ධව පුස්තකාල වෘත්තීකයන් පිළිවෙලින් 11.6%ක් සහ 35.2%ක් මෙම අරමුණ පිළිබඳව හොඳින් දැනුවත්ව සහ මධ්‍යස්ථ දැනුවත්භාවයක් පවතින බව තහවුරු වන අතර 34%කට ආසන්න ප්‍රතිශතයක් තරමක් දුරට දැනුවත්භාවයක් පවතී. 19.2%කට ආසන්න ප්‍රතිචාරිකයන් පිරිසක් කිසිදු දැනුවත්භාවයක් නොමැති බව සඳහන් කර තිබේ.


Xvi) තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයක් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබාදීම සහ සැමවිටකම ඵලදායී වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැගීම 16වන අරමුණයි. මෙම අරමුණ සම්බන්ධව පුස්තකාල වෘත්තීකයන් තුළ පවතින දැනුවත්භාවය සතුටුදායක මට්ටමක නැත. පිළිවෙලින් 10.8%ක් සහ 43.6%ක් මෙම අරමුණ පිළිබඳව හොඳින් දැනුවත්ව සහ මධ්‍යස්ථ දැනුවත්භාවයක් පවතින බව තහවුරු වන අතර 30%කට ආසන්න ප්‍රතිශතයක් තරමක් දුරට දැනුවත්භාවයක් පවතී. 15.6%කට ආසන්න ප්‍රතිචාරිකයන් පිරිසක් කිසිඳු දැනුවත්භාවයක් නොමැති බව සඳහන් කර තිබේ.

XvII) තිරසර සංර්ධන අරමුණු අතරින් අවසාන අරමුණ වන්නේ ක්‍රියාවට නැංවීමේ ක්‍රම සවිමත් කිරීම සහ තිරසර සංවර්ධනය සඳහා වන ගෝලීය සහයෝගීතාවයේ පුනර්ජීවනයයි. මෙම අරමුණඔස්සේ තිරසර සංවර්ධනය සඳහා වන ගෝලීය සහයෝගීතාවයේ පුනර්ජීවනය මූල්‍ය, තාක්ෂණය, වෙළඳාම, යන ක්ෂේත්‍ර ඔස්සේ ලබා ගැනීමට අපේක්ෂා කරයි. මෙම අවසාන අරමුණ සම්බන්ධව පවතින දැනුවත්භාවය ඉතා අවම වන අතර 38.4%ක සාධනීය මට්ටමේ දැනුවත්භාවයක් පවතින බව සඳහන් කර ඇත. සමස්ථ ප්‍රතිචාර සංඛ්‍යාව අතරින් දැනුවත්භාවයක් නොමැති ප්‍රතිශතය 22.4% කි.

### 3.3.3 තිරසර සංවර්ධන අරමුණු පිළිබඳ දැනුවත් වූ හා තොරතුරු ලබාගත් මාධ්‍යය/මූලාශ්‍ර

විශේෂයෙන්ම තිරසර සංවර්ධනය සඳහා වන න්‍යාය පත්‍රය පිළිබඳව විශාල කාර්යභාරයක් පැවරී ඇති ක්ෂේත්‍රයක් ලෙස පුස්තකාල ක්ෂේත්‍රය හඳුනාගත හැකි වේ. තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාවට නැංවීම උදෙසා ඒ පිළිබඳ පවතින දැනුවත්භාවය ඉතා ප්‍රයෝජනවත් වේ. වර්තමානය වනවිට විවිධ මාධ්‍යයන් ඔස්සේ මෙම තිරසර සංවර්ධනය සඳහා වූ න්‍යාය පත්‍රය පිළිබඳ, එහි කාර්යයන් හා ඉදිරි වැඩපිළිවෙල සම්බන්ධව තොරතුරු හුවමාරු වෙමින් පවතී.

ඒ අනුව විවිධ මුද්‍රිත, විද්‍යුත්, සමාජ මාධ්‍ය සහ වෙනත් ක්‍රම ඔස්සේ මෙම තොරතුරු හුවමාරු වන අතර විශේෂයෙන්ම පොත්පත්, පුවත්පත් වැනි මුද්‍රිත මාධ්‍යයත් රූපවාහිනිය, ගුවන් විදුලිය, අන්තර්ජාලය වැනි විද්‍යුත් මාධ්‍ය මගින් සමාජ මාධ්‍ය වැඩසටහන්, මිතුරන්/වෘත්තීයවේදීන් හෝ වෙනත් ක්‍රම ඔස්සේ තොරතුරු හුවමාරු වේ.




ප්‍රස්තාර අංක 06 : තිරසර සංවර්ධන අරමුණු පිළිබඳ දැනුවත් වූ හා තොරතුරු ලබාගත් මාධ්‍යයන් / මූලාශ්‍ර

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත


මෙම සමීක්ෂණය ඔස්සේ පුස්තකාල වෘත්තිකයන් විසින් තිරසර සංවර්ධන අරමුණ පිළිබඳ දැනුවත් වූ මාධ්‍යය/මාධ්‍යයන් පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම අපේක්ෂා කෙරුණි. සමීක්ෂණය ඔස්සේ ලබාගත් සමස්ථ ප්‍රතිචාර අතරින් 66%කට ආසන්න ප්‍රතිශතයක් තිරසර සංවර්ධන අරමුණ හා ඒ ආශ්‍රිත තොරතුරු සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගෙන තිබෙන ප්‍රමුඛතම මාධ්‍යය වන්නේ අන්තර්ජාලයයි. දෙවන ස්ථානය පුවත්පත් වන අතර එහි ප්‍රතිශතය 64%කි. 55%කට ආසන්න ප්‍රතිශතයක් පොත්පත්, 42%ක් රූපවාහිනී මාධ්‍ය සහ 38%ක ප්‍රමාණයක් සමාජ මාධ්‍ය ඔස්සේ තිරසර සංවර්ධන අරමුණ සහ ඒ සම්බන්ධ තොරතුරු ලබාගෙන තිබෙන බව අනාවරණය වේ. ආයතනික මට්ටමින් සිදුකළ විවිධ දැනුවත් කිරීම් (22%) තුළින් සහ ගුවන් විදුලිය (18%) හා විවිධ සම්මන්ත්‍රණ/වැඩමුළු (20%) තුළින් ද තිරසර සංවර්ධන අරමුණ පිළිබඳ ලබාගත් තොරතුරු සැලකිය යුතු ප්‍රමාණයක් දක්නට ලැබේ. 18%කට ආසන්න පුස්තකාල ප්‍රමාණයක් මිතුරන්/වෘත්තීයවේදීන් මගින් මේ සම්බන්ධ දැනුම හුවමාරු කරගෙන තිබේ.

### 3.3.4 තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීම වෙනුවෙන් පුස්තකාල දායක වී ඇති ආකාරය

තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීම වෙනුවෙන් විශේෂයෙන්ම පුස්තකාල පද්ධතිය, පුස්තකාල වෘත්තීයවේදීන් විසින් විවිධ ක්‍රියාමාර්ග, ප්‍රතිපත්ති, ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබේ. තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීම වෙනුවෙන් ශ්‍රී ලංකාවේ පුස්තකාල මගින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සහ ක්‍රියාකාරකම් (පසුගිය වසර 05 තුළ) පිළිබඳ තොරතුරු ලබා ගැනීම සිදු කරන ලදී. ඒ යටතේ තිරසර සංවර්ධන අරමුණු 17 සඳහා ඒ ඒ පුස්තකාල විසින් වෙන් වෙන්ව ගනු ලැබූ ක්‍රියාමාර්ග/ව්‍යාපෘති පිළිබඳ විමසන ලදී.

**3.3.4.1** පළමු අරමුණු සපුරා ගැනීම වෙනුවෙන් පුස්තකාලයකට ඉටු කළ හැකි ක්‍රියාමාර්ග/වැඩසටහන් පිළිබඳ ප්‍රතිචාරකයින්ගේ අදහස් විමසන ලදී.

- මෙම අරමුණට අදාළ විෂයට ගැළපෙන පුස්තකාල ද්‍රව්‍ය අත්පත් කර ගැනීම.
- අදාල පාර්ශව දැනුවත් කිරීම.
- තේමාවට අදාළ ප්‍රදර්ශන පැවැත්වීම.
- ව්‍යවසායකයින් සහ ව්‍යවසායකත්වය සවිබල ගැන්වීම් පිළිබඳ වැඩමුළු, දේශන සහ සාකච්ඡා සංවිධානය.





ප්‍රස්තාර අංක 07 : 01වන අරමුණ සපුරා ගැනීම වෙනුවෙන් පුස්තකාල විසින් සිදු කරන ලද වැඩසටහන්/ක්‍රියාකාරකම්

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත

ප්‍රස්තාර අංක 07ට අනුව ලබා දී ඇති ප්‍රතිචාර පිළිබඳව අවධානය යොමු කිරීමේදී තිරසර සංවර්ධන අරමුණු අතරින් පළමු අරමුණ (සෑම ආකාරයේම පවතින දුගීබව තුරන් කිරීම) සම්බන්ධව පවතින පුස්තකාල ද්‍රව්‍ය/සම්පත් අත්පත් කර ගැනීමට ක්‍රියා කළ පුස්තකාලවල ප්‍රතිශතය 41.6%කි. මෙම අරමුණ සපුරා ගැනීමට ප්‍රදර්ශන සංවිධානය කොට ඇති පුස්තකාල ප්‍රතිශතය 10.4%කි. පුස්තකාල 22.8%කට ආසන්න ප්‍රමාණයක් විසින් ව්‍යවසායකයින් හා ව්‍යවසායකත්වය සවිබල ගැන්වීමට වැඩමුළු, දේශනසංවිධානය කර ඇත. සමස්ථ ප්‍රතිචාර ප්‍රමාණයෙන් 19.2%කට ආසන්න ප්‍රතිශතයක් නිසි අවබෝධයක් නොමැතිකම මතවැඩසටහන් ක්‍රියාත්මක කර නොමැත.

**3.3.4.2** දෙවන අරමුණ සපුරා ගැනීමට පුස්තකාල දායක වී ඇති ආකාරය ප්‍රස්තාර අංක 08 මඟින් නිරූපණය වේ.





ප්‍රස්තාර අංක 08 : 02වන අරමුණ සපුරාගැනීම වෙනුවෙන් පුස්තකාල විසින් සිදු කරන ලද වැඩසටහන්/ක්‍රියාකාරකම්

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත

ප්‍රතිචාර ලබා දුන් පුස්තකාල අතරින් බහුතර ප්‍රමාණයක් එනම් 43.2%කට ආසන්න ප්‍රතිශතයක් විසින් මෙම තේමාව හා සම්බන්ධ පුස්තකාල ද්‍රව්‍ය අත්පත් කර ගැනීමට උනන්දු වී ඇත. එළවලු, පළතුරු හා ඖෂධ ඇතුළු වගා කළ ගෙවත්තක් පවත්වාගෙන යාම තුළින් තම පාඨකයන් දිරිමත් කිරීමට 41%කට ආසන්න පුස්තකාල ප්‍රමාණයක් කටයුතු කර ඇත. පුස්තකාල 28.8%කට ආසන්න ප්‍රමාණයක් විසින් සෞඛ්‍යසම්පන්න ආහාර රටාවන්, පෝෂණ තත්ත්වයන් පිළිබඳ වැඩමුළු, දේශන, සාකච්ඡා පැවැත්වීම සිදුකර තිබේ. 22%ක ප්‍රතිශතයක් කෘෂිකාර්මික පර්යේෂණ තොරතුරු පාඨකයාට ලබා දීමට පියවර ගෙන ඇත. තේමාවට අදාළව ප්‍රදර්ශන පැවැත්වීම 5% ප්‍රතිශතයකි. 11%කට ආසන්න පුස්තකාල ප්‍රමාණයකටමෙම දෙවන අරමුණ පිළිබඳ පැහැදිලි අවබෝධයක් නොමැති බවත් 20%කට ආසන්න පුස්තකාල සංඛ්‍යාවක් වැඩසටහන් ක්‍රියාත්මක කර නොමැති බව ද අනාවරණය වේ.

**3.3.4.3** නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් ක්‍රියාකර ඇති පුස්තකාල පිළිබඳ පහත ප්‍රස්තාරයෙන් නිරූපණය වේ.





ප්‍රස්තාර අංක 09 : 03වන අරමුණ සපුරාගැනීම වෙනුවෙන් පුස්තකාල විසින් සිදු කරන ලද වැඩසටහන්/ක්‍රියාකාරකම්

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත

ප්‍රස්තාර අංක 09ට අනුව මෙම අරමුණ සපුරා ගැනීම වෙනුවෙන් පුස්තකාලය කියවීමට, විනෝදාස්වාදය සහ විවේකීව සිටීමට සුදුසු ස්ථානයක් ලෙස සකස් කිරීම සිදු කර තිබේ. එය සමස්ථ ප්‍රතිචාර සංඛ්‍යාවෙන් 63%කට ආසන්න අගයක් ගනී. මාතෘකාවට අදාල පුස්තකාල ද්‍රව්‍ය අත්පත් කර ගැනීම 39.6%කි. 28%කට ආසන්න ප්‍රතිශතයක් මානසික සුවතාවය පිළිබඳ වැඩසටහන්, ක්‍රියාකාරකම් හා දේශන පැවැත්වීම සිදු කර ඇත. ආහාර සුරක්ෂිතතාවය සම්බන්ධ විවිධ දේශන/වැඩමුළු සංවිධානය කිරීම හා පැවැත්වීම මගින් ද නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරීමට 36.8%කට ආසන්න පුස්තකාල කටයුතු කර ඇත. පුස්තකාල අතරින් 28.8%කට ආසන්න පුස්තකාල සංඛ්‍යාවක් විශේෂිත රෝග වර්ග පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්, දේශන පැවැත්වීම යනාදී කාර්යයන් සිදු කර තිබේ. අදාළ තේමාව යටතේ ප්‍රදර්ශන පැවැත්වීම සිදු කරඇතිප්‍රතිශතය 9.2%කට ආසන්නය.

**3.3.4.4** ශ්‍රී ලංකාවේ මෙන්ම ගෝලීය වශයෙන් ද ගත්කළ විශේෂයෙන්ම දැනුම හුවමාරු කරනු ලබන විශේෂිත ක්ෂේත්‍රයක් ලෙස පුස්තකාල ක්ෂේත්‍රය හඳුනාගත හැක. පරිපූර්ණ, සාධාරණ, ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම පුස්තකාල සේවාව ප්‍රමුඛ අරමුණක් බැවින් මෙම අරමුණ සාර්ථක කර ගැනීමට සෑම පුස්තකාලයක්ම ක්‍රියාකාරී වැඩ කොටසක් ඉටු කර තිබේ.





ප්‍රස්තාර අංක 10 : 04වන අරමුණ සපුරා ගැනීම වෙනුවෙන් පුස්තකාල විසින් සිදු කරන ලද වැඩසටහන්/ක්‍රියාකාරකම්

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත

පුස්තකාල ද්‍රව්‍ය අත්පත්කර ගැනීම හා පාඨකයන් දැනුවත් කිරීම සමස්ථ ප්‍රතිචාර අතරින් 49.2%කට ආසන්න අගයක් ගන්නා අතර භාෂා කුසලතා වර්ධනය කර ගැනීමේ ක්‍රියාකාරකම්/වැඩසටහන් පැවැත්වීම 46%ක ප්‍රතිශතයකි. මීට අමතරව ලිවීම, කියවීම සහ තොරතුරු සාක්ෂරතාවය පිළිබඳ වැඩමුළු, දේශන හා සාකච්ඡා සංවිධානය කිරීම (45.2%), පුස්තකාල ඩිජිටල්කරණය කර තිබීම (24.8%) සහ අදාළ තේමාව යටතේ ප්‍රදර්ශන පැවැත්වීම (14.6%) සහ 11.6%ක පුස්තකාල ප්‍රමාණයකට මෙම තිරසර සංවර්ධන අරමුණු පිළිබඳ නිසි අවබෝධයක් නොමැති බවත් 13.2%කට ආසන්න පුස්තකාල ප්‍රමාණයක් විසින් සිව්වන තිරසර සංවර්ධන අරමුණ වෙනුවෙන් කාර්යයන් සිදු කර නොමැති බව ද දැකගත හැක.

**3.3.4.5** ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ළඟා කර සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීමවෙනුවෙන් පුස්තකාල හා පුස්තකාල වෘත්තිකයින් විසින් පසුගිය වසර 05කට ආසන්න කාලය තුළ සිදු කරනු ලැබූ ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් කිහිපයක් දැකගත හැක.





ප්‍රස්තාර අංක 11 : 05වන අරමුණ සපුරා ගැනීම වෙනුවෙන් පුස්තකාල විසින් සිදු කරන ලද වැඩසටහන්/ක්‍රියාකාරකම්

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත

මෙම අරමුණ සපුරා ගැනීම වෙනුවෙන් බහුතර පුස්තකාල ප්‍රමාණයක් විසින් කාන්තා දිනය සැමරීම වෙනුවෙන් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර තිබේ. එය සමස්ථ ප්‍රතිචාර සංඛ්‍යාවෙන් 42.8%කි. මීට අමතරව කාන්තාවන්ට විශේෂිත/ළමුන්ට ගැළපෙන පුස්තකාල ද්‍රව්‍ය අත්පත් කර ගැනීම (41.6%) සහ 38%කට ආසන්න පුස්තකාල සංඛ්‍යාවක් විසින් කාන්තාවන් සවිබල ගැන්වීම පිළිබඳ වැඩමුළු, දේශන හාසාකච්ඡා සහ කාන්තාවන් වෙනුවෙන් වන විවිධ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර තිබේ. මෙම අරමුණ හා සම්බන්ධිත තේමාවන් ඔස්සේ ප්‍රදර්ශන පැවැත්වීම (6.8%) සිදු කර තිබේ. මුළු ප්‍රතිචාර අතරින් 11%කට ආසන්න ප්‍රතිශතයක් මෙම අරමුණපිළිබඳ නිසි අවබෝධයක් නොමැති බව දක්වා ඇති අතර 19.2%ක පුස්තකාල ප්‍රමාණයක්මෙම අරමුණ සපුරා ගැනීම වෙනුවෙන් ක්‍රියාකාරීව සම්බන්ධ වී අදාළ ක්‍රියාමාර්ග ගෙන නොමැති බව අනාවරණය වේ.

**3.3.4.6** තිරසර සංවර්ධන අරමුණු අතරින් සයවන අරමුණ වනුයේ සැමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබා ගැනීම සහ ඒවායේ තිරසර කළමණාකරණය සහතික කිරීම වෙනුවෙන් ද පුස්තකාලවලට ක්‍රියාකාරීව මැදිහත් විය හැකිය යන්නයි.





ප්‍රස්තාර අංක 12 : 06වන අරමුණ සපුරා ගැනීම වෙනුවෙන් පුස්තකාල විසින් සිදු කරන ලද වැඩසටහන්/ක්‍රියාකාරකම්

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත

පුස්තකාල භාවිත කරනු ලබන පාඨකයන් වෙත අවශ්‍ය ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබාදීමට අවස්ථාව සලසා දී ඇති පුස්තකාල ප්‍රතිශතය 46%කි. ජල කළමනාකරණය, අපජලය බැහැර කිරීම, සනීපාරක්ෂක සේවා පිළිබඳ තොරතුරු/සේවා සංවිධානය ආශ්‍රයෙන් පුස්තකාල ද්‍රව්‍ය අත්පත් කර ගැනීම පුස්තකාල විසින් ඉටු කර තිබේ. ඒ සඳහා 43.2%ක පුස්තකාල ප්‍රමාණයක් ප්‍රතිචාර දක්වා ඇත. ලබා දී ඇති මුළු ප්‍රතිචාර අතරින් 31.6%ක් සඳහන් කර තිබෙන්නේ ජලය හා ඒ ආශ්‍රිත රෝග සම්බන්ධයෙන් දැනුවත් කිරීම් සිදු කරන බවයි. ඊට අමතරව ප්‍රදර්ශන පැවැත්වීම (8%) තුළින් ද ජනතාවට ජලය හා සනීපාරක්ෂාව පිළිබඳ අවබෝධයක් ලබා දී තිබේ. පුස්තකාල අතරින් 9.2%කට ආසන්න ප්‍රමාණයක් මෙම අරමුණ සම්බන්ධයෙන් නිසි අවබෝධයක් නොමැති අතර 21%කට ආසන්න ප්‍රතිශතයක් මෙම අරමුණ සපුරා ගැනීමට සක්‍රීය දායකත්වයක් සපයා නැත.

**3.3.4.7** 07වන අරමුණ වන සියල්ලන් සඳහා දැරිය හැකි විශ්වාසනීය, තිරසර සහ නවීන බලශක්ති සැපයුම සහතික කිරීම සපුරා ගැනීම වෙනුවෙන් සෑම රටකම පුස්තකාල පද්ධතියට සැලකිය යුතු කාර්යයභාර්යක් ඉටු කිරීමට හැකියාව පවතී.





ප්‍රස්තාර අංක 13 : 07වන අරමුණ සපුරා ගැනීම වෙනුවෙන් පුස්තකාල විසින් සිදු කරන ලද වැඩසටහන්/ක්‍රියාකාරකම්

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත

විශ්වාසනීය, තිරසර සහ නවීන බලශක්ති සැපයුම සහතික කිරීම වෙනුවෙන් පුස්තකාල විසින් ස්වභාවික ආලෝකය, වාතාශ්‍රය ලැබෙන පරිදි පුස්තකාල ගොඩනැගිල්ල සකස් කර ගැනීමට උනන්දු වී ඇත. ප්‍රතිචාර දක්වන ලද පුස්තකාල අතරින් 55.6%කට ආසන්න පුස්තකාල සංඛ්‍යාවක් ඒ සඳහා කටයුතු කර ඇති බව අනාවරණය වේ. මෙම අරමුණ වෙනුවෙන් වන තොරතුරු තම පාඨකයන් වෙත ලබාදීම සඳහා පුස්තකාල ද්‍රව්‍ය අත්පත් කර ගැනීම හා සංවිධානය සහ පාඨක සේවා ලබාදීමට පුස්තකාල 31.2%ක් දායකත්වය ලබා දී ඇති අතර බලශක්ති භාවිතය සහ එහි වටිනාකම් සම්බන්ධ දැන්වීම් ප්‍රදර්ශනය කර තිබීම (24.8%), සූර්ය බලය, සුළං හෝ වෙනත් පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් පුස්තකාල ආශ්‍රිතව පවත්වාගෙන යාම හා භාවිත කිරීම (13.6%), බලශක්තිය කාර්යක්ෂමව භාවිත කිරීමට ස්මාර්ට් හා සහතික කරන ලද උපාංග/උපකරණ (පරිගණක, ප්‍රින්ටරය, විදුලි බල්බ හා වෙනත් භෞතික උපකරණ) භාවිත කිරීම (36.8%), බලශක්ති විෂය යටතේ ප්‍රදර්ශන පැවැත්වීම (24.8%) සිදු කර තිබේ. බලශක්ති හා ඒ අදාල විෂය ක්ෂේත්‍රය නගා සිටුවීම සඳහා වන මෙම අභිමතාර්ථය පිළිබඳ අවබෝධයකින් තොරව කටයුතු කරන පුස්තකාල ප්‍රතිශතයක් ලෙස 20%කට ආසන්නය. 12%කට ආසන්න පුස්තකාල සංඛ්‍යාවක් විසින් පසුගිය වසර 05ක කාල සීමාව තුළ කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බව ද තහවුරු විය.

**3.3.4.8** තිරසර සංවර්ධන අරමුණු අතරින් සියල්ලන් සඳහා පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම අටවන අරමුණ වේ. මෙම අරමුණ කරා ළඟා වීමට පුස්තකාල විසින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති බව අනාවරණය විය.





ප්‍රස්තාර අංක 14 : 08වන අරමුණ සපුරා ගැනීම වෙනුවෙන් පුස්තකාල විසින් සිදු කරන ලද වැඩසටහන්/ක්‍රියාකාරකම්

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත

මේ යටතේ ප්‍රමුඛත්වයක් ලබා දී තිබෙන කාර්යයක් වන්නේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික කටයුතු වෙනුවෙන් පාඨකයන්ට පහසුකම් සලසා දීමයි. එය සමස්ථ ප්‍රතිචාර අතරින් 45.6%ක අගයක් ගනී. ආර්ථික සංවර්ධනය සහ රැකියා ප්‍රවර්ධනය සඳහා පුස්තකාල විවිධ ක්‍රම භාවිත කර තිබේ. පාඨක ප්‍රජාවට නවතම රැකියා අවස්ථා සම්බන්ධ තොරතුරු හා සේවා සැපයීම 44.8%ක පුස්තකාල ප්‍රමාණයක් එම කාර්යය සිදු කරන බව තහවුරු විය. මෙම කරුණු ඇතුළත් ආර්ථික විද්‍යා විෂය ප්‍රකාශන හා මෙම අරමුණ ආශ්‍රිත තේමාවන් වලට අයත් පුස්තකාල ද්‍රව්‍ය අත්පත් කර ගැනීම හා පාඨක සේවා සැපයීම (34.8%), පරිගණක හා අන්තර්ජාලය භාවිතය සම්බන්ධයෙන් වැඩමුළු, පාඨමාලා හා සාකච්ඡා පැවැත්වීම (24%), රැකියා වෙළඳ පොළ, ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම (10.4%), ප්‍රදර්ශන පැවැත්වීම (6%) සිදු කර තිබේ. 10%කට ආසන්න පුස්තකාල ප්‍රමාණයක් මෙම අරමුණ සම්බන්ධයෙන් නිසි අවබෝධයක් නොමැති බැවින් වැඩසටහන් සිදු නොකළ ප්‍රතිශතය 23%ක ආසන්න අගයක් ගනී.

**3.3.4.9** සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරි ගැන්වීම තිරසර සංවර්ධන අරමුණුඅතරින් නවවන අරමුණයි. මෙම අරමුණ සපුරා ගැනීම තුළින් පුස්තකාල සේවාව නගා සිටුවීම පිණිස අවශ්‍ය යටිතල පහසුකම් සවිමත් කිරීම මඟින්වඩා ඵලදායී සේවාවක් පාඨකයන් සහ මහජනතාව වෙත ලබා දීමට මෙය උපකාරී වේ.





ප්‍රස්තාර අංක 15 : 09වන අරමුණ සපුරා ගැනීම වෙනුවෙන් පුස්තකාල විසින් සිදු කරන ලද වැඩසටහන්/ක්‍රියාකාරකම්

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත

පුස්තකාලයක් පවත්වාගෙන යාමට අවශ්‍ය යටිතල පහසුකම් විධිමත් පරිදි ලබා දීම හරහා පාඨකයන් හා ප්‍රජාව වෙනුවෙන් පුස්තකාල 56.4%කට ආසන්න ප්‍රමාණයක් විසින් තම දායකත්වය ලබාදෙන බව පෙන්වා දී ඇත. තවද විවෘත අධ්‍යාපනික සම්පත් සඳහා නිදහසේ ප්‍රවේශවීමේ හැකියාව ඇති කිරීම (42%) මාතෘකාවට අදාල පුස්තකාල ද්‍රව්‍ය අත්පත්කර ගැනීම හා අදාල පාර්ශව දැනුවත් කිරීම (34%) සහ නව නිපැයුම් ප්‍රදර්ශන පැවැත්වීමට (4%) පුස්තකාල කටයුතු කර තිබේ. 10.4%කට ආසන්න පුස්තකාල මෙම අරමුණ පිළිබඳ පැහැදිලි අවබෝධයක් නොමැති බව සනාථ කර ඇති අතර 21.6%කට ආසන්න පුස්තකාල ප්‍රතිශතයක් මෙම අරමුණ සපුරා ගැනීම සඳහා පසුගිය වසර 05ක කාල පරිච්ඡේදය තුළ ඵලදායී කාර්යයන් ඉටු කර නොමැති බව තහවුරු විය.

**3.3.4.10** රටවල් තුළ සහ ඒවා අතර අසමානතාවය අඩු කිරීම වෙනුවෙන් පුස්තකාල පද්ධතිය මැදිහත් වී පසුගිය වසර 05ක කාලය තුළ විවිධ ක්‍රියාමාර්ග සහ වැඩසටහන් සංවිධානය කොට ක්‍රියාත්මක කර තිබෙන ආකාරයක් පහත දැක්වෙන ප්‍රස්තාරයෙන් නිරූපණය වේ.





ප්‍රස්තාර අංක 16 : 10වන අරමුණ සපුරා ගැනීම වෙනුවෙන් පුස්තකාල විසින් සිදු කරන ලද වැඩසටහන්/ක්‍රියාකාරකම්

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත

වැදගත් සහ ඓතිහාසිකමය වශයෙන් වැදගත් තොරතුරු එක් රැස්කර ප්‍රදර්ශනය කරනු ලබන පුස්තකාල අතර මහජන පුස්තකාලවලට හිමිවනුයේ ප්‍රමුඛස්ථානයකි. ලැබී තිබෙන දත්තවලට අනුව 47%කට ආසන්න වශයෙන් පුස්තකාල ප්‍රමාණයක් මෙම කාර්‍යය ඉටු කර තිබේ. ආර්ථිකමය අපහසුතා ඇති පුද්ගලයන් වෙනුවෙන් කටයුතු කර ඇති පුස්තකාල ප්‍රතිශතය 46.8%කට ආසන්නය. 41.6%කට ආසන්න පුස්තකාල ප්‍රමාණයක් විසින් සමාජ ඒකාබද්ධතාවය ඇති කරනු ලබන මධ්‍යස්ථානයක් (පුද්ගලයින් හඳුනා ගැනීමට අත්දැකීම් හුවමාරු කිරීමට සාකච්ඡා කිරීමට සුදුසු ස්ථානයක් වීම) ලෙස කටයුතු කිරීම, ආගමික සංහිඳියාව හා සංස්කෘතිය පිළිබඳ ප්‍රදර්ශන, වැඩමුළු හා සාකච්ඡා පැවැත්වීම (27.6%), මාතෘකාවට අදාළ පුස්තකාල ද්‍රව්‍ය අත්පත් කර ගැනීම සහ අදාළ පාර්ශව වෙත දැනුවත් කිරීම (26%) ආදී කාර්යයන් සහ වැඩසටහන් මෙම අරමුණ සපුරාගැනීම වෙනුවෙන් ක්‍රියාත්මක කර තිබේ. තවද විවිධ ආබාධිත තත්ත්වයන්ගෙන් පෙළෙන පාඨකයන් හා ප්‍රජාව වෙනුවෙන් බ්‍රේල් පොත්, කථන පොත්, අනුවර්තන යතුරු පුවරු, වෙනස් කළ හැකි ඩෙස්ක් පුටු හා සංඥා භාවිතය යනාදී පහසුකම් ඔස්සේ ඔවුන්ට අවශ්‍ය සහයෝගය ලබා දී ඇත. (16.8%) අරමුණ ගැන නොදැනුවත් ප්‍රතිශතය 8.4%කට ආසන්නය. 18.4%කට ආසන්න පුස්තකාල ප්‍රමාණයක් පසුගිය වසර වසර 05ක කාල සීමාව තුළ සතුටුදායක කාර්යභාර්යයක් සිදු කර නොමැත.

**3.3.4.11** නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම වෙනුවෙන් වන 11වන අරමුණ වෙනුවෙන් ශ්‍රී ලංකාවේ පුස්තකාල පද්ධතිය දක්වන ලද දායකත්වය විවිධ කාර්යයන්, වැඩසටහන් ඔස්සේ ඇගයුම් කළ හැකිය.

.





ප්‍රස්තාර අංක 14 : 11වන අරමුණ සපුරා ගැනීම වෙනුවෙන් පුස්තකාල විසින් සිදු කරන ලද වැඩසටහන්/ක්‍රියාකාරකම්

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත

ප්‍රස්තාර අංක 14ට අනුව 43.2%කට ආසන්න පුස්තකාල සංඛ්‍යාවක් විසින් මෙම තිරසර සංවර්ධන අරමුණ සපුරාගැනීම සඳහා අනාගත පරම්පරාව වෙනුවෙන් සංස්කෘතික උරුමයන් සංරක්ෂණය සහ ප්‍රලේඛනය සහතික කරන ස්ථානයක් ලෙස පුස්තකාල කටයුතු කරනු ලබයි. එමෙන්ම තිරසර සංවර්ධනය පිළිබඳ ඉගෙනීමට, සාකච්ඡා කිරීම වෙනුවෙන් පුස්තකාලය රැස්වීම් ස්ථානයක් ලෙස අවශ්‍ය පහසුකම් සපයා දෙනු ලබන බව ද අනාවරණය වේ. 29.6%කට ආසන්න පුස්තකාල මේ සඳහා අවශ්‍ය දායකත්වය ලබා දේ. ඊට අමතරව අරමුණට අදාළ විෂයන් නියෝජනය කරන පුස්තකාල ද්‍රව්‍ය අත්පත් කරගැනීම හා පාඨක සේවා සැපයීම(28%) සහ අදාළ තේමාව යටතේ ප්‍රදර්ශන පැවැත්වීම (6%)වැනි ක්‍රියාමාර්ග ගෙන තිබේ. 13.2%ක පුස්තකාල ප්‍රමාණයක් මෙම අරමුණ සම්බන්ධයෙන් පැහැදිලි අවබෝධයක් නොමැති අතර සැලකිය යුතු පුස්තකාල ප්‍රමාණයක් (27.2%) මේ සම්බන්ධ වැඩසටහන්/ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කර නොමැති බව අනාවරණය වේ.

**3.3.4.12** තිරසර පාරිභෝජනය සහ නිෂ්පාදනය ආර්ථික හා සාමාජීය ක්ෂේත්‍රය තුළ වැදගත් ස්ථානයක් හිමි කර ගනී. තිරසර පාරිභෝජනය සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම වෙනුවෙන් විවිධ ව්‍යාපෘති හා ක්‍රියාමාර්ග ගෙන තිබෙන බව පහත ප්‍රස්තාර අංක 14 මගින් අනාවරණය වේ.





ප්‍රස්තාර අංක 15 : 12වන අරමුණ සපුරා ගැනීම වෙනුවෙන් පුස්තකාල විසින් සිදු කරන ලද වැඩසටහන්/ක්‍රියාකාරකම්

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත

ප්‍රස්තාරයට අනුව පුස්තකාල මඟින් සිදු කරනු ලබන ප්‍රමුඛතම කාර්යය වන්නේපොත් පරිත්‍යාග කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමයි. 52.4% එමෙන්ම 42.8%කට ආසන්න පුස්තකාල සංඛ්‍යාවක් කසල අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම හරහා ද තිරසර පාරිභෝජන සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම වෙනුවෙන් තම දායකත්වය ලබාදෙයි. පුස්තකාල ද්‍රව්‍ය අත්පත් කරගැනීම හා දැනුවත් කිරීමේ කටයුතු සිදු කිරීම (30.4%), නැවත භාවිත කළහැකි හා කාර්යක්ෂම බලශක්තිය උපදවන විදුලි උපාංග, ලිපි ද්‍රව්‍ය, සැපයුම් භාවිත කිරීම (25.2%), කාබනික කෘෂිකර්මාන්තය පිළිබඳ වැඩමුළු හා දේශන පැවැත්වීම (25%) සහ ප්‍රදර්ශන සංවිධානය කිරීම (2.8%) සිදු කරයි. ප්‍රතිචාර අතරින් 10.4%කට ආසන්න පුස්තකාල ප්‍රමාණයක් මෙම අරමුණ පිළිබඳව නිසි අවබෝධයක් නොමැති බව සඳහන් කර ඇත. ඊට අමතරව 16%කට ආසන්න පුස්තකාල ප්‍රමාණයක් සැලකිය යුතු වැඩ කොටසක් ඉටු කර නොමැත.

**3.3.4.13** තිරසර සංවර්ධන අරමුණු අතරින් 13වන අරමුණ වන්නේ දේශගුණික විපර්යාස තත්වයන් සහ ඒවායේ බලපෑම්වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක වීමයි.ඒ වෙනුවෙන් පුස්තකාල කටයුතු කර ඇති ආකාරය පහත ප්‍රස්තාරයෙන් නිරූපණය වේ.





ප්‍රස්තාර අංක 16 : 13වන අරමුණ සපුරාගැනීම වෙනුවෙන් පුස්තකාල විසින් සිදු කරන ලද වැඩසටහන්/ක්‍රියාකාරකම්

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත

ඉහත ප්‍රස්තාර අංක 16ට අනුව දේශගුණික තත්ත්වයන් පිළිබඳ විශේෂ පුස්තකාල එකතුවක් පවත්වාගෙන යාම වෙනුවෙන් 3.8%කට ආසන්න පුස්තකාල ප්‍රමාණයක් විසින් තම දායකත්වය ලබා දෙන බව සඳහන් කර තිබේ. ඊට අමතරව දේශගුණික විපර්යාස පිළිබඳ වැඩමුළු, දේශන පැවැත්වීම (12%) අදාල තේමාවන් ඔස්සේ ප්‍රදර්ශන පැවැත්වීම (5.6%) සිදු කරනු ලබන බව පැහැදිලි වේ. දේශගුණික විපර්යාස තත්වයන් සහ ඒවායේ බලපෑම්වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් පුස්තකාල වෘත්තිකයන් සතු අවබෝධය ඉතා අවම බවත් (20%), 36.8%කට ආසන්න පුස්තකාල ප්‍රමාණයක් මෙම අරමුණසපුරාලීම වෙනුවෙන් වන ක්‍රියාමාර්ග පසුගිය වසර 05ක කාලය තුළ ක්‍රියාත්මක කර නොමැති බව ද අනාවරණය වේ.

**3.3.4.14** සාගර මුහුදු සහ සාගර සම්පත් සංරක්ෂණය සහ පිරිමැසුම්දායී භාවිතය පිළිබඳ පුස්තකාල ලබා දී ඇති ප්‍රතිචාර පහත දැක්වෙන ප්‍රස්තාරයෙන් නිරූපණය වෙයි.





ප්‍රස්තාර අංක 17 : 14වන අරමුණ සපුරා ගැනීම වෙනුවෙන් පුස්තකාල විසින් සිදු කරන ලද වැඩසටහන්/ක්‍රියාකාරකම්

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත

ප්‍රස්තාර අංක 17 අනුව 31%කට ආසන්න පුස්තකාල ප්‍රමාණයක් සාගර, මුහුදු සහ සාගර සම්පත් සංරක්ෂණය සහ පිරිමැසුම්දායී භාවිතය සම්බන්ධව පවතින පුස්තකාල ද්‍රව්‍ය පුස්තකාල වෙත ලබා ගැනීම හා අදාළ පාර්ශව වෙත දැනුවත් කිරීම් සිදු කරනු ලබන බව අනාවරණය වේ. පුස්තකාල 28%කට සාගර, මුහුදු සහ සාගර සම්පත් පිළිබඳ සංරක්ෂණය පිළිබඳ විශේෂ පුස්තකාල එකතුවක් /තොරතුරු පවත්වාගෙන යාම සහ ලෝක ජල දිනය සැමරීම සිදු කරනු ලබයි. මෙම තේමාව යටතේ ප්‍රදර්ශන පැවැත්වීම සිදු කරන පුස්තකාල ප්‍රතිශතය 3.6% කට ආසන්නය. 34.4%කට ආසන්න පුස්තකාල ප්‍රමාණයක් සාගර සම්පත් සංරක්ෂණය වෙනුවෙන් වැඩසටහන් ක්‍රියාත්මක කර නොමැත.

**3.3.4.15** භූගෝලීය පරිසර පද්ධතියේ තිරසර භාවිතය, තිරසර වනාන්තර කළමනාකරණය, කාන්තාරීකරණයට එරෙහිව ක්‍රියා කිරීම, ප්‍රතිස්ථාපනය කර ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම, ඉඩම් හායනය නැවැත්වීම හා පුනරුත්ථාපනය සහ ජෛව විවිධත්ව විනාශය නැවැත්වීම 15වන තිරසර සංවර්ධන අරමුණ සපුරා ගැනීම වෙනුවෙන් පුස්තකාල මඟින් ලබාදෙන දායකත්වය පහත ප්‍රස්තාර අංක 18 අනුව පැහැදිලි කළ හැකිය.





ප්‍රස්තාර අංක 18 : 15වන අරමුණ සපුරා ගැනීම වෙනුවෙන් පුස්තකාල විසින් සිදු කරන ලද වැඩසටහන්/ක්‍රියාකාරකම්

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත

ඒ යටතේ පුස්තකාල විසින් සිදුකළ මූලිකම වැඩ පිළිවෙල ලෙස හඳුනාගත හැකි වන්නේ පුස්තකාල භූමිය තුළ විවිධ වගා කටයුතු සිදු කිරීමයි. ඒ සඳහා 50% ආසන්න පුස්තකාල සංඛ්‍යාවක් තම දායකත්වය ලබා දෙන බව මෙම සමීක්ෂණය ඔස්සේ පැහැදිලි වේ. තේමාවට අදාළ පුස්තකාල ද්‍රව්‍ය අත්පත් කර ගැනීම හා අදාල පාර්ශව වෙත දැනුවත් කිරීම (35.2%), තිරසර වටිනාකමක් ඇති පුස්තකාල ගෘහ භාණ්ඩ භාවිත කිරීම (35.2%), විශේෂ පුස්තකාල එකතුවක් පවත්වාගෙන යාම (24.8%), මාතෘකාවට අදාළව දැනුවත් කිරීමේ වැඩමුළු, දේශන පැවැත්වීම සහ සංවිධානය (9.6%) සහ අදාල තේමාව යටතේ ප්‍රදර්ශන පැවැත්වීම (4%) හඳුනාගත හැකි වේ. 8.4%කට ආසන්න පුස්තකාල මෙම තිරසර සංවර්ධන අරමුණ පිළිබඳව නිසි අවබෝධයක් නොමැති බවත් 19.6%කට ආසන්න පුස්තකාල සංඛ්‍යාවක් මෙම අරමුණ සපුරාලීම වෙනුවෙන් කිසිදු වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොමැති බව ද හෙළි විය.

**3.3.4.16** තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයක් ඇති කිරීම, යුක්තිය සඳහා අවස්ථාව ලබාදීම සහ සෑම මට්ටමකම ඵලදායී, වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැගීම 16වන තිරසර සංවර්ධන අරමුණ වන අතර මෙය සපුරා ගැනීම වෙනුවෙන් විවිධ ක්‍රියාකාරකම්/වැඩසටහන් ක්‍රියාවට නංවයි.




ප්‍රස්තාර අංක 19 ඃ 16වන අරමුණ සපුරා ගැනීම වෙනුවෙන් පුස්තකාල විසින් සිදු කරන ලද වැඩසටහන්/ක්‍රියාකාරකම්


මූලාශ්‍රය ඃ සමීක්ෂණ දත්ත

මානව හිමිකම් සහ නීතිය පිළිබඳ විශේෂ පුස්තකාල එකතුවක් පවත්වාගෙන යාම (37.2%) මඟින් මෙම අරමුණ සපුරා ගැනීමට අවශ්‍ය දායකත්වය ලබාදීමට පුස්තකාල වෘත්තිකයන් කටයුතු කර ඇත. තම පුස්තකාල එකතුව තුළට ද්‍රව්‍ය අත්පත්කර ගැනීම හා අදාළ පාර්ශව වෙත දැනුවත් කිරීම (34%), දැනුවත් කිරීමේ වැඩමුළු, දේශන පැවැත්වීම හා සංවිධානය (10%) සහ ප්‍රදර්ශන පැවැත්වීම (4.4%) අවබෝධයක් නොමැතිව කටයුතු කර ඇති ප්‍රතිශතය 12.8%කට ආසන්නය. පසුගිය වසර 05ක කාලය තුළ පුස්තකාල 30%කට ආසන්න ප්‍රතිශතයක් මෙම අභිමතාර්ථය සාධනය පිණිස වැඩසටහන් සිදු නොකළ බව පිළිගෙන ඇත.

**3.3.4.17** මෙම සමීක්ෂණය ඔස්සේ සම්බන්ධ වී කටයුතු කළ ආයතන සම්බන්ධයෙන් ද තොරතුරු ලබා ගැනීම සිදු කරන ලදී. තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීම පිළිබඳව වැඩසටහන්, ක්‍රියාමාර්ග හා ව්‍යාපෘති සිදු කිරීමේ දී බහුතර පුස්තකාල ප්‍රමාණයක් විවිධ ආයතන සමග සම්බන්ධ වී කටයුතු නොකළ ස්වභාවයක් දැකිය හැකි වේ.

### 3.3.5 විවිධ ආයතන සමග සම්බන්ධව තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමේ අරමුණින් පුස්තකාල කටයුතු කිරීම.

2030 වර්ෂයේදී සපුරාගැනීමට නියමිත මෙම තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාවට නැංවීමේ ක්‍රම සවිමත් කිරීම සහ තිරසර සංවර්ධනය සඳහා වන ගෝලීය සහයෝගීතාවයේ පුනර්ජීවනය ඇති කිරීම මෙම අරමුණු සියල්ලෙහි අවසාන අපේක්ෂාව වේ. විශේෂයෙන්ම මූල්‍ය, තාක්ෂණය, වෙළඳාම සහ පද්ධති යන ක්ෂේත්‍ර ඔස්සේ දේශීය සහ විදේශීය වශයෙන් ක්‍රියාත්මක වන විවිධ ආයතන සමග සම්බන්ධ වී කටයුතු කිරීම තුළින් තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමේ අරමුණින් පුස්තකාල කටයුතු කරයි.




ප්‍රස්තාර අංක 20 : විවිධ ආයතන සමග සම්බන්ධව තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමේ අරමුණින් පුස්තකාල කටයුතු කිරීම.

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත

ප්‍රස්තාර අංක 20 අනුව බහුතර (47%) පුස්තකාල ප්‍රමාණයක් විවිධ ආයතන සමග සම්බන්ධව තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමේ අරමුණින් කටයුතු කර නොමැති ස්වභාවයක් දැකිය හැකිය. 39%කට ආසන්න පුස්තකාල ප්‍රමාණයක් විවිධ ආයතන සමග සම්බන්ධව කටයුතු කර ඇත. ඒ අනුව විවිධ රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන ආයතන, විශ්ව විද්‍යාල, පාසල්, විදේශීය ආයතන, ප්‍රකාශන ආයතන සහ විවිධ සමිති හා සමාගම් සමග සම්බන්ධ වී කටයුතු කළ ආකාරයක් හඳුනාගත හැකි වේ. රාජ්‍ය ආයතන ලෙස මත්ද්‍රව්‍ය නිවාරණ අධිකාරිය, මධ්‍යම පරිසර අධිකාරිය, ගොවිජන සේවා කාර්යාල, පළාත් පාලන ආයතන (මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා), දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, රෝහල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ අධ්‍යාපනික ආයතන ලෙස විශ්ව විද්‍යාල සමග සම්බන්ධව කටයුතු කර තිබේ. තවද පුස්තකාල ක්ෂේත්‍රය සම්බන්ධව කටයුතු කිරීමේ දී ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය හා ඒකාබද්ධව ද විවිධ ක්‍රියාකාරකම්/වැඩසටහන් දියත් කර ඇත. මීට අමතරව ප්‍රජා සංවර්ධන මධ්‍යස්ථාන, සංස්කෘතික මධ්‍යස්ථාන, පෙර පාසල්, වැඩිහිටි නිවාස මෙන්ම ආරක්ෂක අංශවල සහාය ද ලබා ගෙන තිබේ. විදේශීය රාජ්‍ය නොවන ආයතන ලෙස එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP), ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO), ලෝක බැංකුව (World Bank), යුරෝපා සංගමය (EU) සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) වැනි ආයතනයන් ද ආසියානු පදනම (The Asia Foundation), වර්ල්ඩ් විෂන් (World Vision), යුනිටි ලංකා (Unity Lanka)වැනි ආයතන සමග ද

එක්ව පුස්තකාල විසින් තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමේ අපේක්ෂාව ඇතිව විවිධ ක්‍රියාකාරකම්, වැඩසටහන් හා ව්‍යාපෘති පසුගිය කාලසීමාව තුළ සිදුකළ බව අනාවරණය වේ. නමුත් පුස්තකාල 14%ක ප්‍රමාණයක් මෙම අරමුණු සහ ආයතන මට්ටමින් ලබා ගත හැකි සහයෝගය පිළිබඳව නිසි අවබෝධයකින් තොරව කටයුතු කර ඇත.

### 3.3.6 පුස්තකාල විසින් ක්‍රියාත්මක කරන ලද වෙනත් ව්‍යාපෘති/වැඩසටහන්

- තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීම වෙනුවෙන් පුස්තකාල විසින් විවිධ ආකාරයේ වැඩසටහන් ව්‍යාපෘති හා ක්‍රියාමාර්ග රැසක් ගෙන තිබූ බව අනාවරණය විය.
- ආයතනයේ අරමුණු සමග ගැළපෙන තිරසර අරමුණු හඳුනා ගෙන ක්‍රියාකාරී සැලසුම්, වාර්ෂික සැලසුම් ක්‍රමෝපායන සැලසුම් සකස් කිරීම.
- දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම. (මාර්ගගත ආකාරයට)
- ජාතික කියවීමේ මාසය සැමරීම උදෙසා කියවීම ප්‍රවර්ධනයට වැඩසටහන් සංවිධානය කිරීම.
- ප්‍රජාපාදක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (නැණසල, මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්, ලේ දන්දීමේ වැඩසටහන්, ළමා අපචාර වැළැක්වීම පිළිබඳ වැඩසටහන් පැවැත්වීම, ආයුර්වේද සායන පැවැත්වීම, කාන්තාවන් සවිබල ගැන්වීමේ වැඩසටහන්).
- හරිත පුස්තකාල (Green Library) සංකල්පය යටතේ නාගරික ප්‍රදේශවල ගෙවතු වගා කටයුතු ප්‍රවර්ධනය කිරීම, ගෙවතු වගා තරඟ සංවිධානය, අපද්‍රව්‍ය/කැළිකසල කළමනාකරණය කිරීමේ වැඩසටහන්, පරිසර හිතකාමී කාර්යාල උපකරණ භාවිතය දිරිමත් කිරීම.
- දේශීය හා විදේශීය රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සමග සහයෝගීතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. ජාත්‍යන්තර පුස්තකාල සංගමය (IFLA) මඟින් පවත්වාගෙන යන SDG Road Map හරහා තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමට පුස්තකාල ඉටු කරන වැඩසටහන් ඇතුලත් කිරීමට අවස්ථාව ලබා දී ඇත. එමඟින් අනෙකුත් පුස්තකාලවලට දැනුම අත්දැකීම් හුවමාරු කර ගැනීමට හැකි වී ඇත.
- තිරසර සංවර්ධන අරමුණු මූලික කර ගනිමින් විවිධ ක්ෂේත්‍රවලට අයත් පර්යේෂකයන්, විද්වතුන් හා උසස් අධ්‍යාපනය හදාරනු ලබන ශිෂ්‍යයන් සම්බන්ධ කර ගනිමින් ජාතික හා ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණ පැවැත්වීම.
- පුස්තකාල කාර්යයන් පහසුව හා ඉක්මනින් ලබාදීමේ අරමුණින් සහ කඩදාසි භාවිතය අවම කිරීමේ අරමුණින් පුස්තකාල ස්වයංක්‍රීයකරණය වැඩසටහන් (Library Automation) ආරම්භ කිරීම.

### 3.3.7 තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේදී පුස්තකාල විසින් මුහුණපානු ලබන අභියෝග/ගැටළු

තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමට පුස්තකාල විසින් ගන්නා උත්සාහයන් කෙරෙහි බලපාන විවිධ අභියෝග හා ගැටළු පවතී.

- මූල්‍ය ප්‍රතිපාදන හිඟකම.
- තිරසර සංවර්ධන අරමුණු, අරමුණු හා දර්ශක පිළිබඳ පුස්තකාල ක්ෂේත්‍රයට අදාල වෘත්තිකයන් හට නිසි අවබෝධයක් නොමැතිකම.
- දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රමාණවත් නොවීම.
- පුස්තකාල ආශ්‍රිත තාක්ෂණික සංවර්ධනය (තාක්ෂණික මෙවලම්, කාර්යමණ්ඩල පුහුණුව)අවම වීම.
- තාක්ෂණික උපකරණ භාවිතය පිළිබඳ අවබෝධය අඩු බව.
- නවීන තාක්ෂණික උපකරණ වල මිල අධික වීම.
- තාක්ෂණික මෙවලම් භාවිතය පිළිබඳ පුහුණු අවස්ථා සීමා වීම
- නවීන තාක්ෂණික මෙවලම් නඩත්තුවට විශාල පිරිවැයක් දැරීමට සිදු වීම.
- තිරසර සංවර්ධන අරමුණු පිළිබඳව වගකිවයුතු ආයතනවල (රාජ්‍ය/රාජ්‍ය නොවන සහ වෙනත්) ක්‍රියාකාරීත්වය මන්දගාමී වීම.
- පුස්තකාල කාර්යමණ්ඩල හිඟතාවය.
- තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වන කාලීන තොරතුරු පුස්තකාලය සතු නොවීම.
- තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දී පුස්තකාල මඟින් ලබා දිය යුතු දායකත්වය කෙබඳුද යන්න පිළිබඳව නිසි අවබෝධයක් නොමැතිබව.

# සිව්වන පරිච්ඡේදය

## 4.1 නිගමන

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් පුස්තකාල සහ පුස්තකාල වෘත්තිකයන් තුළ පවතින දැනුවත්භාවය පිළිබඳ අධ්‍යයනයේ දී ලංකාවේ බොහෝ පුස්තකාලවල ක්‍රියාකාරිත්වය සතුටුදායක තත්වයක නොමැතිබව සදහන් කළ යුතුය. පුස්තකාල වෘත්තිකයින් සතුව ද මෙම විෂය පිළිබඳ අවබෝධය අඩු ස්වභාවයක් දැකිය හැකි අතර එම තත්ත්වය නිසා සැලසුම් කළ වැඩසටහන් පවා තිරසර සංවර්ධන අරමුණු නිවැරැදිව හඳුනා ගැනීමකින් තොරව ක්‍රියාත්මක කර ඇති ස්වභාවයක් පෙන්නුම් කරයි. අධ්‍යයනය මඟින් ලද දත්ත විශ්ලේෂණය කිරීමෙන් ද අවබෝධ වන්නේ බහුතර පුස්තකාල ප්‍රමාණයක් මෙම අරමුණු 17 සම්බන්ධයෙන් මධ්‍යස්ථ මෙන්ම තරමක් දුරට දැනුවත්භාවයක් පවතී යන්නයි. තිරසර සංවර්ධන සංකල්පය හෝ 2030 න්‍යාය පත්‍රය පිළිබඳ ඇති දැනුම සාපේක්ෂව අඩු ප්‍රතිශතයක් දැනුවත් නොමැති ප්‍රමාණය ද සාපේක්ෂව සැලකිය යුතු අගයකි. එසේ වුවත් අරමුණු 17 අතරින් 4වන අරමුණ වන පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථා සැලසීම සම්බන්ධයෙන් පවතින දැනුවත්භාවය ඉහළ අගයක් ගැනීම සටුතුදායක තත්ත්වයකි. එය සමස්ථ ප්‍රතිචාර අතරින් 70%කට (හොඳින් දැනුවත්ව ඇති සහ මධ්‍යස්ථව දැනුවත්ව ඇති) ආසන්න ප්‍රතිශතයකි. තවද අරමුණු 5, 6, 7, 8, 9 සහ 16 සම්බන්ධයෙන් පුස්තකාල හා පුස්තකාල වෘත්තිකයන් තුළ සාධනීය දැනුවත්භාවයක් පවතින බව ඉහත වගු අංක 02 අනුව පැහැදිලි වේ. තිරසර සංවර්ධන අරමුණු 17 අතරින් අවම දැනුවත්භාවයක් 14 සහ 17 අරමුණු සම්බන්ධයෙන් පවතී. එහි අගය 22.4% කි.

තිරසර සංවර්ධන අරමුණු හා ඒ ආශ්‍රිත තොරතුරු පිළිබඳව පුස්තකාල හා පුස්තකාල වෘත්තිකයන් අතර පවතින දැනුවත්භාවය පිළිබඳව විමසා බැලීමේදී අනාවරණය වූයේ බහුතර පුස්තකාලයාධිපතිවරුන් හා පුස්තකාල වෘත්තිකයන් විසින් (66% කට ආසන්න ප්‍රමාණයක් විසින් එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ඉදිරිපත් කරන ලද තිරසර සංවර්ධන අරමුණු සහ ඒ සඳහා වන අරමුණු සහ ගෝලීය දර්ශක පිළිබඳ සැලකිය යුතු දැනුවත්භාවයක් (50%)ක් පවතින බවයි. තවද ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධනය හා ඒ ආශ්‍රිත කටයුතු සිදු කරනු ලබන ප්‍රමුඛතම ආයතනය වන තිරසර සංවර්ධන සභාව (Sustainable Development Council) සම්බන්ධයෙන් පුස්තකාල වෘත්තිකයන් තුළ ඉතා සීමිත දැනුවත්භාවයක් පවතින බව තහවුරු කර ගැනීමට හැකිවිය (දැනුවත්ව ඇති ප්‍රමාණය සමස්ත ප්‍රතිචාර අතරින් 4%කට ආසන්නය). තවද තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වන සම්මන්ත්‍රණය හා වැඩමුළු සඳහා පුස්තකාල වෘත්තිකයන් සම්බන්ධ වී ඇති ප්‍රමාණය ද අවම අගයක් ගන්නා අතර එය 24%කට ආසන්න අගයකි.

තිරසර සංවර්ධන අරමුණු පිළිබඳව තොරතුරු ලබාගත් මාධ්‍යයන් / මූලාශ්‍ර පිළිබඳව සලකා බලන විට ඉදිරියෙන්ම සිටින්නේ අන්තර්ජාලයයි. ඊට අමතරව පුවත්පත්, පොත්පත්, රූපවාහිනී සහ සමාජ මාධ්‍ය භාවිත කර තිබේ. මෙම පර්යේෂණය හරහා තිරසර සංවර්ධන අරමුණු සපුරාගැනීම වෙනුවෙන් වැඩසටහන් ක්‍රියාත්මක කළ පුස්තකාල පිළිබඳව තොරතුරු රැස්කල අතර එමගින් තහවුරු වන්නේ සිව්වන තිරසර සංවර්ධන අරමුණ ගුණාත්මක අධ්‍යාපනයක් සැපයීම් කාර්යයට වැඩි අවධානයක් යොමු කර ඇති බවයි. එම මාතෘකාවට අදාළ පුස්තකාල ද්‍රව්‍ය අත්පත් කරගනිමින් ලිවීම, කියවීම, තොරතුරු සාක්ෂරතාවය පිළිබඳ වැඩමුළු, සාකච්ඡා සංවිධානය කිරීම, භාෂණ කුසලතාවය වර්ධනය කර ගැනීමේ ක්‍රියාකාරකම්, වැඩසටහන් සංවිධානය කිරීම සහ කියවීමේ කඳවුරු සංවිධානය තුළින් දායක වී තිබේ. තිරසර සංවර්ධන ක්‍රියාවලියට පුස්තකාල විසින් ඍජුව දායකත්වය ලබාදෙමින් ඉතිරි තිරසර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම සඳහා විවිධ ක්‍රියාමාර්ග / ක්‍රියාකාරකම් සිදුකර තිබේ. තිරසර සංවර්ධන අරමුණු හා පුස්තකාල ද්‍රව්‍ය අත්පත් කර ගැනීම, ඒ හා සම්බන්ධ අදාළ පාර්ශවයන් දැනුවත් කිරීම, නිරෝගී ජීවිත සහතික කර සියල්ලන්ගේම සුභසාධනය ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ගනිමින් කියවීම, විනෝදාස්වාදය සහ විවේකීව සිටීම උදෙසා පුස්තකාලය සුදුසු ස්ථානයක් ලෙස පවත්වාගෙන යාම හා ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ විවිධ දේශන / වැඩමුළු සංවිධානය කිරීම ද සිදුකොට ඇත. තවද ස්ත්‍රී / පුරුෂ සමානාත්මතාවය ළඟා කරගැනීම වෙනුවෙන් වන පුහුණු වැඩසටහන් හා ඔවුන් සවිබල ගැන්වීම පිළිබඳ වැඩමුළු, දේශන හා සාකච්ඡා පැවැත්වීම ද සිදු කරනු ලබයි.

ස්වභාවික ආලෝකය, වාතාශ්‍රය ලැබෙන පරිදි පුස්තකාල ගොඩනැගිල්ල සකස් කර ගැනීම සහ බලශක්තිය කාර්යක්ෂමව භාවිතයට ගැනීම, සහතික කරන ලද උපාංග / උපකරණ භාවිතය තුළින් තිරසර බලශක්ති සැපයුම සහතික කිරීම වෙනුවෙන් පුස්තකාල කටයුතු කර තිබේ. තොරතුරු සහ සන්නිවේදන, තාක්ෂණික කටයුතු සඳහා පාඨකයින්ට පහසුකම් සැලසීම, නවතම රැකියා අවස්ථා පිළිබඳ තොරතුරු ලබාදීම ආදී කාර්යයන් හරහා ආර්ථික වර්ධනය සහ රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීම තුළින් තිරසර බව ඇති කිරීමට පුස්තකාල කටයුතු කර ඇත.

11වන අරමුණ ළඟා කරගැනීම සඳහා විශේෂයෙන්ම පුස්තකාල මඟින් අනාගත පරම්පරාව වෙනුවෙන් සංවර්ධිත උරුමයන් සංරක්ෂණය හා ප්‍රලේඛනය සහතික කරන ස්ථානයක් ලෙසත්, තිරසර පරිභෝජනය සහතික කිරීම වෙනුවෙන් පොත් පරිත්‍යාග කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, නාගරික කෘෂිකර්මාන්තය දිරිමත් කිරීම පිළිබඳ වැඩමුළු හා දේශන පැවැත්වීම සිදු කරනු ලබන ස්ථානයක් ලෙස ද කටයුතු කර ඇත.

පුස්තකාල භූමිය තුළ විවිධ වගා කටයුතු සිදු කිරීම සහ ජෛව විවිධත්වය, තිරසර වනාන්තර කළමනාකරණය හා පරිසර පද්ධතියේ තිරසර භාවිතය වෙනුවෙන් වන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු කර තිබේ. විශේෂයෙන්ම මූල්‍ය, තාක්ෂණය, වෙළඳාම සහ පද්ධතිමය ක්ෂේත්‍ර ඔස්සේ දේශීය සහ විදේශීය වශයෙන් ආයතන සමඟ සම්බන්ධ වී කටයුතු කිරීම තුළින් පුස්තකාල මඟින් විවිධ ආයතන සමඟ සම්බන්ධව තිරසර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම වෙනුවෙන් රාජ්‍ය ආයතන සහ රාජ්‍ය නොවන ආයතන සමඟ සම්බන්ධව කටයුතු කර තිබේ.

තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාවට නැංවීමේදී පුස්තකාල විසින් විවිධ අභියෝග හා ගැටලුවලට මුහුණ දෙනු ලබයි. අදාළ ආයතන මඟින් ලබාදෙනු ලබන මූල්‍යමය දායකත්වය අවම වීම, තිරසර සංවර්ධන අරමුණු හා ඒ සම්බන්ධ තොරතුරු පිළිබඳව පුස්තකාල වෘත්තිකයන්ගේ දැනුවත්භාවය අවම වීම හා අවශ්‍ය දැනුවත් කිරීම් ප්‍රමාණවත් නොවීම සහ පුස්තකාල ආශ්‍රිතව තාක්ෂණික සංවර්ධනය අවම වීම යන ගැටලු පුස්තකාල වෘත්තිකයන් මුහුණ දෙනු ලබන බව හඳුනාගත හැකිය.

### 4.2 නිර්දේශ

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් මෙම අරමුණු අනුව වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නිශ්චිත කාල රාමුවක් දක්වා තිබුණත් තවමත් බොහෝ ආයතන සැලකිය යුතු කාර්යභාර්‍යයක් ඉටු කර නොමැති පසුබිමක පහත නිර්දේශ ක්‍රියාත්මක කිරීම සුදුසුය.

- තිරසර සංවර්ධන අරමුණු අත්පත් කරගැනීම වෙනුවෙන් පුස්තකාල වෘත්තිකයන් විසින් අවශ්‍ය දැනුම, අවබෝධය ලබා ගැනීම සිදු කළ යුතුය.

- ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය සහ ශ්‍රී ලංකා පුස්තකාල සංගමය සහයෝගයෙන් කටයුතු කර,තිරසර සංවර්ධන සභාවේ දායකත්වයෙන් අරමුණු හා ඒවා ළඟා කරගැනීම වෙනුවෙන් ඒකාබද්ධ වැඩසටහනක් සකස් කර එය ක්‍රියාත්මක වන ආකාරය අධීක්ෂණය කළ යුතුය.

- තිරසර සංවර්ධන අරමුණු මුල් කරගනිමින් ජාතික වශයෙන් ක්‍රියාත්මකවන වැඩසටහන් සමඟ පුස්තකාල පද්ධතිය ද ඒකාබද්ධ විය යුතු අතර එහි ද ජාතික පුස්තකාලය ප්‍රමුඛ කාර්යභාර්‍යයක් ඉටුකළ යුතුය.

- තිරසර සංවර්ධනය ළඟා කරගැනීම වෙනුවෙන් පුස්තකාල පද්ධතිය රාජ්‍ය, පෞද්ගලික අංශය සහ රාජ්‍ය නොවන ආයතන (දේශීය, විදේශීය) සමඟ සහයෝගිතා වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය.

- පුස්තකාල ක්ෂේත්‍රයට අයත් වෘත්තිකයන් තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වන සම්මන්ත්‍රණයට සහ වැඩමුළුවලට සහභාගී කර ගත යුතුය.

- තිරසර සංවර්ධන අරමුණුවල පවතින වැදගත්කම පිළිබඳව පාඨකයින්ට අවබෝධයක් ලබාදීමට පුස්තකාල වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය.

- අරමුණු හා ඒ ආශ්‍රිත තොරතුරු අත්පත් කර, බෙදාහැරීම වෙනුවෙන් තිරසර සංවර්ධන අරමුණු පිළිබඳව කවුළුවක් (SDG Corner) පුස්තකාලය තුල ස්ථාපිත කළ යුතුය.

- ප්‍රමාණවත් පරිදි මූල්‍යමය සහයෝගීත්වය ලබාදීම හරහා මහජන පුස්තකාල ආශ්‍රිතව තොරතුරු හා සේවා විධිමත්ව පවත්වාගෙන යාමට අවශ්‍ය සහයෝගය පළාත් පාලන ආයතන, පළාත් පාලනයට අදාළ අමාත්‍යාංශ/දෙපාර්තුමේන්තු මඟින් ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

- තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමට සහ ළඟා කරගැනීම වෙනුවෙන් පුස්තකාල හා තොරතුරු විද්‍යා ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ සිදුකළ යුතුය.

- තිරසර සංවර්ධන අරමුණු අනුව ක්‍රියාත්මක වැඩසටහන්වල ප්‍රගතිය විමසා බැලීමට සහ හඳුන්වා දී ඇති දර්ශක මැන බැලීමට දත්ත රැස් කිරීමට සෑම පුස්තකාලයක් ම නිලධාරියෙකු පත් කළ යුතුය.

# ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


IFLA.(2015). Libraries and implementation of the UN 2030 Agenda. [The Hague]: IFLA. [Accessed 12 May 2017]. Available at: https://www.ifla.org/files/assets/hq/topics/libraries-development/documents/libraries-un-2030-agenda-toolkit.pdf

IFLA. (2016). The Role of Public Libraries in the Attainment of Vision 2016. Retrieved from http://library.ifla.org/258/1/201- radijeng-en.pd

IFLA. (2018). Access and opportunity for all: How libraries contribute to the United Nations 2030 Agenda. Available online at: http://www.ifla.org/files/assets/hq/topics/libraries-development/documents/access-and-opportunity-for-all.pdf

Osborn, D., Cutter, A. & Ullah, F. (2015). Universal sustainable development goals: understanding the transformational challenge for developed countries: report of study by stakeholder forum. Available online at: https://sustainabledevelopment.un.org/content/documents/1684SF_SDG_Universality _Report_-_May_2015.pdf

UNESCO. (2017). Education for sustainable development goals: Learning objectives, Accessed June 15 2019; Retrieved from http://www.un.org/sustainabledevelopment/sustainable-developmentgoals

United Nations.(2015). *Transforming our world: the 2030 Agenda for Sustainable Development*. Resolution adopted by the General Assembly on 25 September 2015. [Accessed 13 May 2017]. Available at: http://www.un.org/ga/search/view_doc.asp?symbol=A/RES/70/1&Lang=E.

Vlimmeren, Tan van (2020).*Sustainable development goals and libraries: first European report*. EBLIDA Secretariat, Netherlands. Retrieved September 10, 2020, from http://www.eblida.org/Documents/EBLIDA-Report-SDGs-and-their-implementation-in-European-libraries.pdf

Sri Lanka Voluntary National Review 2018 (2018).[Online]. Available at: https://sustainabledevelopment.un.org/content/documents/19677FINAL_SriLankaVNR_Report_30Jun2018.pdfAccessed on 30 June 2018.

ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව. (2015). ජන හා නිවාස සංගණනය 2012, ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, කොළඹ.

NATIONAL LIBRARY
N L S L OF SRI LANKA

**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය**
අංක 14, නිදහස් මාවත, කොළඹ 07.
www.natlib.lk

ISBN 978-624-5747-09-2
9 786245 747092